Hilton
COLOMBO



# 2024 වාර්ෂික වාර්තාව

හෝටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

# අන්තර්ගතය


| | |
|---|---|
| අප ගැන | 01 |
| මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු | 03 |
| මෙහෙයුම් ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු | 04 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 07 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු | 10 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 14 |
| ආයතනික පාලනය | 15 |
| අවදානම් කළමනාකරණය | 19 |
| කළමනාකාරීත්ව සාකච්ඡාව සහ විශ්ලේෂණය | 23 |
| අධ්‍යක්ෂවරුන්ගේ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව | 39 |
| විගණන කමිටු වාර්තාව | 42 |
| **මූල්‍ය ප්‍රකාශන** | |
| ස්වාධීන විගණක වාර්තාව | 46 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 50 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 51 |
| ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 52 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 53 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 54 |
| දස අවුරුදු මූල්‍ය සාරාංශය සහ ප්‍රධාන දර්ශක | 83 |
| වාර්ෂික මහා සභා රැස්වීමේ දැන්වීම | 85 |
| පවරා දීමේ පත්‍රිකාව | 87 |
| ආයතනික තොරතුරු | පිටුපස ඇතුලත කවරය |



# අප ගැන

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) සමාගම 1983 දී දේපළ සංවර්ධන සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර කොළඹ හිල්ටන් හෝටලයේ හිමිකාරීත්වය දැරීම හා මෙහෙයුම් කටයුතු සඳහා පහසුකම් සැලසීම මූලික අරමුණ විය. ශ්‍රී ලංකාවේ අගනුවර වඩා කීර්තිමත් හා වාණිජමය වටිනාකමක් සහිත ප්‍රදේශයක් වන කොළඹ 01 හි එච්චිලොන් චතුරශ්‍රයේ අක්කර 6.2ක භූමි ප්‍රමාණයක මෙම හෝටලය උපායමාර්ගිකව පිහිටුවා ඇත.

ප්‍රථමයෙන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් ලෙස කටයුතු කළ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම පසුව 2011 වසරේදී සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් ලෙස උපායමාර්ගිකව වෙනස් වූ අතර දැනට එහි කොටස් අයිතිය 100%ක් මුදල් අමාත්‍යාංශ ලේකම් සතුව පවතී.

## අපගේ දැක්ම

*"තිරසාර විශිෂ්ටත්වය සමඟ සත්කාරක සේවාව තුළ ප්‍රමුඛස්ථානයේ රැඳී සිටීම"*

## අපගේ මෙහෙවර

*"සත්කාරක සේවා ක්ෂේත්‍රයේ නවමු සහ විශිෂ්ට සේවාවන් ලබාදෙමින්, තිරසර වර්ධනයක් අත්පත් කරගනිමින්, කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ වර්ධනය සහ සමාජය වෙත ධනාත්මක ප්‍රතිලාභ අත්පත් කර දෙමින් ශ්‍රී ලංකාව ප්‍රමුඛතම ගෝලීය සංචාරක ගමනාන්තයක් බවට පත් කරමින් සියළුම ඇල්මැති පාර්ශවයන්ට සුවිශේෂී වටිනාකමක් ලබාදීම."*









## කොළඹ හිල්ටන් හෝටලයේ කළමනාකරණය සඳහා උපායමාර්ගික හවුල්කාරිත්වය

1984 දී අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම, කොළඹ හිල්ටන් හෝටලයේ කළමනාකරණ හා මෙහෙයුම් වගකීම් හිල්ටන් අන්තර්ජාතික කළමනාකරණ සමාගම (හිල්ටන් වර්ල්ඩ්වයිඩ්) වෙත පවරා ඇත. හිල්ටන් වර්ල්ඩ්වයිඩ් යනු රටවල් 139ක් පුරා දේපළ 8600කට අධික ප්‍රමාණයක් සහිත ගෝලීය සත්කාරක සේවා කර්මාන්තයේ ප්‍රමුඛතම සන්නාමයක් වන අතර, මෙම හවුල්කාරීත්වය විසින් ප්‍රමුඛතම ගෝලීය සන්නාම වටිනාකමත්, මෙහෙයුම් විශේෂඥතාවයත්, හොඳම ජාත්‍යන්තර භාවිතයන්ගේ ප්‍රවීනතාවත් අත්පත් කර දේ.

හෝටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ්, සිය උපායමාර්ගික හවුල්කාරිත්වය තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ලෝක ප්‍රකට ආගන්තුක සත්කාර සන්නාමයක් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් පවත්වා ගැනීමෙන්, සමාගම උසස් තත්ත්වයේ අමුත්තන්ගේ අත්දැකීමක් සහතික කරන අතර, දිගුකාලීන වත්කම් වටිනාකම් සහ පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරයි. HDL ආයතනය ආදායම් උත්පාදනයෙන් හා රැකියා උත්පාදනයෙන් පමණක් නොව, ජාත්‍යන්තර සංචාර, ව්‍යාපාරික කටයුතු සහ උත්සව සඳහා ප්‍රධාන ගමනාන්තයක් ලෙස කොළඹ ස්ථානගත කිරීමෙන් ජාතික ආර්ථිකයට දායක වේ.

## දේපළවල විශේෂතා - කොළඹ හිල්ටන් හෝටලය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සුඛෝපභෝගී ආගන්තුක සත්කාර දේපළක් ලෙස කොළඹ හිල්ටන් හෝටලය, කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කයේ හදවතෙහි පිහිටා ඇත. මෙම හෝටලය ජාත්‍යන්තර හා දේශීය ව්‍යාපාරික සංචාරකයින්, විවේක සංචාරකයින් සහ උත්සව නියෝජිතයින් ඇතුළු පුළුල් පාරිභෝගික පිරිසකට සේවා සපයයි. සමකාලීන සැලසුම් සහ උසස් සුවපහසුව හා ක්‍රියාකාරීත්වය සමඟ ඒකාබද්ධ කරමින්, සුඛෝපභෝගී කාමර ඇතුළුව අලංකාර ලෙස සකස් කරන ලද කාමර 368කින් එය සමන්විතයි.

විවිධත්වයකින් යුතු ආහාර සහ විනෝදාස්වාද අත්දැකීම් ආපනශාලා හතක් හරහා ලබාදෙන අතර විවිධ ආහාර රටා සහ අවස්ථා ලබා දෙමින් අමුත්තන්ට පුළුල් පරාසයකින් යුත් තෝරාගැනීම් කිරීමට අවස්ථාව සලසා දෙයි. එනම් සාමාන්‍ය සිට උසස් ආහාර, ගෘහස්ථ සිට එළිමහන් පරිසරයන්, සහ සුවපහසු විවේකාගාරවල සිට ප්‍රබෝධමත් රාත්‍රී ජීවිත අත්දැකීම් දක්වා මේවා විහිදේ.


හිල්ටන් කොළඹ, සිය නවාතැන් පහසුකම් සහ සූපවේදී විශිෂ්ඨත්වයන් වලට අමතරව, ශක්තිමත් උත්සව සහ ව්‍යාපාරික යටිතල පහසුකම් සපයයි. ප්‍රධාන පහසුකම් අතර යාබද පූර්ව - ක්‍රියාකාරී ප්‍රදේශයක් සහිත විශාල උත්සව ශාලාවක් සහ විවිධ අවශ්‍යතාවලට අනුව සකස් කළ හැකි බහුකාර්ය උත්සව අවකාශයන් ගණනාවක් ඇතුළත් වේ. ව්‍යාපාරික සංචාරකයින් සඳහා සුපිරි විධායක පහසුකම් වලට ප්‍රවේශය මෙන්ම, දේපළ තුළ පිහිටා ඇති සම්පූර්ණ පහසුකම් වලින් සමන්විත රැස්වීම් කාමර ද ලබා දීමෙන් සහාය ලැබේ.

හෝටලයේ ප්‍රධාන සේවාවන්ට අමතරව, යාබද අක්කර 1.8 ක භූමි ප්‍රමාණයක පිහිටා ඇති සෞඛ්‍ය හා ජීවන රටා සංකීර්ණයකින් එය තවදුරටත් වර්ධනය වී ඇත. මෙම පහසුකම හෝටල් අමුත්තන්ට සහ සමාජ ශාලා සාමාජිකයින්ට, නවීනතම ව්‍යායාම මධ්‍යස්ථානයක්, එළිමහන් පිහිනුම් තටාකයක්, සහ සම්පූර්ණ සම්බාහන මධ්‍යස්ථානයක් හා සුවතා සේවා ඇතුළු විවිධ විනෝදාත්මක පහසුකම් සපයයි. මෙම විශේෂාංග මගින් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සම්පූර්ණ හා ඒකාබද්ධ සුඛෝපභෝගී ආගන්තුක සත්කාර අත්දැකීමක් ලබා දීම සඳහා කොළඹ හිල්ටන් හෝටලය සතු කීර්තිය තහවුරු කරයි.


# මූල්‍ය දළ විශ්ලේෂණය

| | 2024 | 2023 |
|---|---|---|
| කාමර ආදායම රු.'000 | **1,848,222** | 1,137,293 |
| ආහාර සහ පාන ආදායම රු.'000 | **3,342,408** | 3,034,962 |
| වෙනත් ආදායම් රු.'000 | **56,153** | 55,845 |
| සමාජ ආරක්ෂණ බද්ද රු.'000 | **146,306** | 118,651 |
| මුළු ආදායම රු.'000 | **5,393,089** | 4,346,751 |
| | | |
| දළ ලාභය රු.'000 | **2,684,076** | 1,901,133 |
| දළ ලාභ ආන්තිකය රු.'000 | **50%** | 44% |
| දළ මෙහෙයුම් ලාභය රු.'000 | **872,083** | 163,335 |
| දළ මෙහෙයුම් ලාභ ප්‍රතිශතය රු.'000 | **16%** | 4% |
| බදු පෙර ලාභය/(අලාභය) රු.'000 | **(268,347)** | (784,367) |
| බදු පසු ලාභය රු.'000 | **(339,837)** | (688,713) |
| කාලපරිච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම රු.'000 | **(351,638)** | (15,874) |
| කොටසක ඉපැයීම්/(අලාභය) රු.'000 | **(0.17)** | (0.01) |
| සාමාන්‍ය කාමර ගාස්තුව රු.'000 | **31,691** | 31,496 |
| කාමර පිරවීමේ ප්‍රතිශතය රු.'000 | **51%** | 33.00% |
| | | |
| දිගුකාලීන පොලී දරන ණය ගැනීම් රු.'000 | **3,354,136** | 3,067,766 |
| කෙටිකාලීන ණය රු.'000 | **2,255,220** | 1,843,522 |
| මුළු කොටස් ප්‍රාග්ධනය රු.'000 | **11,915,257** | 12,266,894 |
| ණය/කොටස් ප්‍රාග්ධන ප්‍රතිශතය රු.'000 | **47.08%** | 40.04% |
| මුළු වත්කම් රු.'000 | **21,426,589** | 20,566,956 |
| ණය/මුළු වත්කම් ප්‍රතිශතය රු.'000 | **26.18%** | 23.88% |
| ජංගම වත්කම් රු.'000 | **872,837** | 1,092,826 |
| ජංගම වගකීම් රු.'000 | **4,462,725** | 3,609,386 |
| ජංගම අනුපාතය රු.'000 | **0.20** | 0.30 |
| ක්ෂණික අනුපාතය රු.'000 | **0.17** | 0.28 |


වර්ෂ 5 ක් සඳහා වන ආදායමෙහි ප්‍රවණතාවයන්




පොලී සහ බදු අඩු කිරීමට පෙර ඉපැයුම්




දේපළ පිරියත හා උපකරණවල ආයෝජනය



# මෙහෙයුම් ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු

### අපගේ පහසුකම්

හිල්ටන් කොළඹ හෝටලය, කොළඹ නගරයේ ප්‍රධාන ස්ථානයක පිහිටි අක්කර 4.5ක ඉඩමක විහිදී ඇත.

**අමුත්තන්ගේ කාමර**
**368**

**ආහාර සහ පාන අලෙවිසැල්**
**07**

**සමුළු සහ උත්සව අවකාශ**
**17**

**ක්‍රීඩා මධ්‍යස්ථානය සහ අනෙකුත් විනෝදාත්මක පහසුකම්**
අක්කර **1.87**ක ඉඩමක

### අපගේ කණ්ඩායම

**සේවක සංඛ්‍යාව**
**596** (2023: 615)

**පුහුණු සහ සංවර්ධන පැය ගණන**
වාර්ෂික පුහුණු පැය **65,098** (2023: 24,752)

**සේවකයින්ට ගෙවීම් (සේවා ගාස්තු ඇතුළුව)**
රු. මිලියන **1,262** (2023: රු. මිලියන 1,026)

### සෞඛ්‍ය සහ ආරක්ෂක සහතික

**සෞඛ්‍ය සහ ආරක්ෂක සහතික**
- ආහාර සහ ආරක්ෂක කළමනාකරණ පද්ධති
- HACCP

### අපගේ පහසුකම්

- සුඛෝපභෝගී ව්‍යාපාරික හෝටලය
- සුඛෝපභෝගී සමුළු සහ උත්සව හෝටලය
- හොඳම වාස්තු විද්‍යාත්මක සැලසුම
- ආසියාවේ හොඳම බහුජාතික සමාගම් සේවා ස්ථාන 2024 අතර අංක 2
- ශ්‍රී ලංකාවේ හොඳම සේවා ස්ථාන 50 අතර විශාල කාණ්ඩයේ අංක 3
- තිරසාරත්ව සම්මාන - මහා පරිමාණ ව්‍යවසාය
- සාමාන්‍යාධිකාරීවරයා විවිධත්වයේ හොඳම නායකයින් 10 දෙනා අතරට (Top 10 Champions of Diversity Awards)







Luxury Business Hotel
SOUTH WEST ASIA

Best Architectural Design
SOUTH WEST ASIA

Luxury Conference & Event Hotel
SRI LANKA


AHK Delegation der Deutschen Wirtschaft in Sri Lanka
Delegation of German Industry and Commerce in Sri Lanka

FRIEDRICH NAUMANN FOUNDATION For Freedom
Sri Lanka

SUSTAINABILITY AWARDS 2024
Identifying Role Models to Drive Sustainable Change in the Tourism Sector

This Certificate is Presented to


Hilton Colombo

For the Outstanding Achievement in Category:
Hotel and Accommodation Service Provider - Large Enterprise

Ms. Marie Antonia von Schönburg
Chief Delegate
Delegation of German Industry and Commerce in Sri Lanka (AHK Sri Lanka)

Mr. Wolfgang Heinze
Head of Sri Lanka Office
Friedrich Naumann Foundation for Freedom



**Hilton Colombo Hotel** ★★★★★

Fabulous 8.6
713 reviews

Fort, Colombo · Show on map · 100 m from centre

Sustainability certification

Overlooking the Indian Ocean and Beira Lake, Hilton Colombo Hotel offers direct access to Colombo's World Trade Centre. It features an outdoor pool, 24-hour business centre and 10 dining outlets.



HOTEL

Hilton Colombo

4.2 ●●●●○ (3,191 reviews)

Colombo, Sri Lanka

3,191 reviews and opinions

"...We stayed at the Hilton Colombo recently and had a really great experience...


# මෙහෙයුම් ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු

## TRIPADVISOR – HILTON COLOMBO OUTLETS

Tripadvisor

### Graze Kitchen

2, Sir Chittampalam A Gardiner Mawatha,
Colombo 200 Sri Lanka




Ratings and reviews

4.8 ●●●●● 1,281 reviews

Tripadvisor

### L.A.B

Hilton Colombo 2 Sir Chittampalam a Gardiner MW,
Colombo 00200 Sri Lanka



Ratings and reviews

4.9 ●●●●● 297 reviews

Tripadvisor

### Emperor's Wok

2, Sir Chittampalam A Gardiner Mawatha Mawatha,
Colombo, Colombo 00200 Sri Lanka




Ratings and reviews

4.8 ●●●●● 174 reviews

Tripadvisor

### Stella Karaoke Lounge and Bar

2 Sir Chittampalam A Gardiner MW,
Colombo 00200 Sri Lanka




Ratings and reviews

4.7 ●●●●◐ 68 reviews

Tripadvisor

### Cafe Kai

2 Sir Chittampalam A Gardiner Mawatha The Hilton
Colombo, Colombo 00200 Sri Lanka



Ratings and reviews

4.7 ●●●●◐ 48 reviews

Tripadvisor

### Sunsetblu

2 Sir Chittampalam A Gardiner Mawatha Colombo 2,
Colombo 00200 Sri Lanka



Ratings and reviews

4.9 ●●●●● 436 reviews

# සභාපතිතුමාගේ සමාලෝචනය



> "හිල්ටන් කොළඹ හෝටලයේ අලුතින් වැඩිදියුණු කරන ලද කාමර අමුත්තන් වෙත පිළිගැන්වීමේ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කළ බව ප්‍රකාශ කිරීමට මම සතුටු වෙමි, එය හෝටලයේ ඉතිහාසයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම වැඩිදියුණු කිරීමත් සමඟ දශකයකට පසු හෝටලයේ කාමර 368 ම සම්පූර්ණයෙන් භාවිතයට ගැනීමට අපට හැකිවිය."

**ගරු කොටස් හිමියනි,**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාවේ සහ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කරුණු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටු වෙමි. සමාගම සිය මූලික වටිනාකම් සඳහා වූ නොසැලෙන කැපවීම හේතුවෙන් ශක්තිමත් ලෙස යලි යථා තත්වයට පත්වීමක් පෙන්නුම් කර ඇති බව වාර්තා කිරීමට මම සතුටු වෙමි.

## ගෝලීය සංචාරක ව්‍යාපාරය

2024 දී ගෝලීය සංචාරක ව්‍යාපාරය කැපී පෙනෙන ප්‍රතිසාධනයක් අත්විඳ ඇති අතර, ජාත්‍යන්තර සංචාරකයන්ගේ පැමිණීම් බිලියන 1.4 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත, එය වසංගතයට පෙර මට්ටම් වලින් 99% ක් පමණ වේ. මෙය 2023 ට වඩා 11% ක වැඩිවීමක් වන අතර, අමතර වශයෙන් මිලියන 140 ක පැමිණීම් වාර්තා වී ඇත. මෙම ප්‍රතිසාධනයට හේතු වී ඇත්තේ වසංගතයෙන් පසු ඇති වූ ප්‍රබල ඉල්ලුම, ප්‍රධාන වෙළඳපලවල ශක්තිමත් ක්‍රියාකාරිත්වය සහ ආසියාවේ සහ පැසිෆික් කලාපයේ ගමනාන්තයන්හි අඛණ්ඩ ප්‍රතිසාධනයයි.

2024 දී ගෝලීය සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු කලාපීය විචලනයන් දක්නට ලැබුණි. ගෝලීය සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිසාධනය සඳහා මැද පෙරදිග සංචාරක ව්‍යාපාරය නායකත්වය දුන් අතර, එය 2019 හා සසඳන විට පැමිණීම්වල 32% ක කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මීට අමතරව සංචාරකයින් මිලියන 95 දක්වා ළඟා වූ අතර, පෙර වසරට සාපේක්ෂව 1% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. අප්‍රිකාව ද ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ අතර, පැමිණීම් මිලියන 74 ක් වාර්තා කළේය, එය 2019 මට්ටම්වලට වඩා 7% ක වැඩිවීමක් සහ 2023 සිට 12% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ලෝකයේ විශාලතම සංචාරක ගමනාන්තය වන යුරෝපය, පැමිණීම් මිලියන 747 ක් වාර්තා කළ අතර, එය 2019 ට වඩා 1% ක වැඩිවීමක් සහ 2023 ට සාපේක්ෂව 5% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය බොහෝ

# සභාපතිතුමාගේ සමාලෝචනය

දුරට කලාපය තුළ ඇති ප්‍රබල ඉල්ලුම හේතුවෙන් හට ගන්නට ඇත. කෙසේ වෙතත්, යුක්රේනයේ පවතින ගැටුම් හේතුවෙන් මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ සංචාරක ව්‍යාපාරයට අභියෝගයක් පවතී. ඇමරිකානු කලාපය පැමිණීම් මිලියන 213 ක් ලබා ගත් අතර, වසංගතයට පෙර මට්ටම් වලින් 97% ක් කරා ළඟා වූ අතර, කැරිබියන් සහ මධ්‍යම ඇමරිකාව 2019 සංඛ්‍යා අභිබවා ගොස්, පෙර වසරට වඩා 7% කින් වර්ධනය විය. අවසාන වශයෙන්, ආසියාවේ සහ පැසිෆික් කලාපයේ පැමිණීම් මිලියන 316 ක් දක්නට ලැබුණි. එය වසංගතයට පෙර මට්ටම් වලින් 87% ක් දක්වා වාර්තා වූ අතර 2023 සිට 33% ක වැඩිවීමක් අත්විඳින ලදී. එය කලාපයේ ප්‍රබල ප්‍රතිසාධනයක් පෙන්නුම් කරයි.

2024 දී ජාත්‍යන්තර සංචාරක ආදායම් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.6 දක්වා ළඟා වූ අතර එය 2023 සිට 3% ක වැඩිවීමක් සහ 2019 සිට 4% ක වැඩිවීමක් සැබෑ වශයෙන් පෙන්නුම් කරයි. අතිරේකව, මගී ප්‍රවාහනය ඇතුළු සංචාරක අපනයන, වාර්තාගත ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.9 ක් කරා ළඟා වූ අතර, එය වසංගතයට පෙර මට්ටම්වලට වඩා 3% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2025 වර්ෂය දෙස බලන විට, ආසියාවේ සහ පැසිෆික් කලාපයේ අඛණ්ඩ ප්‍රතිසාධනයක් සහ අනෙකුත් කලාප හරහා ස්ථාවර වර්ධනයක් සමඟින් ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 3% සිට 5% දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ ප්‍රවාහන වියදම්, අස්ථිර තෙල් මිල ගණන් සහ භූ දේශපාලනික අවදානම් වැනි අභියෝග තිබියදීත්, අපේක්ෂාවන් ධනාත්මකව පවතී. තිරසාරත්වය තහවුරු කරමින් සහ එතරම් නොදන්නා ගමනාන්ත සොයා ගැනීම කෙරෙහි අවධාරණය යොමු කරමින් 2025 වසර සඳහා සංචාරක විශේෂඥයින් ආසන්න වශයෙන් 64% ක වර්ධනයක් පුරෝකථනය කරයි.

කෙසේ වෙතත්, කර්මාන්තය ගැටුම්, අධික කාලගුණික සිදුවීම් සහ කාර්ය මණ්ඩල හිඟය වැනි අඛණ්ඩ ආර්ථික හා භූ දේශපාලනික අවිනිශ්චිතතාවන් පිළිබඳව අවධානයෙන් සිටිය යුතුය. දිගුකාලීන සංවර්ධනය සහතික කිරීම සඳහා වර්ධනය තිරසාරත්වය සමඟ සමතුලිත කිරීම තීරණාත්මක වනු ඇත.

## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2024 දී ප්‍රබල ප්‍රතිසාධනයක් පෙන්නුම් කළ අතර, එම වසර ධනාත්මකව අවසන් කළේය. දෙසැම්බර් මාසයේදී පමණක් විදෙස් සංචාරකයින් 248,592 ක් පිළිගත් අතර, එය නොවැම්බර් මාසයට වඩා 35% ක වැඩිවීමක් සහ 2023 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 18.18% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2024 වසර අවසන් වන විට, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර පැමිණීම් 2,053,465 ක් වාර්තා කර තිබුණි. එය ඵලදායී සංචාරක උපාය මාර්ග සහ ඉලක්කගත අලෙවිකරණ ප්‍රයත්න හේතුවෙන් ස්ථාවර වර්ධනයක් සහ ප්‍රතිසාධනයක් පෙන්නුම් කරයි. සංචාරකයින් මිලියන 2 ක සන්ධිස්ථානය 2018 න් පසු වාර්තා වූ ඉහළම අගය වන කැපී පෙනෙන ජයග්‍රහණයක් විය.

නව වීසා පද්ධතියක් වටා ඇති ගැටළු, දේශපාලන අවිනිශ්චිතතා, සංචාරක උපදෙස් හේතුවෙන් ඇති වූ ආරක්ෂක ගැටළු, යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රමාදයන් සහ ගෝලීය භූ දේශපාලනික ආතතීන් ඇතුළු අභියෝග කිහිපයක් මධ්‍යයේ මෙය අත්කර ගන්නා ලදී. තවද, වඩාත් ආකර්ශනීය වීසා ප්‍රතිපත්ති සහ වසංගතයෙන් පසු කාල පරිච්ඡේදයේ දැඩි අලෙවිකරණ ප්‍රයත්න සහිත අනෙකුත් ගමනාන්තවලින් ඇති වූ තරඟය ශ්‍රී ලංකාවේ සංචාරක වර්ධනයට බලපා ඇත. මෙම අභියෝග තිබියදීත්, මෙම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පැහැදිලිය. ප්‍රධාන වෙළඳපලවලින් පැමිණීම්වල වර්ධනය සහ මිලියන 2 කට අධික අමුත්තන් ඉක්මවා යාම කර්මාන්තයේ අඛණ්ඩ ප්‍රතිසාධනය පෙන්නුම් කරයි.

අනාගතය දෙස බලන විට, සංචාරක වෙළඳපල විවිධාංගීකරණය කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ අපගේ තරඟකාරී ස්ථාවරය ශක්තිමත් කිරීම මගින් අඛණ්ඩ වර්ධනයක් ලබා ගැනීම තීරණාත්මක වනු ඇත, එමගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2025 දී සහ ඉන් ඔබ්බට වැඩි සාර්ථකත්වයක් සඳහා ස්ථානගත කරනු ඇත.

ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාව වැනි ප්‍රධාන වෙළඳපල මෙම වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. යුරෝපය ප්‍රමුඛ කලාපය ලෙස මතුවූ අතර, මුළු පැමිණීම් වලින් 51.9% ක් හිමි කර ගත් අතර, ආසියාව සහ පැසිෆික් කලාපය 41% ක දායකත්වයක් ලබා දුන්නේය. ඇමරිකානු කලාපය (5.1%) සහ මැද පෙරදිග හා අප්‍රිකාව (2.1%) කුඩා කොටස් නියෝජනය කළද, මෙම කලාප අනාගත විවිධාංගීකරණය සඳහා වටිනා අවස්ථා සපයයි.

## මූල්‍ය කාර්ය සාධනය

2024 දී, සමාගම සැලකිය යුතු මූල්‍ය වර්ධනයක් අත්කර ගත් අතර, ශක්තිමත් කාර්ය සාධන ප්‍රතිසාධනයක් පෙන්නුම් කළේය. වසර සඳහා මුළු ආදායම රු. මිලියන 5,242 දක්වා ළඟා වූ අතර එය පෙර වසරේ රු. මිලියන 4,228 සිට කැපී පෙනෙන වැඩිවීමකි. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ කාමර ආදායමේ සැලකිය යුතු වර්ධනයක් මගින් වන අතර එය 2023 දී රු. මිලියන 1,137 සිට රු. මිලියන 1,848 දක්වා ඉහළ ගියේය. මෙම ධනාත්මක කාර්ය සාධනය බොහෝ දුරට අපගේ අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සාර්ථකව හා ප්‍රගතිශීලීව නිම කිරීම හේතු විය. නොවැම්බර් මස අවසානය වන විට මෙහෙයුම් කාමර සංඛ්‍යාව 368 දක්වා වැඩි වූ අතර, එය වැඩි ධාරිතාවක් සහ තරඟකාරිත්වයක් සඳහා අපව ස්ථානගත කළේය.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12 සඳහා, අපගේ මෙහෙයුම් ලාභය රු. මිලියන 869 දක්වා ළඟා වූ අතර, එය පෙර වසරේ මෙහෙයුම් ලාභය වූ රු. මිලියන 163 සිට සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය අපගේ ශක්තිමත් කාර්ය සාධනය මෙහෙයවූ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාවයන් සහ ඵලදායී මූල්‍ය කළමනාකරණය පිළිබිඹු කරයි.

2024 සඳහා බදු පෙර අලාභය රු. මිලියන 268 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය, මූල්‍ය පිරිවැය සහ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු, එය 2023 දී වාර්තා වූ රු. මිලියන 784 ක බදු පෙර පාඩුවෙන්

ප්‍රබල ප්‍රතිසාධනයක් පෙන්නුම් කරයි. බදු පෙර අලාභයේ මෙම සැලකිය යුතු අඩුවීම අපගේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට සහ ලාභදායිත්වය වැඩි දියුණු කිරීමට අපගේ උපායමාර්ගික ප්‍රයත්නවල ඵලදායිතාව පෙන්නුම් කරයි.

## කොළඹ හිල්ටන් හෝටලය නව යුගයකට පිවිසෙයි

හිල්ටන් කොළඹ හෝටලයේ අලුතින් වැඩිදියුණු කරන ලද කාමර අමුත්තන් වෙත පිළිගැන්වීමේ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කළ බව ප්‍රකාශ කිරීමට මම සතුටු වෙමි, එය හෝටලයේ ඉතිහාසයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම වැඩිදියුණු කිරීමත් සමඟ දශකයකට පසු හෝටලයේ කාමර 368 ම සම්පූර්ණයෙන් භාවිතයට ගැනීමට අපට හැකිවිය. එය වැඩිවන වෙළඳපල ඉල්ලුමට සහ නව ප්‍රවේශයන්ගෙන් මතුවන තරඟයට උපායමාර්ගික ප්‍රතිචාරයකි. මෙම ව්‍යාප්තිය අපගේ අමුත්තන්ගේ වැඩිවන අවශ්‍යතා සපුරාලීමට අපට හැකියාව ලබා දෙන අතරම, දේශීය ආගන්තුක සත්කාර අංශයේ අපගේ තරඟකාරීත්වය ශක්තිමත් කරයි.

පසුගිය වසර 5 සිට 7 දක්වා ක්‍රියාත්මක කරන ලද වත්කම් වැඩිදියුණු කිරීම්, දැනට පවතින මෙහෙයුම් පරිමාණය සමඟ එක්ව, කොළඹ හිල්ටන් හෝටලයට එහි වෙළඳ නාමයේ වටිනාකම උපයෝගී කර ගැනීමටත්, දේශීය හා ජාත්‍යන්තර අමුත්තන් සඳහා උසස්, ලෝක මට්ටමේ අත්දැකීම් ලබා දීමටත් හැකියාව ලබා දෙයි. මෙම වැඩිදියුණු කිරීම් අමුත්තන්ගේ අත්දැකීම් ඉහළ නංවනවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර කර්මාන්තයේ වෙළඳපල ප්‍රමුඛයෙකු ලෙස අපගේ ස්ථාවරය ශක්තිමත් කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

තවද, දේශීය වෙළඳපලට නව ප්‍රවේශයන්ගේ පැමිණීම, තරඟකාරිත්වය වැඩි කරන අතරම, සමස්තයක් ලෙස කර්මාන්තයට අවස්ථාවක් සපයයි. තරඟකාරිත්වයේ මෙම ගලා ඒම වෙළඳපල ඉල්ලුම උත්තේජනය කිරීමටත්, නවෝත්පාදනයන් දිරිමත් කිරීමටත්, ආගන්තුක සත්කාර අංශය පුරා සේවා ගුණාත්මක භාවයේ දියුණුවක් ඇති කිරීමටත් අපේක්ෂා කෙරේ. එය කලාපයේ සමස්ත ආගන්තුක සත්කාර ප්‍රමිතිය ඉහළ නංවනු ඇති අතර, මෙම ගතික පරිසරය තුළ කොළඹ හිල්ටන් හෝටලයට එහි තරඟකාරී වාසිය පවත්වා ගැනීමටත්, අමුත්තන්ගේ අපේක්ෂාවන් අඛණ්ඩව ඉක්මවා යාමටත් හැකි වනු ඇත.

## ඉදිරිය දෙස බැලීම

MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන) සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස ස්ථාපිත වීමට අවශ්‍ය තීරණාත්මක ගුණාංග ශ්‍රී ලංකාව සතු බවට මට ඉහළ විශ්වාසයක් ඇත. එහි උපායමාර්ගික භූගෝලීය පිහිටීම, ශක්තිමත් යටිතල පහසුකම් සහ ජාත්‍යන්තර ව්‍යාපාරික සංචාරකයින් සඳහා වැඩිවන ආකර්ෂණය සමඟින්, මෙම අංශයේ වර්ධනය වන ඉල්ලුම ප්‍රයෝජනයට ගැනීමට රට හොඳින් ස්ථානගත වී ඇත. මෙම සාධක සාමූහිකව ශ්‍රී ලංකාව ව්‍යාපාරික සිදුවීම් සඳහා කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කරයි, විශාල පරිමාණයේ රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා කදිම පරිසරයක් සපයයි.

කොළඹ වරාය නගරය තුළ අති නවීන සම්මන්ත්‍රණ පහසුකම් සංවර්ධනය කිරීමට සැලසුම් කිරීම ඇතුළු රජයේ ක්‍රියාකාරී මුලපිරීම්, ගෝලීය MICE භූ දර්ශනය තුළ රටේ තරඟකාරී වාසිය වැඩිදියුණු කිරීමට පැහැදිලි කැපවීමක් පෙන්නුම් කරයි. මෙම යටිතල පහසුකම් සංවර්ධනය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ව්‍යාපාරික ගමනාන්තයක් ලෙස ඇති ආකර්ෂණය තවදුරටත් ශක්තිමත් කරයි, ගෝලීය MICE වෙළඳපල අඛණ්ඩව ව්‍යාප්ත වන විට නව්‍ය හා ප්‍රවේශ විය හැකි ස්ථාන සොයන බහුජාතික සමාගම්, ජාත්‍යන්තර සංවිධාන සහ රැස්වීම් සංවිධායකයින්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලයි.

කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කයේ හදවතෙහි උපායමාර්ගිකව පිහිටා ඇති කොළඹ හිල්ටන් හෝටලය, කොළඹ වරාය නගරය සහ අධිවේගී මාර්ග වැනි ප්‍රධාන සන්ධිස්ථානවලට ආසන්නව පිහිටීමෙන් ප්‍රතිලාභ ලබයි. මෙම වාසිදායක පිහිටීම, අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද අමුත්තන්ගේ කාමර සහ අනෙකුත් පහසුකම් සමඟ එක්ව අපගේ තරඟකාරී ස්ථානගත කිරීම වැඩි දියුණු කරයි. ව්‍යාපාරික සංචාරකයින් සහ ප්‍රධාන වාණිජ, රාජ්‍ය සහ සංචාරක කේන්ද්‍රස්ථාන වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට අපේක්ෂා කරන රැස්වීම් සංවිධායකයින් සඳහා දේපළ කදිම තේරීමක් බවට පත් කරයි. ප්‍රවාහන ජාලයන්ට බාධාවකින් තොරව සම්බන්ධ වීම කොළඹ හිල්ටන් හෝටලයට විශාල පරිමාණයේ සම්මන්ත්‍රණ සහ ආයතනික රැස්වීම් කාර්යක්ෂමව හා පහසුවෙන් හැසිරවීමට ඇති හැකියාවට තවදුරටත් සහාය වේ.

## අගය කිරීම

පසුගිය වසර පිළිබිඹු කරන විට, මගේ අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ නොසැලෙන මග පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මගේ ගැඹුරු කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අපගේ වටිනා කොටස් හිමියනි, අපගේ දැක්ම කෙරෙහි ඔබගේ විශ්වාසය දිගටම අපව ඉහළ සාර්ථකත්වයක් කරා ගෙන යයි.

මගේ පූර්වගාමීන්ගේ සහ ඉවත්ව යන අධ්‍යක්ෂ මණ්ඩලයේ වටිනා දායකත්වය මෙන්ම හිල්ටන් කොළඹ හෝටලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායමේ සහ කැපවූ කාර්ය මණ්ඩලයේ විශිෂ්ටත්වය සඳහා වූ නොසැලෙන කැපවීම ද මම පිළිගනිමි. එය වසරේ අභියෝග ජය ගැනීමට සහ මෙහෙයුම් කාර්ය සාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට තීරණාත්මක විය.

හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් කෝපරේෂන් හි අත්‍යවශ්‍ය සහයෝගය මම පිළිගනිමි. වැඩිදියුණු කළ මෙහෙයුම් තත්ත්වයන් සහ යථා තත්ත්වයට පත්වන සංචාරක අංශය මගින් මෙහෙයවනු ලබන දීප්තිමත් අනාගතයක් දෙස බලන විට ඔවුන්ගේ හවුල්කාරිත්වය අතිශයින්ම වටිනාකමක් ගෙන දේ. මෙම සහයෝගීතාවය හිල්ටන් වර්ල්ඩ්වයිඩ් සමඟ අපගේ දිගුකාලීන සම්බන්ධතාවය ශක්තිමත් කරන අතර අනාගත වර්ධනය සඳහා වේදිකාව සකසයි.

අවසාන වශයෙන්, අපගේ වටිනා අමුත්තන්ට, ඔබගේ අඛණ්ඩ විශ්වාසය සහ පක්ෂපාතිත්වය වෙනුවෙන් ස්තූතියි; ඉදිරි වසරවලදී සුවිශේෂී අත්දැකීම් ලබා දීමට අපි කැපවී සිටිමු.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු

## ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා

සභාපති

ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති ප්‍රමුඛතම දේපළ ආයෝජන, සංවර්ධන සහ කළමනාකරණ සමාගමක් වන ඕවසීස් රියල්ටි (සිලෝන්) පී.එල්.සී. හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිවරයා වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් දරයි.

වසර 23 ක ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් ඇතුළුව, වසර 38 කට අධික වෘත්තීය සහ වාණිජ අත්දැකීම් ඇති සමරසිංහ මහතා දේපළ, කාර්මික, සේවා, වෙළඳ, වතු සහ අපනයන යන අංශ හරහා පුළුල් විශේෂඥ දැනුමක් ගෙන එයි. ඔහු පොදු ලැයිස්තුගත සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කරන අතර, ආයතනික පාලනය සහ උපායමාර්ගික අධීක්ෂණය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු කිහිපයක සභාපතිත්වය දරයි.

සමරසිංහ මහතා ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩල ආයතනය, සේවායෝජකයන්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා කාර්මික සංගමය, ශ්‍රී ලංකා නිවාස සංකීර්ණ සංවර්ධකයින්ගේ සංගමය සහ EFC අනුබද්ධ සමාගම් සමූහයේ හිටපු සභාපතිවරයා ලෙස ප්‍රධාන කර්මාන්ත නායකත්ව භූමිකාවන් කිහිපයක් දරනු ලැබ ඇත. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ - ශ්‍රී ලංකා අංශයේ හිටපු සභාපතිවරයෙකු වන අතර, එම ආයතනයෙහි හිටපු කවුන්සිල සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ලංකා වාණිජ මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරන අතර, සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලය, හාවඩ් විශ්ව විද්‍යාලය සහ ඕස්ට්‍රේලියානු අධ්‍යක්ෂ මණ්ඩල ආයතනය වැනි ජාත්‍යන්තරව පිළිගත් ආයතන විසින් පවත්වන ලද විධායක සංවර්ධන වැඩසටහන් කිහිපයකට ද සහභාගී වී ඇත.

## දීෂානා එස්. අමරසේකර මහත්මිය

අධ්‍යක්ෂ

දීෂානා එස්. අමරසේකර මහත්මිය එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි ඇමරිකානු විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ විශේෂීකරණය සහිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, එක්සත් ජනපදයේ හවායි විශ්ව විද්‍යාලයෙන් හෝටල් කළමනාකරණය පිළිබඳ විශේෂීකරණය සහිත සංචාරක කර්මාන්ත කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ලබා ඇත.

ආගන්තුක සත්කාර අංශයේ පුළුල් අත්දැකීම් ඇති අමරසේකර මහත්මිය, ශ්‍රී ලංකාවේ මහනුවර පිහිටි සම්මානලාභී බූටික් හෝටලයක් සහ සුඛෝපභෝගී භෝජනාගාරයක් වන The Theva Risidency සහ The Theva Cuisine හි කළමනාකාර අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරයි. ඇයගේ නායකත්වය යටතේ, ආයතන දෙකම පසුගිය වසර 16 පුරා අඛණ්ඩව ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ඇත. මෑතකදී ලැබුණු සම්මාන අතරට "Trip Advisor Travelers' Choice Award 2025", "Timeout Sri Lanka විසින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට හොඳම හෝටල් 12 - 2025" සහ වසර ගණනාවක් පුරා දකුණු ආසියානු සංචාරක සම්මාන උළෙලෙන් ලැබුණු බහුවිධ ගෞරවයන් ද ඇතුළත් වේ.

පුද්ගලික අංශයේ ඇයගේ වැඩ කටයුතුවලට අමතරව, ඇය Geoffrey Bawa Trust සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටින අතර, එහිදී ඇය කොළඹ පිහිටි Bawa ගේ වාස්තු විද්‍යාත්මක දේපළ වන Number 11 සහ De Saram House හි මෙහෙයුම් කළමනාකරණය අධීක්ෂණය කරයි.

ඇය ශ්‍රී ලංකාවේ කඳුකරයේ ප්‍රජා සංවර්ධනය සඳහා කැපවූ උපදේශකවරියක් ද වන අතර, කාන්තාවන් සහ ළමුන් සවිබල ගැන්වීමේ වැඩසටහන් වලට ක්‍රියාකාරීව සහභාගී වේ. The T.E.A. Project හි ළමා සවිබල ගැන්වීමේ මධ්‍යස්ථානයේ භාරකාරවරියක් ලෙස, අවදානමට ලක් වූ ළමුන්ට පුහුණුව, සවිබල ගැන්වීම සහ දැනුවත් කිරීම ලබා දීමේ සංවිධානයේ මෙහෙවරට ඇය දායක වේ. අතිරේකව, තේ වතු ප්‍රජාවන් තුළ ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන සහ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සහතික කිරීම මගින් ඔසප් දරිද්‍රතාවයට මුහුණ දෙන Sizuku Sri Lanka Pads Forward වැඩසටහනේ ව්‍යාපෘති කළමනාකාරිනිය ලෙස ද ඇය සේවය කරයි.

## දුලින්ද පෙරේරා මහතා

අධ්‍යක්ෂ

දුලින්ද පෙරේරා මහතා IKON සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස දස වසරකට අධික පළපුරුද්දක් ඇති මෙන්ම වෙළඳ නාමකරණය, ඩිජිටල් පරිවර්තනය සහ මූල්‍ය කටයුතු පිළිබඳ වසර ගණනක විශේෂඥ දැනුමක් ඇති දක්ෂ වෘත්තිකයෙකි. ඔහු දේශීය හා ගෝලීය ආයතන රැසක ආයතනික වෘත්තිකයෙකු සහ වෙළඳ නාමකරණ උපදේශකයෙකු ලෙස සේවය කර ඇති අතර, ඔවුන්ගේ වර්ධනයට සහ උපායමාර්ගික මුලපිරීම් සඳහා දායක වී ඇත.

ඔහුගේ නායකත්ව භූමිකාවන්ට අමතරව, ඔහු පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පී.එල්.සී. සහ පීපල්ස් ඉන්ශුවරන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරන අතර, පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස ද සේවය කරයි. මේ අතරතුර, ඔහු තවත් බොහෝ තනතුරු වලට ක්‍රියාකාරීව සහභාගී වේ.

පෙරේරා මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් රසායනික හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු උපාධියක් සහ බටහිර ස්කොට්ලන්ත විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් දරයි.

ඔහු වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු (ACMA) වේ. තවද, ඔහු වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

## චමිල් උඩවත්ත මහතා

### අධ්‍යක්ෂ

චමිල් උඩවත්ත මහතා සංචාරක හා ගුවන් සේවා අංශයේ වසර 30 කට වැඩි කර්මාන්ත පළපුරුද්දක් ඇති පළපුරුදු වෘත්තිකයෙකි. ඔහු උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධනය, ජාත්‍යන්තර නියෝජිත සම්බන්ධතා සහ මෙහෙයුම් නායකත්වය ආදී ක්ෂේත්‍ර ගණනාවක පුළුල් අත්දැකීම් ලබා ඇත. ඔහු දැනට හේලීස් ට්‍රැවල්ස් ඇන්ඩ් ඒවියේෂන් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන (1994 සිට) අතර, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ජාතික වෙළඳ හා සංචාරක මුලපිරීම් සඳහා දායක වේ.

ඔහුගේ වෘත්තීය ජීවිතය පුරාම උඩවත්ත මහතා උපායමාර්ගික සැලසුම්කරණය, අයවැය කළමනාකරණය, පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ දැනුමක් පෙන්නුම් කර ඇත. ගෝලීය සංචාරක වෙළඳපොලවල් සහ නියාමන රාමු පිළිබඳ ඔහුගේ ගැඹුරු අවබෝධය හේතුවෙන්, ජාත්‍යන්තර වෙළඳපල පුළුල් කිරීම් සහ ගෝලීය සංචාරක ප්‍රදර්ශනවලට සහභාගී වීම ඇතුළු සාර්ථක මුලපිරීම් රැසකට ඔහු නායකත්වය දී ඇත.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහ කර්මාන්තය ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීම සහතික කරමින්, මෙහෙයුම් කාර්ය සාධනය ආයතනික අරමුණු සමඟ සමපාත කිරීමට ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. උඩවත්ත මහතාගේ නායකත්වය ශ්‍රී ලංකාවේ සංචාරක හා ගුවන් සේවා ක්ෂේත්‍රයේ නවෝත්පාදනය සහ වර්ධනයට අඛණ්ඩව සහාය වන අතර, ඔහුගේ රාජ්‍ය හා පුද්ගලික අංශයේ භූමිකාවන් හරහා ජාත්‍යන්තර වෙළඳාම සහ සංචාරක සංවර්ධනය ප්‍රවර්ධනය කරයි.

## බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා

### අධ්‍යක්ෂ

බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය අංශයේ පාලනය සහ රාජ්‍ය ව්‍යාවසාය අධීක්ෂණය පිළිබඳ වසර 30 කට අධික පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ රාජ්‍ය අංශයේ වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර, දැනට මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරයි.

රොද්‍රිගෝ මහතා 1995 දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, එතැන් සිට රජයේ ආයතන කිහිපයක ප්‍රධාන තනතුරු දරා ඇත. ඔහුගේ අත්දැකීම් අතරට මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයෙකු ලෙසත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙසත්, චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ දෙවන ලේකම්වරයෙකු ලෙසත්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රාදේශීය ණය හා සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු ලෙසත් කටයුතු කිරීම ඇතුළත් වේ.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් දරයි. ඔහු ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකි. රොද්‍රිගෝ මහතා රජයේ ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල ද සේවය කරන අතර, විවිධ විගණන හා කළමනාකරණ කමිටුවල සභාපතිවරයා ලෙස ඔහුගේ භූමිකාව හරහා රාජ්‍ය අංශයේ පාලනයට දායක වේ.

## රුවන් ප්‍රනාන්දු මහතා

### අධ්‍යක්ෂ

රුවන් ප්‍රනාන්දු මහතා කෙන්යාවේ නයිරෝබි හි පදනම් වූ ශ්‍රී ලාංකික ව්‍යාවසායකයෙකු වන අතර, නැගෙනහිර අප්‍රිකාව පුරා ක්‍රියාත්මක වන විවිධාංගීකරණය වූ කලාපීය සමූහ ව්‍යාපාරයක් වන මේලීන් කෝපරේෂන් (Mayleen Corporation) හි නිර්මාතෘ සහ සභාපතිවරයා වේ. 2000 දශකයේ මුල් භාගයේ සිට කෙන්යාවේ සිට ආරම්භ කර, රුවන් ප්‍රනාන්දු මහතා සිංගප්පූරුවේ සිට අප්‍රිකාව දක්වා ව්‍යාපාර පුළුල් කර ඇත. මෙම සමූහය යටිතල පහසුකම් සංවර්ධනය, ගුවන් තොටුපල සැලසුම්කරණය, සිවිල් ඉංජිනේරු විද්‍යාව, පුනර්ජනනීය බලශක්තිය, නිෂ්පාදනය, ක්ෂණික අලෙවියක් සහිත පාරිභෝගික භාණ්ඩ ක්ෂේත්‍රය, ඊ-සංචලතාව, කෘෂි ව්‍යාපාර, සමුද්‍රීය හා ගුවන් සේවා (GSA, DMC, IATA අනුමත සේවා) ඇතුළු බහුවිධ අංශ හරහා ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව නයිරෝබි වෙත සෘජු ගුවන් ගමන් ක්‍රියාත්මක කරන විට මේලීන් කෝපරේෂන් (Mayleen Corporation) ශ්‍රී ලංකා ගුවන් සේවයේ මගී අලෙවි නියෝජිතයා විය.

ප්‍රනාන්දු මහතා සිංගප්පූරුව සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් පවත්වාගෙන යයි. ඔහු වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ Enterprise Singapore සඳහා වෙළඳපල ප්‍රවේශය සහ ව්‍යාපාර සංවර්ධනය සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියෙකු ලෙස සේවය කර ඇත. 2019 සිට, ඔහු කෙන්යාවට ඉහළ පෙළේ සිංගප්පූරු නියෝජිත පිරිස් කිහිපයකට පහසුකම් සලසා ඇති අතර, ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන සඳහා සහාය වී ඇත. 2023 දී ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් ඔහු කෙන්යාවේ ශ්‍රී ලංකාවේ

# අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු

නියෝජිතයා ලෙස ස්වේච්ඡා පදනම මත පත් කරන ලදී. ඔහුගේ සමූහය විසින් ශ්‍රී ලාංකික භාණ්ඩ හා සේවා කෙන්යාවට ආනයනය කිරීමෙන් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සමග සමීපව කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක වී ඇත.

ප්‍රනාන්දු මහතා කලාපීය ආර්ථික සංසදවල නිත්‍ය නියෝජිතයකු වන අතර, අප්‍රිකාව පුරා ඔහුගේ නායකත්වය සහ ව්‍යාවසායක දායකත්වය වෙනුවෙන් පිළිගැනීමක් ලබා ඇත.

ප්‍රනාන්දු මහතා දැනට හාවඩ් ව්‍යාපාර පාසලේ (Harvard Business School) ව්‍යාපාර උපායමාර්ගික වැඩසටහනට (Business Strategy Program) ඇතුළත් වී සිටී.

## මනෝජ් අල්ගම මහතා

අධ්‍යක්ෂ

මනෝජ් අල්ගම මහතා උපායමාර්ගික කළමනාකරණය, මූල්‍ය සැලසුම්කරණය සහ ඩිජිටල් පරිවර්තනය පිළිබඳ වසර 30 කට අධික ජාත්‍යන්තර පළපුරුද්දක් ඇති දක්ෂ ව්‍යාපාර නායකයෙකි. ඔහු ඕස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් දරයි.

අල්ගම මහතා HSBC, DFCC, සහ Ernst & Young වැනි ප්‍රමුඛ ආයතනවල ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් දරා ඇති අතර, එහිදී ඔහු මූල්‍ය ප්‍රතිව්‍යුහගතකරණය, උපායමාර්ගික පරිවර්තනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ඔහුගේ විශේෂඥ දැනුම ගෝලීය බැංකු මෙහෙයුම්, ධන කළමනාකරණය සහ මූලික බැංකු විසඳුම් දක්වා විහිදේ. ඔහු සංකීර්ණ වෙනස්කම් මුලපිරීම් සාර්ථකව මෙහෙයවා ඇති අතර, විවිධ වෙළඳපොලවල් හරහා කාර්යක්ෂමතාව සහ පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කළ ඩිජිටල් නවෝත්පාදන හඳුන්වා දී ඇත.

එක්සත් රාජධානිය, මැද පෙරදිග, උතුරු අප්‍රිකාව සහ දකුණු ආසියාව වැනි කලාප හරහා ඉහළ කාර්ය සාධන කණ්ඩායම් කළමනාකරණය කිරීමේ ඔහුගේ අත්දැකීම් ඔහුට ශක්තිමත් ගෝලීය දෘෂ්ටිකෝණයක් සපයයි. ඔහු ආයතනික දැක්ම විකාශනය වන වෙළඳපල ගතිකත්වය සමඟ සමපාත කිරීම, දිගුකාලීන වර්ධනයට සහ තරගකාරිත්වයට සහාය වීම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ගෙන එයි.

Ernst & Young හි ඔහුගේ උපදේශන පසුබිම ඩිජිටල් පරිවර්තනය, ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරුකරණය සහ උපායමාර්ගික අවදානම් කළමනාකරණය පිළිබඳ ඔහුගේ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කරයි. නායකත්ව සංවර්ධනය සඳහා දැඩි ආධාරකරුවෙකු වන ඔහු අඛණ්ඩ ඉගෙනීම, සහයෝගීතාවය සහ කාර්ය සාධන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කරයි.

## ජේ. ජී. එස්. සේනාධීර මහතා

අධ්‍යක්ෂ

ජේ. ජී. එස්. සේනාධීර මහතා ආයතනික සංවර්ධනය, ධාරිතා වර්ධනය සහ විධායක අධ්‍යාපනය පිළිබඳ වසර 20 කට අධික පළපුරුද්දක් ඇති දක්ෂ ආයතනික පුහුණුකරුවෙකු, ව්‍යාපාර උපායමාර්ගිකයෙකු සහ නායකත්ව පුහුණුකරුවෙකු වේ. ඔහු දැනට ශ්‍රී ලංකාවේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ක්‍රියාත්මක වන IBMC සමූහ ව්‍යාපාරයේ (IBMC Group of Companies) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කරන අතර, ආයතනික පුහුණුව, වෙළඳ දැන්වීම්, ප්‍රකාශන සහ ව්‍යාපාර උපදේශන යන අංශවල ක්‍රියාත්මක වේ.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ ගෞරව සහිත විද්‍යාපති උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් දරයි. ඔහු CIMA සුදුසුකම් ලත් වෘත්තිකයෙකු වන අතර, ස්නායු-භාෂාමය වැඩසටහන්කරණයේ (Neuro-Linguistic Programming - NLP) සහ ජීවිත පුහුණුකරණයේ (Life Coaching) ප්‍රධාන වෘත්තිකයෙකුද වන අතර නායකත්වය සහ කණ්ඩායම් සංවර්ධනය සඳහා බහුවිධ ප්‍රවේශයක් ගෙන එයි.

සේනාධීර මහතා ආයතනික වැඩමුළු 1,200 කට අධික ප්‍රමාණයක් පවත්වා ඇති අතර, ආයතන 180 කට අධික සංඛ්‍යාවක් සමඟ හවුල් වී, අභිප්‍රේරණය, උපායමාර්ගික නායකත්වය සහ කාර්ය සාධන වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ වැඩසටහන් ලබා දී ඇත. ඔහුගේ වෘත්තීය අනුබද්ධතා අතරට AITD, MAAT සහ මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ සහතික කිරීම් මෙන්ම, සහතික ලත් යෝගා ශිරෝමනී (Yoga Shiromani) සහ සාම විනිසුරු (Justice of the Peace) ලෙස පිළිගැනීම ද ඇතුළත් වේ.

ඔහුගේ ගතික හා පරිවර්තනීය පුහුණු ක්‍රමවේදයන් සඳහා ප්‍රසිද්ධ සේනාධීර මහතා, ඉහළ කාර්ය සාධන සංස්කෘතීන් හැඩගැස්වීමේදී සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ උපායමාර්ගික උපදේශන සේවා හරහා ආයතනික වර්ධනයට සහාය වීමේදී අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## උස්මාන් අන්නාස් මහතා

අධ්‍යක්ෂ

උස්මාන් මහතා මූල්‍ය උපායමාර්ග, අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර තක්සේරුකරණය පිළිබඳ වසර හතකට අධික පළපුරුද්දක් ඇති මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු දැනට IKON සමූහ ව්‍යාපාරයේ (IKON Group of Companies) ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස සේවය කරන අතර, එහිදී ඔහු මූල්‍ය මෙහෙයුම් අධීක්ෂණය කරන අතර, උපායමාර්ගික තීරණ ගැනීම් සහ ආයතනික වර්ධනයට දායක වේ. ඔහු Derwant Services (Pvt) Ltd හි මූල්‍ය කළමනාකරු තනතුර ද දරන අතර, මූල්‍ය සැලසුම්කරණය, වෙළඳ මූල්‍යකරණය සහ පුරෝකථනය කෙරෙහි අවධානය යොමු කරයි.

ඔහුගේ අධ්‍යාපන පසුබිමට බටහිර ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ඇතුළත් වන අතර, ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සමත් වූ අවසන් විභාග අපේක්ෂකයෙකු වන අතර, ඔහුගේ භූමිකාවන්ට න්‍යායික අවබෝධය සහ ප්‍රායෝගික විශේෂඥ දැනුම යන දෙකම ගෙන එයි.

ඔහුගේ වෘත්තීය ජීවිතයේ මුල් අවධියේදී, උස්මාන් මහතා KPMG ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර විගණන, අවදානම් සහ අනුකූලතා සේවා (Internal Audit, Risk) Compliance Services - IARCS) අංශය තුළ සේවය කළ අතර, අභ්‍යන්තර පාලන පද්ධති, විගණන ක්‍රියාවලීන් සහ ආයතනික අවදානම් රාමු පිළිබඳ වටිනා අත්දැකීම් ලබා ගත්තේය.

ඔහුගේ ආයතනික වගකීම්වලට අමතරව, ඔහු Imperial College of Business Studies හි කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරන අතර, එහිදී ඔහු අභිලාෂකාමී මූල්‍ය වෘත්තිකයන් සමඟ ඔහුගේ කර්මාන්ත දැනුම බෙදා ගනී.

## රෝෂිකා ජයවර්ධන මහත්මිය

**අධ්‍යක්ෂ**

රෝෂිකා ජයවර්ධන මහත්මිය ආගන්තුක සත්කාර සහ සංචාරක අංශවල වසර 20 කට අධික පළපුරුද්දක් ඇති පළපුරුදු වෘත්තිකයෙකු වන අතර, භෝජන සංග්‍රහ අලෙවිය, රැස්වීම් හා උත්සව කළමනාකරණය සහ ආයතනික සම්බන්ධතා පිළිබඳ විශේෂඥවරියකි. ඇය සිය වෘත්තීය ජීවිතය Superlink Travels හි ආරම්භ කළ අතර, පසුව Access Travels හි කළමනාකාර භූමිකාවන් දක්වා උසස් වූ අතර, එහිදී ඇය ජාත්‍යන්තර කණ්ඩායම් චාරිකා සහ ව්‍යාපාර සංවර්ධන මුලපිරීම් හසුරුවා ඇත.

2004 දී, ඇය Waters Edge හි පූර්ව ආරම්භක අදියරේදී භෝජන සංග්‍රහ අලෙවි ප්‍රධානී ලෙස සම්බන්ධ විය. උපායමාර්ගික අලෙවි සැලසුම්කරණය හරහා ආදායම් ඉහළ නංවමින්, මහා පරිමාණ ආයතනික උත්සව සහ මංගල උත්සව මෙහෙයවමින්, මෙම දේපළ ප්‍රමුඛ රැස්වීම් සහ උත්සව ස්ථානයක් ලෙස ස්ථානගත කිරීමේදී ඇය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළාය. පසුව ඇය Regent Banqueting and Resorts හි සාමාන්‍යාධිකාරී - අලෙවි සහ ප්‍රවර්ධන (General Manager - Sales & Marketing) ලෙස සම්බන්ධ වූ අතර, Reefs Edge Hotel දියත් කිරීම සහ දිගුකාලීන ආදායම් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළාය.

ඇයගේ නායකත්වය වෙනුවෙන් පිළිගැනීමක් ලබා, 2018 දී ඇය Waters Edge වෙත අධ්‍යක්ෂ - භෝජන සංග්‍රහ අලෙවි (Director - Banquet Sales) ලෙස නැවත පැමිණි අතර, එහිදී ඇය ජ්‍යෙෂ්ඨ අලෙවි කණ්ඩායමකට නායකත්වය දුන් අතර, සේවාදායකයා කේන්ද්‍ර කරගත් ප්‍රචාරක ව්‍යාපාර සංවර්ධනය කළ අතර, ස්ථාවර මූල්‍ය කාර්ය සාධනයක් සහතික කළාය. ඇය සේවා විශිෂ්ටත්වය පවත්වාගෙන යාම සඳහා පුහුණු වැඩසටහන් ද පැවැත්වූවාය.

ජයවර්ධන මහත්මිය දැනට සුඛෝපභෝගී විලා ආයතනයක ව්‍යාපාර උපදේශකවරියක් ලෙස සේවය කරන අතර, ආගන්තුක සත්කාර කළමනාකරණය, අලෙවිකරණ උපායමාර්ගය සහ සේවාදායකයා සමඟ සම්බන්ධ වීම පිළිබඳ ඇයගේ විශේෂඥ දැනුම නව ව්‍යාපාර සඳහා යොදවමින් කර්මාන්තයේ වර්ධනයට අඛණ්ඩව දායක වේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

## ශමාහිල් මොහිදීන් මහතා

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

ශමාහිල් මොහිදීන් මහතා යනු වසර 25කට වැඩි පශ්චාත් සුදුසුකම් අත්දැකීම් ඇති, පළපුරුදු මූල්‍ය වෘත්තිකයෙකු මෙන්ම එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) හි සාමාජිකයෙකි. ඔහු දේශීයව සහ ජාත්‍යන්තරව ප්‍රමුඛ පෙළේ සමාගම්වල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු දරා ඇත.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හා එක්වීමට පෙර, මොහිදීන් මහතා, එයිට්කන් ස්පෙන්ස් සමූහයේ අනුබද්ධිත සමාගමක් වන එයිට්කන් ස්පෙන්ස් පවර් (Aitken Spence Power) හි අධ්‍යක්ෂ සහ උප සභාපති ලෙස සේවය කළේය. එම ධූරයේදී, ඔහු මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතිවල මූල්‍ය හා මෙහෙයුම් කළමනාකරණයට නායකත්වය දුන් අතර, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අවදානම් අවම කිරීම, සහ පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීමේ ප්‍රබල ව්‍යාපෘති කළමනාකරණ කුසලතා පෙන්නුම් කළේය.

මොහිදීන් මහතාගේ සංකීර්ණ ව්‍යාපෘති කළමනාකරණයේ විශේෂඥතාවය, ඔහුගේ ගැඹුරු මූල්‍ය තීක්ෂණ බුද්ධිය සමඟින්, විවිධ ව්‍යාපාරික මෙහෙයුම් හරහා කාර්යක්ෂමතාව සහ වටිනාකම් නිර්මාණය කිරීමට ඔහුට හැකියාව ලබා දෙයි.

## ජූඩ් වික්‍රමරත්න මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

ජූඩ් වික්‍රමරත්න මහතා, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, සහ උපායමාර්ගික සැලසුම්කරණය පිළිබඳ වසර 15කට වැඩි පළපුරුද්දක් ඇති මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) හි ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් (MBA) උපාධියක් ලබා ඇත.

ඔහු සිය වෘත්තීය ජීවිතය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බහුජාතික යටිතල පහසුකම් සමාගමකින් ආරම්භ කළ අතර, එහිදී ඔහු ජාත්‍යන්තර මූල්‍ය භාවිතයන් සහ මහා පරිමාණ ව්‍යාපෘති පරිසරයන් පිළිබඳ වටිනා අත්දැකීම් ලබා ගත්තේය. 2012 වසරේදී, ඔහු ගණකාධිකාරීවරයෙකු ලෙස සමාගමට එක් වූ අතර, ක්‍රමයෙන් වැඩිවන වගකීම් බාරගනිමින් ඉදිරියට පැමිණ ඇත. 2022 වසරේදී ඔහු ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත් කරන ලදී.

# ආයතනික පාලනය

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් ආයතනික පාලන පිළිවෙත් අනුගමනය කිරීම සඳහා ඉහළ වැදගත්කමක් ලබා දෙන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ ආචාරධර්ම පද්ධතිය සහ 2021 නොවැම්බර් 16 දිනැති චක්‍රලේඛය මගින් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද, මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ යටතේ සංවිධානය තුළ ඉහළම ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීමට කැපවී සිටී.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික උපායමාර්ගික ඉලක්ක, වටිනාකම් සහ ප්‍රමිතීන් සකස් කිරීමේ වගකීම දරන ඉහළම ආයතනය ලෙස නායකත්වය සපයන අතර, සමාගම ඉහළ ආයතනික පාලන මට්ටමක් සහ වාර්තාකරණයේ විනිවිදභාවය පවත්වා ගෙන යන බවට වග බලා ගැනීම සඳහා කාර්ය සාධනය නිරීක්ෂණය කර වාර්තා කරයි. මෙය පාර්ශවකරුවන් කෙරෙහි ඇති බැඳීම් සහ වගකීම් ඉටු කිරීමට දායක වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

විමර්ශනයට ලක්වන වසර අවසන් වන විට, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් අතර සමාගම විසින් සිදු කරනු ලබන ව්‍යාපාරයට සුදුසු කුසලතා හා අත්දැකීම් සමතුලිතතාවයක් සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටියහ. ඔවුන් පිළිබඳ විස්තර පහත දැක්වේ:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන (2024.10.03 දින සිට පත් කරන ලදී)
- ධීෂානා එස්. අමරසේකර මහත්මිය - ස්වාධීන විධායක නොවන
- පී. එච්. පී. දෙනියාය මහතා - ස්වාධීන විධායක නොවන
- ආචාර්ය ඒ. අයි. කංකානම්ගේ මහතා - ස්වාධීන විධායක නොවන
- එම්. එස්. වත්තේගම මහතා - ස්වාධීන විධායක නොවන
- ආර්. සූරියආරච්චිගේ මහතා - ස්වාධීන විධායක නොවන
- චමිල් උඩවත්ත මහතා - ස්වාධීන විධායක නොවන (2024.10.11 දින සිට පත් කරන ලදී)
- දුලින්ද පෙරේරා මහතා - ස්වාධීන විධායක නොවන (2024.10.11 දින සිට පත් කරන ලදී)
- ඒ. ජී. එස්. සේනාධීර මහතා - ස්වාධීන විධායක නොවන (2024.10.11 දින සිට පත් කරන ලදී)
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - විධායක නොවන ස්වාධීන නොවන (2024.11.08 දින සිට පත් කරන ලදී)

සමාලෝචනයට ලක්වන වසර තුළ දී පහත සඳහන් අය සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කිරීම නවතා දමන ලදී:

- උපුල් ධර්මදාස මහතා (2024-10-03 දින සිට)
- පී. ඒ. ජයකාන්ත මහතා (2024-10-11 දින සිට)
- කේ. එස්. වීරසිංහ මහතා (2024-10-11 දින සිට)
- කේ. ඒ. ආර්. ජේ. ප්‍රනාන්දු මහතා (2024-10-11 දින සිට)
- පී. ඒ. එස්. ඒ. කුමාර මහතා (2024-11-08 දින සිට)

සමාලෝචනයට ලක්වන වසර තුළ දී පහත සඳහන් අය අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරන ලදී:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා (2024-10-03 දින සිට)
- දුලින්ද පෙරේරා මහතා (2024-10-11 දින සිට)
- ඒ. ජී. එස්. සේනාධීර මහතා (2024-10-11 දින සිට)
- චමිල් උඩවත්ත මහතා (2024-10-11 දින සිට)
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා (2024-11-08 දින සිට)

2025 වසර තුළ දී පහත සඳහන් අය සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කිරීම නවතා දමන ලදී:

- ආචාර්ය ඒ. අයි. කංකානම්ගේ මහතා (2025-01-08 දින සිට)
- පී. එච්. පී. දෙනියාය මහතා (2025-01-08 දින සිට)
- එම්. එස්. වත්තේගම මහතා (2025-01-22 දින සිට)
- ආර්. සූරියආරච්චිගේ මහතා (2025-01-22 දින සිට)

2025 වසර තුළ දී පහත සඳහන් අය අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරන ලදී:

- මනෝජ් අල්ගම මහතා (2025-01-08 දින සිට)
- උස්මාන් අන්නාස් මහතා (2025-01-08 දින සිට)
- රුවන් ප්‍රනාන්දු මහතා (2025-01-22 දින සිට)
- රොෂිකා ජයවර්ධන මහත්මිය (2025-01-22 දින සිට)

### අධ්‍යක්ෂවරුන් පත් කිරීම

සමාගමේ සංස්ථාපිත ව්‍යවස්ථාවලියට අනුව භාණ්ඩාගාර ලේකම්වරයා බහුතර කොටස් දරන තාක් කල්, අධ්‍යක්ෂවරුන් බහුතරයක් නම් කිරීමට හා පත් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට අයිතිය ඇත. භාණ්ඩාගාර ලේකම්වරයාට පැවරී ඇති බලතලවලට එලෙස පත් කරන ලද ඕනෑම පුද්ගලයෙකු ඉවත් කිරීමට සහ එලෙස ඉවත් කරන ලද ඕනෑම පුද්ගලයෙකු වෙනුවට හෝ ඕනෑම හේතුවක් නිසා අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වන ඕනෑම පුද්ගලයෙකු වෙනුවට තවත් අයෙකු පත් කිරීමට ඇති බලය ද ඇතුළත් වේ. භාණ්ඩාගාර ලේකම්වරයා විසින් එලෙස නම් කරන ලද අධ්‍යක්ෂවරයෙකු වාරය අනුව විශ්‍රාම ගැනීමකට යටත් නොවේ.

අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරුන් 2007 අංක 7 දරණ සමාගම් පනතේ 210 සහ 211 වගන්තිවල විධිවිධානවලට යටත් වන අතර, ඔවුන් වයස අවුරුදු 70 සම්පූර්ණ කිරීමෙන් පසු හෝ සමාගම් පනතේ 211 වගන්තියට අනුව නැවත පත් කරනු

# ආයතනික පාලනය

ලැබීමෙන් පසු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා පමණක් ධුරය දරනු ඇත. එවැනි රැස්වීම්වල දී සමාගම් පනතේ 210 වගන්තියේ සඳහන් වයස් සීමාව වන අවුරුදු 70 එම අධ්‍යක්ෂවරයාට අදාළ නොවන බව විශේෂයෙන් ප්‍රකාශ කරමින් ඔවුන් නැවත පත් කරනු නොලැබුවහොත් මෙම තත්ත්වය අදාළ වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගමේ මෙහෙයුම් හා මූල්‍ය ප්‍රතිඵල නිතිපතා සලකා බලනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී අයවැයගත හා පුරෝකථනය කරන ලද ප්‍රතිඵල සමඟ අධීක්ෂණය කරනු ලබන අතර, එහිදී සම්මත න්‍යාය පත්‍රයක් සහ මණ්ඩලයේ අවධානය අවශ්‍ය වන වෙනත් ඕනෑම කාරණාවක් සාකච්ඡා කරනු ලැබේ. මණ්ඩලය සෑම වසරකම අවම වශයෙන් 6 වතාවක් රැස් වන අතර, අවශ්‍ය සෑම විටම අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ.

2024 දෙසැම්බර් 31 න් අවසන් වන වසර තුළ දී, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහයක් (10) පවත්වන ලදී. රැස්වීම්වලට සහභාගී වූ ආකාරය පහත දැක්වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දිනය | 2024 දී සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|
| උපුල් ධර්මදාස මහතා | 2023/02/16 | 05/08 |
| ධීෂානා එස්. අමරසේකර මහත්මිය | 2015/04/07 | 09/10 |
| පී. එච්. පී. දෙනියාය මහතා | 2020/01/24 | 10/10 |
| කේ. එස්. වීරසිංහ මහතා | 2023/04/06 | 06/08 |
| පී. ඒ. එස්. ඒ. කුමාර මහතා | 2020/08/24 | 08/09 |
| පී. ඒ. ජයකාන්ත මහතා | 2023/04/06 | 08/08 |
| කේ. ඒ. ආර්. ජේ. ප්‍රනාන්දු මහතා | 2023/03/21 | 0/08 |
| ආචාර්ය ඒ. අයි. කංකානම්ගේ මහතා | 2023/03/21 | 10/10 |
| එම්. එස්. වත්තේගම මහතා | 2023/03/21 | 10/10 |
| ආර්. සූරියආරච්චිගේ මහතා | 2023/03/21 | 09/10 |
| ප්‍රවීර් සමරසිංහ මහතා | 2024/10/03 | 02/02 |
| දුලින්ද පෙරේරා මහතා | 2024/10/11 | 02/02 |
| ඒ. ජී. එස්. සේනාධීර මහතා | 2024/10/11 | 02/02 |
| චමිල් ප්‍රියන්ත මහතා | 2024/10/11 | 02/02 |
| බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා | 2024/11/08 | 01/01 |

අධ්‍යක්ෂවරුන්ට මාසික ගිණුම් ලබා දෙන අතර, වැදගත් සියලු කාරණා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡා කර තීරණ ගනු ලැබේ. තවදුරටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතිය අවශ්‍ය වන ගැටලු පිළිබඳව කමිටු පත්‍රිකා කල්තියා ඉදිරිපත් කරනු ලැබේ. සියලු රැස්වීම්වල වාර්තා සමාගම් ලේකම්වරුන් විසින් නිසි පරිදි සටහන් කර පවත්වාගෙන යනු ලැබේ.

## සභාපති

උපුල් ධර්මදාස මහතා 2023.02.16 සිට 2024.10.03 දක්වා කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළේය.

ප්‍රවීර් සමරසිංහ මහතා 2024 ඔක්තෝබර් 3 වන දින සභාපතිවරයා ලෙස පත් කරන ලදී. ඔහු කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත ප්‍රමුඛ දේපළ වෙළඳාම් සමාගමක් වන ඕවර්සීස් රියල්ටි (ලංකා) පීඑල්සී හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ද වේ. වසර 38 ක පළපුරුද්දක්, ඉන් වසර 23 ක් ජ්‍යෙෂ්ඨ නායකත්වයේ ඇතුළුව, ඔහු දේපළ, කාර්මික, සේවා, වෙළඳ, වතු සහ අපනයන වැනි බහුවිධ අංශ හරහා විශේෂඥ දැනුමක් ලබා ඇත.

සභාපතිවරයාගේ ප්‍රධාන වගකීම්:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට මුලසුන දැරීම සහ මණ්ඩලයේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා සාමය පවත්වා ගැනීම.
- සියලු අධ්‍යක්ෂවරුන් සහ සමාගම් ලේකම්වරයා සමඟ සාකච්ඡා කර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාන්‍ය න්‍යාය පත්‍රයක් සකස් කිරීම, සාකච්ඡා සඳහා වන සියලු වැදගත් මාතෘකා ආවරණය වන බවට වග බලා ගැනීම. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී අධ්‍යක්ෂවරුන්ගේ පූර්ණ හා ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඔවුන්ගේ රාජකාරි හා වගකීම් සහ ඔවුන්ගෙන් අපේක්ෂා කරන සැලකිලිමත් භාවයේ ප්‍රමිතීන් ඉටු කරන බවට වග බලා ගැනීම. සභාපතිවරයා තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැන නගින ගැටලු පිළිබඳව අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කරන බවට ද, අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් තොරතුරු නියමිත වේලාවට ලැබෙන බවට ද සහතික වේ.
- සමාගමේ කටයුතු සහ එහි පාර්ශවකරුවන් කෙරෙහි ඇති බැඳීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට අධීක්ෂණයක් ඇති බවට වග බලා ගැනීම.
- ඉහළම ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම.

## කළමනාකරණය

සමාගමේ දෛනික මෙහෙයුම් ප්‍රධාන මෙහෙයුම් නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට පවරා ඇත. අවදානම් හා අවස්ථාවන් හඳුනාගෙන,

නියමිත කාල රාමු හා අයවැය තුළ ඉලක්ක සපුරා ගැනීම සඳහා පියවර ගන්නා බවට ඔවුන් සහතික වේ.

## අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය

පාර්ශවකරුවන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා මණ්ඩලය ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් හා අවදානම් කළමනාකරණ පද්ධති හඳුන්වා දී ඇත. අභ්‍යන්තර පාලනයන්ට ආවේණික සීමාවන් ඇති බවත්, වංචා හා වැරදිවලට එරෙහිව නිරපේක්ෂ සහතිකයක් නොලැබෙන බවත් මණ්ඩලය මනාව දනී.

අධ්‍යක්ෂ මණ්ඩලය මාසික ගිණුම් සහ සමාගමේ කාර්ය සාධනය අනුමත අයවැයගත ඉලක්ක හා නිතිපතා සමාලෝචනය කරයි.

## විගණන කමිටුව

විගණන කමිටු වාර්තාව පිටු 43 සිට 45 දක්වා ලබා දී ඇත.

විගණන කමිටුව 2023 ජූනි 28 දින සිට පහත පරිදි ප්‍රතිසංස්කරණය කරන ලදී:

- පී. ඒ. එස්. ඒ. කුමාර මහතා - සභාපති (විධායක නොවන ස්වාධීන නොවන)
- පී. එච්. පී. දෙනියාය මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- එම්. එස්. වත්තේගම මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

විගණන කමිටුව 2024 දෙසැම්බර් 17 දින සිට පහත පරිදි ප්‍රතිසංස්කරණය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති (විධායක නොවන ස්වාධීන නොවන)
- පී. එච්. පී. දෙනියාය මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- එම්. එස්. වත්තේගම මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

අධ්‍යක්ෂ මණ්ඩලයේ තවදුරටත් සිදු වූ වෙනස්කම්වලින් පසුව, විගණන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට නැවත වරක් ප්‍රතිසංස්කරණය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති (විධායක නොවන ස්වාධීන නොවන)
- මනෝජ් අල්ගම මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- උස්මාන් අන්නාස් මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

විගණන කමිටුව හෝටල් මෙහෙයුම්වල අභ්‍යන්තර පාලනයන් පිළිබඳ වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කර විශ්ලේෂණය කරයි. විගණන කමිටුව එම වාර්තා සහ සොයාගැනීම් මත පදනම්ව අවශ්‍ය/සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ලබා දෙන අතර, හෝටලයේ/සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිවල වැඩිදියුණු කිරීම් අවස්ථා හඳුනාගනී.

විගණන කමිටුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා නිකුත් කිරීමට පෙර ඒවා සමාලෝචනය කරයි. 2023 අප්‍රේල් මාසයේ දී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව ගරු. වී. කනගසබාපති මහතා ආරාධනයෙන් විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

## වේතන කමිටුව

වේතන කමිටුව 2023 අප්රේල් 20 දින සිට පහත පරිදි ප්‍රතිසංස්කරණය කරන ලදී:

- උපුල් ධර්මදාස මහතා - සභාපති (ස්වාධීන විධායක නොවන)
- ආර්. සූරියආරච්චිගේ මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- පී. එච්. පී. දෙනියාය මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- කේ. එස්. වීරසිංහ මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

පී. ඒ. එස්. ඒ. කුමාර මහතා 2023 නොවැම්බර් 28 දින සිට වේතන කමිටුවට පත් කරන ලදී.

වේතන කමිටුව 2024 දෙසැම්බර් 17 දින සිට පහත පරිදි ප්‍රතිසංස්කරණය කරන ලදී:

- ප්‍රවීර් සමරසිංහ මහතා - සභාපති (ස්වාධීන විධායක නොවන)
- ඒ. ජී. එස්. සේනාධීර මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- ආර්. සූරියආරච්චි මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- චමිල් උඩවත්ත මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සාමාජික (විධායක නොවන ස්වාධීන නොවන)

අධ්‍යක්ෂ මණ්ඩලයේ තවදුරටත් සිදු වූ වෙනස්කම්වලින් පසුව, වේතන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට නැවත වරක් ප්‍රතිසංස්කරණය කරන ලදී:

- ප්‍රවීර් සමරසිංහ මහතා - සභාපති (ස්වාධීන විධායක නොවන)
- ඒ. ජී. එස්. සේනාධීර මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- රොෂිකා ජයවර්ධන මහත්මිය - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- චමිල් උඩවත්ත මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සාමාජික (විධායක නොවන ස්වාධීන නොවන)

වේතන කමිටුව වේතන සම්බන්ධ කාරණා පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ලබා දේ.

## සම්බන්ධිත පාර්ශවකරුවන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව

සම්බන්ධිත පාර්ශවකරුවන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට පහත පරිදි ප්‍රතිසංස්කරණය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති (විධායක නොවන ස්වාධීන නොවන)
- රුවන් ප්‍රනාන්දු මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)
- දුලින්ද පෙරේරා මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

# ආයතනික පාලනය

## සමාගම් ලේකම්වරුන්

අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ප්‍රශස්ත ආයතනික පාලන භාවිතයන් අනුගමනය කරන බවට සහතික කිරීම සඳහා සමාගම් ලේකම්වරුන් විසින් සමාගම් පනතට සහ ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත්වලට අදාළ කාරණා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් ලබා දේ.

වර්තමානයේ, සමාගම් පනත යටතේ සුදුසුකම් ලත් ලේකම්වරුන් වන පී. ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරුන් ලෙස කටයුතු කරයි.

## නෛතික අවශ්‍යතා සමඟ අනුකූල වීම

සියලු අධ්‍යක්ෂවරුන්ට සමාගමේ මූල්‍ය හා කළමනාකරණ තොරතුරු වෙත ප්‍රවේශය ඇත. අධ්‍යක්ෂවරුන් සමාගම නීති හා රෙගුලාසිවලට අනුකූල වන බවටත්, සමාගමේ කටයුතු කළමනාකරණය කිරීමේ දී නිසි සැලකිල්ලක් දක්වන බවටත් වග බලා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම දරයි. අතිරේකව, මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන බවට වග බලා ගැනීම සඳහා පරීක්ෂා කිරීම් හා පාලනයන් ක්‍රියාත්මක වේ.

## මූල්‍ය ප්‍රකාශන හා විනිවිදභාවය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සමාගම් පනතට අනුව සකස් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන හා 20 වන සංශෝධන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය සමඟ කියවීමෙන්, විගණකාධිපතිවරයා දිගටම සමාගමේ විගණකවරයා ලෙස කටයුතු කරයි.

විගණකවරුන්ට ස්වාධීනව සහ කළමනාකරණයේ හෝ සමාගමේ මණ්ඩලයේ මැදිහත්වීමකින් තොරව ක්‍රියා කිරීමට ඉඩ දී ඇති අතර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට ද හැකියාව ඇත. අවශ්‍ය සියලු තොරතුරු විගණකවරුන් පරීක්ෂා කිරීම සඳහා ලබා දී ඇත.

## ආචාර ධර්ම ප්‍රමිතීන්

සමාගම සියලුම සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ දී සහ සමාගම වෙනුවෙන් ගනුදෙනු කිරීමේ දී ඉහළම අඛණ්ඩතා ප්‍රමිතීන් පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

සමාගම සිය මෙහෙවර, දැක්ම, ඉලක්ක සහ වටිනාකම්වලට අනුකූලව ඉහළ මට්ටමේ ජයග්‍රහණ කරා සමාගම මෙහෙයවන, බල ගැන්වූ සහ පුහුණුවට කැප වූ සේවක කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහා සේවකයින්ගේ පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි.

## නීත්‍යානුකූල ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලුම නීත්‍යානුකූල ගෙවීම්, හිඟ මුදල් වී ඇති ඒවා, සිදු කර ඇත හෝ අදාළ වන විට ඒ සඳහා විධිවිධාන සලසා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් LKAS - 19, සේවක ප්‍රතිලාභ අනුව විශ්‍රාම පාරිතෝෂික ලබා දී ඇත.

## වගවීම් සහ ප්‍රකාශන

2024 දෙසැම්බර් 31 න් අවසන් වන වසර තුළ දී, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මාසික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විස්තරාත්මකව සමාලෝචනය කර ඇති අතර, ඒවා සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ඉදිරිපත් කරන බවට තමන්ම සෑහීමකට පත් වී ඇත. මෙම පිළිවෙත් ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රාහය සහ රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ අනුව තවදුරටත් ශක්තිමත් කර ඇත.

## ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම

මණ්ඩලය සිය රාජකාරි ඉටු කිරීමේ දී, අවශ්‍ය විටෙක, සමාගමේ වියදමින් බාහිර පාර්ශවයන්ගෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගනී.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල නියෝගය පරිදි

*අත්සනින්,*
**පී. ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්**
*සමාගම් ලේකම්*

කොළඹ
2025 ජූනි 20

# අවදානම් කළමනාකරණය

බහුවිධ අභියෝග මධ්‍යයේ විවිධාංගීකරණය වූ වෙළෙඳපොළවල් ආකර්ෂණය කර ගැනීම හා රඳවා ගැනීම යන ඉල්ලීම් සමග ගැළපෙන, දැඩි තරඟකාරී කර්මාන්තයක පෙරමුණේ සිටින සමාගම, දිගුකාලීන පාර්ශවකරුවන්ගේ වටිනාකම ලබා දීමේ සිය ප්‍රයත්නයේ දී අවදානම් කළමනාකරණය ඒකාබද්ධ ක්‍රියාවලියක් ලෙස සලකයි. වෙනස සාමාන්‍ය තත්ත්වයක් බවට පත් වී ඇති වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ, උපායමාර්ගික සැලසුම්කරණය ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සහ අනුකූලතාව සමතුලිත කිරීමේ දී එය ඉටු කරන ප්‍රධාන කාර්යභාරය හෝටලය නිරතුරුවම හඳුනාගෙන ඇත. මෙය තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සහ අවස්ථාවන්හි හා ඒවායේ ආවේණික අවදානම් පිළිබඳව සවිඥානිකව ඇගයීම පහසු කරන අතර, එමගින් හෝටලයට ප්‍රධාන වත්කම් නිසි පරිදි ආරක්ෂා කිරීමට හෝ වැඩි දියුණු කිරීමට හැකි වේ.

අපගේ අවදානම් කළමනාකරණ වේදිකාව සමාගම තුළ පවතින අවදානම් වර්ග හඳුනා ගැනීම, එම විභව අවදානම් මැනීම සහ ඒවා අවම කිරීම හා පාලනය කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇත. අවදානම් කළමනාකරණය අපගේ ආයතනික පාලන ව්‍යුහයේ සහ උපායමාර්ගික සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ප්‍රමාණවත් බව සහ අනුකූලතාව සහතික කිරීම සඳහා මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල සුදුසු පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සාර්ථකව හා උපායමාර්ගිකව සකස් කර ඇති අතර, ඒවා සමාලෝචනවලට ද ලක් කරයි.

අපගේ අවදානම් කළමනාකරණ රාමුව මෙහෙයුම් පරිසරයේ වෙනස් වන ගතිකත්වයන් නිරන්තරයෙන් පිළිබිඹු කරන අතර, අදාළ වන විට අපගේ ප්‍රතිපත්ති රාමු සහ ජාත්‍යන්තර හොඳම භාවිත ප්‍රමිතීන් සමග ඒකාබද්ධ වී ඇත.

## අවදානම් කළමනාකරණ රාමුව

අවදානම් කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධානියා වන්නේ හෝටලයේ සාමාන්‍යාධිකාරීවරයා වන අතර, ඔහු හිල්ටන් වර්ල්ඩ්වයිඩ් කලාපීය කාර්යාලය සමග සාකච්ඡා කරමින්, මනා ලෙස සකස් කරන ලද අවදානම් කළමනාකරණ රාමුවක් තුළ නීතිමය, භාරකාරී සහ නියාමන වගකීම් ඉටු කිරීම සඳහා අවදානම් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමද සිදුවේ. හෝටලයේ ක්‍රියාකාරී ප්‍රධානීන් සාමාන්‍යාධිකාරීවරයා සමග එක්ව අවදානම් කළමනාකරණ කණ්ඩායම සකස් කරයි. බුද්ධි තොරතුරු රැස් කිරීම, තත්ත්ව විගණන, ආරක්ෂක විගණන, අභ්‍යන්තර විගණන සහ පාරිභෝගික ප්‍රතිචාර හා සිදුවීම් වැනි ක්‍රම මගින් අදාළ සියලු අභ්‍යන්තර හා බාහිර අවදානම් හඳුනා ගැනීම ක්‍රමානුකූල ක්‍රියාවලියක් සහතික කරයි. මෙම හඳුනාගත් අවදානම් ව්‍යාපාරයට ඇති බලපෑම, සිදුවීමේ සම්භාවිතාව සහ වේගය අනුව තක්සේරු කරනු ලැබේ. අවදානම් බලපෑම සහ සම්භාවිතාව අනුව සිතියම් ගත කර ඇති අතර, එය ප්‍රධාන අවදානම් නිරාවරණයන්හි ප්‍රමුඛතාවය තීරණය කිරීමට උපකාරී වේ.

මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම්වල ප්‍රතිඵල 'ඉහළ සිට නොවැදගත්' දක්වා පරිමාණයකින් අවදානම් ශ්‍රේණිගත කරන අවදානම් ජාලකයක වගුගත කර ඇති අතර, එමගින් හෝටලයට අවදානම් වලට ප්‍රමුඛතාවය ලබා දීමට සහ වැළැක්වීමේ, හඳුනාගැනීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් යටතේ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සැලසුම් කිරීමට හැකි වේ.

හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායම හඳුනාගත් අවදානම් මාසිකව සමාලෝචනය කරයි. පවරා ඇති අවදානම් හිමිකරුවන් ඕනෑම අවම කිරීමේ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු අතර සාමාන්‍යාධිකාරීවරයා හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. ඒකාබද්ධ මූල්‍ය හා මෙහෙයුම් අනුකූලතා වාර්තාව කළමනාකාරිත්වය විසින් ලබා ගනී. අවදානම් කළමනාකරණ කණ්ඩායම අවදානම් කළමනාකරණ රැස්වීම්වල න්‍යාය පත්‍රයට අවදානම් සමාලෝචනය ද ඇතුළත් කර ඇත.

| අවදානම් කාණ්ඩය | අවදානම් වර්ගය | පාලන ක්‍රම සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| **මෙහෙයුම් අවදානම** | **තාක්ෂණික අවදානම**<br>ඉලෙක්ට්‍රොනික පද්ධති අසාර්ථක වීමේ අවදානම සහ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් නොවීම. | • සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ වූ දේපළ කළමනාකරණ, ද්‍රව්‍ය කළමනාකරණ, විකුණුම් ස්ථාන (Point of Sales) සහ මූල්‍ය තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, තොරතුරු වල සුමට ප්‍රවාහයක් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම.<br>• පද්ධතියක බිඳ වැටීමකදී හෝ අසාර්ථක වීමකදී විපත්ති ප්‍රතිසාධන සැලැස්මක් පැවතීම සහ අඛණ්ඩව වැඩිදියුණු කිරීම.<br>• නැවතුම් කාලය අඩු කිරීමට සහ මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කිරීමට හෝටලයේ පරිගණක ස්ථාපනයන් ආරක්ෂා කිරීම සඳහා හෝටලයේ තොරතුරු තාක්ෂණ අංශය පාලනයන් ක්‍රියාත්මක කර ඇත.<br>• තොරතුරු ආරක්ෂාව සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ජාල ආරක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව සමාලෝචනය කිරීම සිදු කරනු ලැබේ. |

# අවදානම් කළමනාකරණය

| අවදානම් කාණ්ඩය | අවදානම් වර්ගය | පාලන ක්‍රම සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| **මෙහෙයුම් අවදානම** | **අභ්‍යන්තර ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි**<br>මූල්‍යමය අලාභ ඇතිවීමේ අවදානම සහ ව්‍යාපාරයට බාධා වීම් සහ අභ්‍යන්තර පාලනයන්හි බිඳවැටීම්. | • අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද පද්ධති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇති අතර, ඒවායේ අඛණ්ඩ කාර්යක්ෂමතාවය සඳහා සමාලෝචනය කරනු ලැබේ.<br>• හිල්ටන් වර්ල්ඩ්වයිඩ් වෙතින් අභ්‍යන්තර විගණන කණ්ඩායමක් මෙම පද්ධතිවල ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාවය සහ අනුකූලතා මට්ටම පිළිබඳව නිතිපතා සමාලෝචන සිදු කර වාර්තා කරයි.<br>• වාර්ෂික විගණන සැලැස්මට අනුව සිදු කරන ලද සමාලෝචන සහ පද්ධති හා ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම පිළිබඳව HDL විසින් සමාලෝචනයක් සිදු කර විගණන කමිටුවට වාර්තා කිරීම. |
| | **තරඟකාරී අවදානම**<br>වෙළඳපල කොටස අඩු වීම, කාමර ප්‍රතිසංස්කරණ වැඩසටහන හේතුවෙන් පදිංචි කාලය අඩු වීම සහ කාමර ගාස්තු හේතුවෙන් තරඟකාරී වීමට අසමත් වීම. | • සේවා සැපයීමේ උසස් තත්ත්වය සහ මුදලට සරිලන වටිනාකම සහතික කිරීම සඳහා සේවා ප්‍රමිතීන් දැඩිව පිළිපැදීම.<br>• පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම.<br>• සන්නාම ප්‍රමිතීන් (Brand Standards) සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (Standard Operational Procedures (SOP)) පිළිපැදීම සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.<br>• තරඟකරුවන්ගේ උපාය මාර්ග සහ වෙළඳපලට නව පිවිසෙන්නන් අපේක්ෂා කිරීම සහ ඒ අනුව උපාය මාර්ග සකස් කිරීම.<br>• නිෂ්පාදන හා සේවාවන්හි නිරන්තර නිර්මාණශීලිත්වය සහ නවයකරණය. |
| **මෙහෙයුම්** | **සන්නාම ප්‍රතිරූපය සහ කීර්තිනාම අවදානම**<br>සමාගමේ සන්නාමයට හා කීර්තිනාමයට ප්‍රමාණාත්මක හානියක් සිදු විය හැකි ක්‍රියා. | • පහසුකම් සහ සේවා යන දෙකම ආවරණය වන පරිදි අමුත්තන්ගේ ප්‍රතිචාර සඳහා නිතිපතා සන්නාම විගණන සහ අභිරහස් විගණන (mystery audits) පැවැත්වීම.<br>• HACCP සහ අනෙකුත් තත්ත්ව සහතික කිරීමේ ප්‍රමිතීන් ලබා ගැනීම මගින් පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක හොඳම භාවිතයන්ට අනුකූල වීම. නිෂ්පාදන සහ සේවාව යන දෙකෙහිම කර්මාන්තයේ හොඳම භාවිතයන් නිර්ණායකයක් ලෙස භාවිතා කිරීම.<br>• හෝටල් කර්මාන්තයේ ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් විසින් ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන බව සහතික කිරීම. සන්නාම පොරොන්දුවට අනුකූලව නව්‍ය සේවා සැපයීම. CSR මුලපිරීම් හරහා ආයතනික පුරවැසිභාවය සඳහා වගකීම. |
| | **මානව සම්පත් අවදානම**<br>ප්‍රධාන පුද්ගලයන් සහ නිපුණ කාර්ය මණ්ඩලය අහිමි වීමේ අවදානම; නුසුදුසු ශ්‍රම ක්‍රියාමාර්ග. සේවකයින්ට අනතුරුදායක වැඩ තත්වයන්/රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වීම හේතුවෙන් සිදුවන තුවාල/සෞඛ්‍ය උපද්‍රව අවදානම. | • කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියෙන් පැන නගින ව්‍යුහගත පුහුණු වැඩසටහන්, හරස් නිරාවරණ පුහුණු අවස්ථා.<br>• හොඳ සේවායෝජක-සේවක සබඳතා, සේවක සුබසාධනය, සහ ජයග්‍රාහී ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා කම්කරු සංගම් සමඟ ඵලදායී හා විවෘත සන්නිවේදනය කෙරෙහි අවධානය යොමු කිරීම.<br>• සහයෝගී රැස්වීම්, විනෝද චාරිකා, පවුල් හමුවීම්, සහ ආගමික උත්සව හරහා සංවිධානය පුරා එකමුතුකම සහ ස්වයං අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ඇති කිරීම.<br>• වෙළඳපොලේ වඩාත් තරඟකාරී වීමට ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයින්ගේ වැටුප් මට්ටම සකස් කිරීම. නියම කර ඇති ආරක්ෂක ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි දැඩිව පිළිපැදීම. |

| අවදානම් කාණ්ඩය | අවදානම් වර්ගය | පාලන ක්‍රම සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| මූල්‍ය අවදානම | ආයෝජන අවදානම | • ඕනෑම අතිරේක ආයෝජනයක් සඳහා ඉලක්කගත ලාභාංශ ලබා ගැනීම සහතික කිරීම සඳහා අයවැය ආවර්තිතව අධීක්ෂණය කිරීම.<br>• නව ආයෝජන, කැපවීම් වලට පෙර යථාර්ථවාදී මුදල් ප්‍රවාහයන් සහිත ඉලක්කගත ආයෝජන ප්‍රතිලාභ (ROIs) මත පදනම්ව සමාලෝචනය කරනු ලැබේ.<br>• ක්‍රියාකරු විසින් නිසි නඩත්තුව සහතික කිරීම සඳහා වත්කම් ආවර්තිතව සමාලෝචනය කිරීම. |
| | ණය අවදානම | • ණය නොගෙවීමේ අවදානම අවම කිරීම සඳහා ණය ප්‍රතිපත්ති සහ පාලනයන් කාලීනව සමාලෝචනය කිරීම.<br>• නව ණය ගැතියන් සඳහා ණය සීමාවන් සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය නිතිපතා සමාලෝචනය කිරීම.<br>• ක්ෂණික ක්‍රියාමාර්ග සඳහා ණය ගැති කාලය (debtors aging) පිළිබඳ මාසික අධීක්ෂණය සහ වාර්තා කිරීම. |
| | ද්‍රවශීලතා අවදානම | • ඒකාබද්ධ සේවා ප්‍රසම්පාදනය උපයෝගී කර ගනිමින් සැපයුම්කරුවන් සමඟ හොඳම ණය පහසුකම් සාකච්ඡා කිරීම සහ ලබා ගැනීම.<br>• මෙහෙයුම් මුදල් සඳහා බැංකු පහසුකම් ලබා ගන්නේ සමාගමට ඒ සඳහා මුදල් සැපයීමේ හැකියාව ඇති බව සහතික කිරීම සඳහා සමීප සමාලෝචනයක් සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක් හරහා ය.<br>• ප්‍රාග්ධන ආයෝජන කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරනු ලබන අතර, තිරසාරභාවය සඳහා යථාර්ථවාදී මුදල් ප්‍රක්ෂේපණ සමඟ මූල්‍යකරණය සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් ඇති බව මත පදනම්ව අනුමත කරනු ලැබේ. |
| ආර්ථික සහ දේශපාලන | මුදල් අවදානම | • ප්‍රමාණවත් එක්සත් ජනපද ඩොලර් තැන්පතු තබා ගැනීමෙන් විදේශ මුදල් ආදායම සමඟ විදේශ මුදල් ගෙවීම් ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යෑම (hedging).<br>• පරිවර්තන අවදානම අවම කිරීම සඳහා ඉහළ විනිමය අනුපාත යටතේ අත්තිකාරම් වෙන්කරවා ගැනීමේ අවස්ථාව උපරිම කිරීම. |
| | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | • සාකච්ඡා සහ නව මූල්‍යකරණ විධිවිධාන සඳහා කැප වූ කොන්ත්‍රාත්තු වලට එරෙහිව වෙළඳපල පොලී අනුපාත කාලීනව සමාලෝචනය කිරීම.<br>• බදු සහ වෙනත් බදු වෙනස්වීම් අවදානම අවම කිරීම සඳහා ඵලදායී බදු සැලසුම් උපාය මාර්ග ක්‍රියාත්මක කරන බවට සහතික වීම. |

ඇමරිකා එක්සත් ජනපදයේ හිල්ටන් වර්ල්ඩ්වයිඩ් (Hilton Worldwide of USA) විසින් නියම කර ඇති මාර්ගෝපදේශ අනුව, හෝටලය විසින් ක්‍රියාවට නංවා ඇති, මෙහෙයුම් ක්‍රියාවලියට තර්ජනයක් විය හැකි සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය සමාගම අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය කරන කලාපීය කාර්යාලය විසින් කාලීන සමාලෝචන සිදු කරනු ලබන අතර, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

# අවදානම් කළමනාකරණය

පහත දැක්වෙන්නේ 2024 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා අවදානම් ලේඛනයට ඇතුළත් කර ඇති ප්‍රධාන අයිතම කිහිපයක් සහ ඒ සෑම එකක් සඳහාම ඇති තත්ත්වය සහ අවම කිරීමේ උපාය මාර්ග යි.

| අවදානම් කළමනාකරණය | |
|---|---|
| **අවදානම් කාණ්ඩය සහ විස්තරය** | **පාලන ක්‍රම සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග** |
| සන්නාම ප්‍රතිරූපය සහ කීර්තිනාම අවදානම<br>සමාගමේ සන්නාමයට හා කීර්තිනාමයට ප්‍රමාණවත් හානියක් සිදු විය හැකි ක්‍රියා. | පහසුකම් සහ සේවා යන දෙකම ආවරණය වන පරිදි අමුත්තන්ගේ ප්‍රතිචාර සඳහා නිතිපතා සන්නාම විගණන සහ අභිරහස් විගණන (mystery audits) පැවැත්වීම.<br>HACCP සහ අනෙකුත් තත්ත්ව සහතික කිරීමේ ප්‍රමිතීන් ලබා ගැනීම මගින් පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක හොඳම භාවිතයන්ට අනුකූල වීම.<br>ආහාර සුරක්ෂිතතා සහ සනීපාරක්ෂක කළමනාකරු විසින් ගෝලීය හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ප්‍රමිතීන්ට අනුව ආහාර සුරක්ෂිතතා සහ සනීපාරක්ෂක ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම.<br>බීමට ගන්නා ජලය, පිහිනුම් තටාක ජලය, සිසිලන කුළුණු ජලය, අමුත්තන්ගේ කාමර ජලය සහ ආහාර සැකසුම් ජලයේ ආරක්ෂිත මට්ටම් සහ අවශ්‍යතා අධීක්ෂණය කිරීම සඳහා පිළිගත් රසායනාගාරයක් විසින් නිතිපතා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක හා රසායනික විශ්ලේෂණයන් සිදු කරනු ලැබේ.<br>හෝටලය තුළ වාතයේ ගුණාත්මකභාවය (Indoor Air Quality - IAQ) පරාමිතීන්ට අනුව පවතීදැයි නිතිපතා පරීක්ෂා කරනු ලැබේ.<br>සියලුම ආහාර සැකසුම්/ගබඩා උපකරණ ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් නිතිපතා උපලේඛනගත කර ඉහළම ප්‍රමිතීන් යටතේ සිදු කරනු ලැබේ.<br>නිෂ්පාදන සහ සේවාව යන දෙකෙහිම කර්මාන්තයේ හොඳම භාවිතයන් නිර්ණායකයක් ලෙස භාවිතා කිරීම.<br>හෝටල් කර්මාන්තයේ ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් විසින් ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන බව සහතික කිරීම.<br>සන්නාම පොරොන්දුවලට අනුකූලව නව්‍ය සේවා සැපයීම.<br>ආයතනික සමාජ වගකීම් (CSR) මූලපිරීම් හරහා වගකිවයුතු ආයතනික පුරවැසිභාවය තහවුරු කිරීම. |
| මානව සම්පත් අවදානම<br>ප්‍රධාන පුද්ගලයන් සහ නිපුණ කාර්ය මණ්ඩලය අහිමි වීමේ අවදානම; නුසුදුසු ශ්‍රම ක්‍රියාමාර්ග.<br>සේවකයින්ට අනතුරුදායක වැඩ තත්වයන්/රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වීම හේතුවෙන් සිදුවන තුවාල/සෞඛ්‍ය උපද්‍රව අවදානම. | කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියෙන් පැන නගින ව්‍යුහගත පුහුණු වැඩසටහන්, හරස් නිරාවරණ පුහුණු අවස්ථා සැලසීම.<br>හොඳ සේවායෝජක-සේවක සබඳතා, සේවක සුබසාධනය, සහ ජයග්‍රාහී ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා කම්කරු සංගම් සමඟ ඵලදායී හා විවෘත සන්නිවේදනය කෙරෙහි අවධානය යොමු කිරීම.<br>සහයෝගී රැස්වීම්, විනෝද චාරිකා, පවුල් හමුවීම්, සහ ආගමික උත්සව හරහා ආයතනය පුරා එකමුතුකම සහ ස්වයං අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ඇති කිරීම.<br>වෙළඳපොලේ වඩාත් තරඟකාරී වීමට ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයින්ගේ වැටුප් මට්ටම සකස් කිරීම.<br>නියම කර ඇති ආරක්ෂක ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි දැඩිව පිළිපැදීම. |

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## මූල්‍ය ප්‍රාග්ධනය


හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි, මූල්‍ය ප්‍රාග්ධනය උපායමාර්ගික දියුණුවට සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාවට තීරණාත්මක බලය සැපයීම දිගටම සිදු කරයි. 2024 වසරේදී, ප්‍රධාන අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් නිම කිරීම, සේවා විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීමට සහ උසස් අත්දැකීම් අමුත්තන්ට ලබා දීමට අපගේ කැපවීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම ප්‍රාග්ධන ආයෝජනය මගින් හෝටලයේ මූලික යටිතල පහසුකම් නවීකරණය කරන ලද අතර, අපගේ සේවාවන් විකාශනය වන වෙළඳපල අපේක්ෂාවන් සමඟ පෙළගස්වා, ආගන්තුක සත්කාර අංශය තුළ හෝටලයේ තරඟකාරී ස්ථානගත කිරීම ශක්තිමත් කළේය.

විචක්ෂණශීලී පිරිවැය කළමනාකරණය, ඉහළ කාමර පිරවීම් අනුපාත සහ සියලුම ව්‍යාපාරික අංශ හරහා ආදායම් ප්‍රශස්තකරණය සඳහා වූ ඉලක්කගත ප්‍රවේශය මගින් මෙහෙයවන ලද ප්‍රතිසංස්කරණයෙන් පසු දැක්වූ ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය, අවදානම් වලට ඔරොත්තු දෙන ප්‍රතිසාධනයක් තහවුරු කරයි. සංචාරකයන්ගේ පැමිණීම් වැඩිවීම සහ ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර කර්මාන්තය කෙරෙහි නව විශ්වාසයක් ඇතිවීම මධ්‍යයේ, හිල්ටන් කොළඹ හෝටලය සිය වැඩිදියුණු කරන ලද යටිතල පහසුකම් උපායමාර්ගිකව ප්‍රයෝජනයට ගනිමින් ලාභදායිත්වය වැඩි දියුණු කර, අමුත්තන්ගේ තෘප්තිය ඉහළ නංවා ඇත.

## ආදායම් විශ්ලේෂණය - 2024 මූල්‍ය වසර හා 2023 මූල්‍ය වසර සංසන්දනාත්මකව

2024 මූල්‍ය වර්ෂයේදී, හිල්ටන් කොළඹ හෝටලය එහි ප්‍රධාන ආදායම් මාර්ග හරහා ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, එය අඛණ්ඩ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව මගින් ශක්තිමත් විය. සම්පූර්ණ ආදායම වසරින් වසර 24.1% කින් වර්ධනය වී, 2023 දී වාර්තා වූ රුපියල් බිලියන 4.35 හා සසඳන විට, රුපියල් බිලියන 5.39 දක්වා ළඟා විය.

**ප්‍රධාන ආදායම් මාර්ග**





- කාමර ආදායම 62.5% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 1.85 ක් දක්වා ළඟා විය. අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද, වැඩිදියුණු කරන ලද අමුත්තන්ගේ කාමර නිම කිරීම මගින් අනුබල ලත් ඉහළ කාමර පිරවීම් අනුපාත සහ වැඩිදියුණු වූ සාමාන්‍ය දෛනික ගාස්තු මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.
- වැඩි වූ භෝජනාගාර සහ උත්සව සේවා හේතුවෙන් ආහාර පාන ආදායම 10.1% කින් වර්ධනය වී රුපියල් බිලියන 3.34 ක් දක්වා ළඟා විය. මෙම කාර්යසාධනය, නව සෘතුමය ආහාර පාන මෙනු හඳුන්වාදීම සහ ඉලක්කගත ප්‍රවර්ධන මුලපිරීම් මගින් තවදුරටත් වර්ධනය විය.
- වෙනත් මෙහෙයුම් දෙපාර්තමේන්තු 0.6% ක සුළු වර්ධනයක් සමඟ ස්ථාවරව පැවති අතර, සම්බාහන සේවා, රෙදි සේදීම සහ විනෝදාස්වාද පහසුකම් වැනි අනුබද්ධ සේවා වලින් ස්ථාවර ආදායමක් පවත්වා ගෙන ගියේය. මෙම කාර්යසාධනය, සංචාරක පුනර්ජීවනය සහ ප්‍රශස්ත මෙහෙයුම් ප්‍රයෝජනයට ගන්නා ඵලදායී උපායමාර්ග අවධාරණය කරන අතර, 2025 මූල්‍ය වසරේ අඛණ්ඩ වර්ධනය සඳහා ඉඩ ප්‍රස්තා සලසයි.

### ප්‍රධාන ආදායම් මාර්ග (රු. '000)

| ආදායම් කාණ්ඩය | 2024 මූල්‍ය වර්ෂය | 2023 මූල්‍ය වර්ෂය | වෙනස (%) |
|---|---|---|---|
| කාමර ආදායම | 1,848,222 | 1,137,293 | +62.5% |
| ආහාර සහ පාන ආදායම | 3,342,408 | 3,034,962 | +10.1% |
| අනෙකුත් මෙහෙයුම් දෙපාර්තමේන්තු | 56,153 | 55,845 | +0.6% |
| මුළු ආදායම | 5,393,089 | 4,346,751 | +24.1% |

**පස් අවුරුදු ආදායම් ප්‍රවණතාව**



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය


### වියදම් සහ මෙහෙයුම් ලාභ විශ්ලේෂණය

2024 මූල්‍ය වර්ෂයේදී, සමාගම සැලකිය යුතු මෙහෙයුම් ප්‍රතිසාධනයක් වාර්තා කළ අතර, ක්ෂයවීම් වලට පෙර ලාභය රුපියල් මිලියන 872.1 දක්වා වැඩි විය - එය පෙර වසරේ රුපියල් මිලියන 163.3 හා සසඳන විට 433% ක වර්ධනයකි. මෙම සැලකිය යුතු දියුණුවට හේතු වූයේ ශක්තිමත් ආදායම් වර්ධනය සහ ඵලදායී පිරිවැය කළමනාකරණ මූලපිරීම් ය.

- ආදායම් වර්ධනයේ වැඩිවීම හේතුවෙන් පරිපාලන වියදම් 19.2% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 1.08 ක් විය. ආදායම් ප්‍රතිශතයක් ලෙස, වියදම් පෙර වසරට සාපේක්ෂව ස්ථාවරව පැවති අතර, එය අඛණ්ඩ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.
- අලෙවි සහ ප්‍රවර්ධන වියදම් 2.1% ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, එය ප්‍රවර්ධන වියදම්වල ඵලදායී කළමනාකරණය සහ පාලනය පෙන්නුම් කරයි.
- වෙනත් වියදම් 12.4% කින් අඩු වී රුපියල් මිලියන 611.7 ක් වූ අතර, එයට බදු සංශෝධනය හේතුවෙන් බලශක්ති පිරිවැය අඩු වීම හේතු විය.
- පූර්ව ප්‍රතිසංස්කරණ අදියරේදී ඉවත් කරන ලද වත්කම් අලෙවියෙන් ලැබුණු ලාභය හේතුවෙන්, වෙනත් ලාභ හා අලාභ 117.9% කින් සැලකිය යුතු ලෙස වැඩි වී රුපියල් මිලියන 28.7 ක් විය. මෙය සමාගමේ සමස්ත ලාභදායිත්වයට ධනාත්මක බලපෑමක් ඇති කළේය.

| කාණ්ඩය | 2024 මූල්‍ය වර්ෂය | 2023 මූල්‍ය වර්ෂය | වෙනස (%) |
|---|---|---|---|
| ආදායම | **5,393,089** | 4,346,751 | +24.0% |
| විකුණුම් පිරිවැය | **(2,708,885)** | (2,445,618) | +10.8% |
| දළ ලාභය | **2,684,204** | 1,901,133 | +41.1% |
| වෙනත් ලාභ සහ අලාභ | **28,621** | 13,175 | +117.2% |
| පරිපාලන වියදම් | **(1,077,748)** | (904,197) | +19.2% |
| අලෙවි සහ ප්‍රවර්ධන වියදම් | **(151,347)** | (148,227) | +2.1% |
| වෙනත් වියදම් | **(611,748)** | (698,548) | -12.4% |
| ක්ෂයවීම් වලට පෙර මෙහෙයුම් ලාභය | **872,082** | 163,335 | +433.7% |

දළ ලාභ අනුපාතය




**Revenue (Rs.Mn)**

**5,393**

**2023 - 4,347**

**EBIT (Rs.Mn)**

**311**

**2023 - (204)**

**PBT (Rs.Mn)**

**(268)**

**2023 - (784)**

**Interest Cover (Times)**

**0.5**

**2023 - (0.34)**

## ශුද්ධ මූල්‍ය පිරිවැය විශ්ලේෂණය

2024 අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ, මුළු මූල්‍ය ආදායම 40.5% කින් අඩු වී රුපියල් මිලියන 11 ක් වූ අතර, එය ප්‍රධාන වශයෙන් තැන්පතු සහ සංචිත වලින් ලැබෙන පොලී ආදායමේ සැලකිය යුතු අඩුවීම හේතු විය.

මූල්‍ය පිරිවැය 1.3% ක සුළු අඩුවක් අත්විඳිමින්, සම්පූර්ණ මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 590 ක් විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේදී ණය ගැනීම් සඳහා වූ ප්‍රතිපත්ති පොලී අනුපාතයේ සැලකිය යුතු අඩු වීමයි. වසර තුළදී සම්පූර්ණයෙන් ලබාගත්, දැනට ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහනට මූල්‍යනය කිරීම සඳහා යොදාගත් දීර්ඝකාලීන ණය පහසුකම්වලට අදාළ වැඩි පොලී වියදම් හේතුවෙන් මූල්‍ය පිරිවැය අඩුවීම අර්ධ වශයෙන් හිලව් විය. මීට අමතරව, පොලී වියදම්වලින් සැලකිය යුතු කොටසක් ප්‍රතිසංස්කරණය කරන ලද කාමර සම්පූර්ණ කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද අතර, එබැවින්, ව්‍යාපෘතිය අතරතුර ලාභ හා අලාභ ප්‍රකාශනයේ එය සම්පූර්ණයෙන් පිළිබිඹු නොවීය.

## වටිනාකම් එකතු කළ ප්‍රකාශය

| විස්තරය | 2024 (රු. '000) | 2023 (රු. '000) |
|---|---|---|
| ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන දළ ආදායම | **5,967,394** | 4,808,636 |
| අඩු කරන්න: ගනුදෙනුකරුවන්ගෙන් එකතු කරන ලද සේවා ගාස්තු | **(521,435)** | (419,310) |
| අඩු කරන්න: සංචාරක සංවර්ධන බද්ද | **(52,870)** | (42,575) |
| **ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන ශුද්ධ ආදායම** | **5,393,089** | **4,346,751** |
| මූල්‍ය ආදායම් සඳහා ගැලපීම | **10,740** | 18,037 |
| වෙනත් ලාභ සහ අලාභ සඳහා ගැලපීම | **28,621** | 13,175 |
| එකතුව | **5,432,451** | 4,377,963 |
| අඩු කරන්න: බාහිර ප්‍රභවයන්ගෙන් මිල දී ගත් ද්‍රව්‍ය සහ සේවා පිරිවැය | **(2,812,687)** | (2,874,885) |
| **එකතු කළ වටිනාකම්** | **2,619,764** | **1,503,078** |

| වටිනාකම් එකතු කිරීම බෙදා හැරීම | 2024 (රු. '000) | ප්‍රතිශතය (%) | 2023 (රු. '000) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| සේවකයන්ට වේතන සහ සේවා ගාස්තු ලෙස | **1,262,418** | **48%** | 1,026,190 | 68% |
| රජයට බදු ලෙස | **756,873** | **29%** | 499,310 | 33% |
| ප්‍රාග්ධනය සපයන්නන්ට ණය සහ ණය ගැනීම් සඳහා පොලී ලෙස ව්‍යාපාරය තුළ රඳවා ගත් | **379,638** | **14%** | 299,097 | 20% |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය ලෙස | **560,672** | **21%** | 367,193 | 24% |
| සංචිත ලෙස | **(339,837)** | **-13%** | (688,712) | -46% |
| | **2,619,764** | **100%** | 1,503,078 | 100% |

## වත්කම් විශ්ලේෂණය - ප්‍රධාන කරුණු

ප්‍රාග්ධන ආයෝජන සහ වත්කම් ප්‍රශස්තකරණය මගින් මෙහෙයවනු ලැබ, 2024 දෙසැම්බර් 31 දින වන විට මුළු වත්කම් 4.2% කින් වැඩි වී රුපියල් බිලියන 21.43 ක් විය.

- දේපළ, පිරියත සහ උපකරණ (PPE) 24.0% කින් වර්ධනය වී රුපියල් බිලියන 14.32 ක් වූ අතර, එය අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු වත්කම් ප්‍රාග්ධනීකරණය පිළිබිඹු කරයි.
- නොනිමි ප්‍රාග්ධන වැඩ (CWIP) 94.8% කින් තියුනු ලෙස අඩු වී රුපියල් මිලියන 89 ක් වූ අතර, එය ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කරයි.
- ප්‍රාග්ධන වියදම් සහ ණය සේවාකරණය හේතුවෙන් මුදල් සහ බැංකු ශේෂයන් 62.4% කින් අඩු වී රුපියල් මිලියන 104 ක් විය.


# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

- සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල් 378.9% කින් ඉහළ ගොස් ඇති අතර, එයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ කොටස් හිමියන් සමඟ සිදු කළ ගනුදෙනු වලින් ලැබිය යුතු මුදල් ය.
- සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් පියවීම් හේතුවෙන් වෙනත් වත්කම් 60.7% කින් අඩු වී ඇත.

### වත්කම් සාරාංශය (රු.'000)

| වත්කම් කාණ්ඩය | 2024 | 2023 | වෙනස (%) |
|---|---|---|---|
| **ස්ථාවර වත්කම්** | **20,553,752** | 19,474,132 | +5.5% |
| - දේපළ, පිරියත සහ උපකරණ | **14,323,547** | 11,553,379 | +24.0% |
| - බදු ගිවිසුම්ගත ඉඩම් | **6,141,189** | 6,215,377 | -1.2% |
| - නොනිමි ප්‍රාග්ධන වැඩ | **89,016** | 1,705,375 | -94.8% |
| **ජංගම වත්කම්** | **872,837** | 1,092,826 | -20.1% |
| - මුදල් සහ බැංකු ශේෂයන් | **103,596** | 275,356 | -62.4% |
| - වෙනත් වත්කම් | **160,708** | 385,056 | -58.3% |
| - වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | **343,568** | 230,329 | +49.2% |
| - සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල | **88,407** | 42,820 | +106.5% |
| - තොග | **109,792** | 97,317 | +12.8% |
| - ජංගම මූල්‍ය වත්කම් | **66,766** | 61,947 | +7.8% |
| **මුළු වත්කම්** | **21,426,588** | 20,566,956 | +4.2% |

මුළු වත්කම් සහ කොටසක ශුද්ධ වත්කම් වටිනාකම




### හිමිකම් හා වගකීම් විශ්ලේෂණය


වසර අවසානය වන විට, සමස්ත හිමිකම් සහ වගකීම් 4.2% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 21.43 ක් වී ඇත. මෙය සමූහයේ මූල්‍ය සම්මිශ්‍රණය සහ ප්‍රාග්ධන ව්‍යුහයේ ගතිකත්වය පිළිබිඹු කරයි.

- කොටස් හිමියන්ගේ හිමිකම් 2.9% කින් අඩුවී රුපියල් බිලියන 11.92 ක් දක්වා පත්ව ඇත. මෙය ප්‍රධාන වශයෙන් වත්මන් වසරේ බදු පසු අලාභවල බලපෑම පිළිබිඹු කරයි.
- දිගුකාලීන ණය සම්පූර්ණයෙන් නිකුත් කිරීම හේතුවෙන් ස්ථාවර නොවන වගකීම් 7.6% කින් වර්ධනය වී රුපියල් බිලියන 5.05 ක් දක්වා ඉහළ ගොස් ඇත.
- වත්මන් වගකීම් 23.6% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 4.46 ක් වී ඇති අතර, එය පහත කරුණු පිළිබිඹු කරයි:
- ණය සඳහා වූ සහන කාලය අවසන් වීමත් සමඟ ආපසු ගෙවීමට නියමිත ණය කල්පිරීම් අපේක්ෂා කෙරේ.
- ව්‍යාපාරික කටයුතු වැඩිවීමට සමගාමීව වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල වර්ධනය.
- ආගන්තුක තැන්පතු සඳහා ආදායම ප්‍රමාද වී හඳුනාගැනීම හේතුවෙන් ඉහළ වගකීම් වාර්තා වීම.
- ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් අඩුවීම, සමූහය තුළ ණය පියවීම් වැඩිදියුණු වීම පෙන්නුම් කරයි.
- බැංකු අයිරාවන් වල සුළු අඩුවක් දක්නට ලැබුණු අතර, එය මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කරයි.

## කොටස් ප්‍රාග්ධනය සහ වගකීම් (රු. '000)

| කාණ්ඩය | 2024 | 2023 | වෙනස (%) |
|---|---|---|---|
| කොටස් හිමියන්ගේ කොටස් ප්‍රාග්ධනය | **11,915,256** | 12,266,894 | -2.9% |
| ජංගම නොවන වගකීම් | **5,048,606** | 4,690,679 | +7.6% |
| ජංගම වගකීම් | **4,462,726** | 3,609,382 | +23.6% |
| මුළු වගකීම් | **9,511,331** | 8,300,062 | +14.6% |
| මුළු කොටස් ප්‍රාග්ධනය සහ වගකීම් | **21,426,589** | 20,566,956 | +4.2% |

මූල්‍යකරණය




2024 මුල්‍ය වර්ෂයේදී සමාගමේ වත්කම් පදනම පුළුල් වීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම හා සම්බන්ධ දිගුකාලීන වත්කම් සඳහා අඛණ්ඩව සිදු කරන ලද උපායමාර්ගික ආයෝජන හේතුවෙන් සිදු විය. ජංගම වත්කම්, විශේෂයෙන්ම මුදල් ශේෂයන්හි අඩුවීම, ප්‍රාග්ධන සංවර්ධන මුලපිරීම් සහ අදාළ මූල්‍යකරණ වගකීම් සඳහා මුදල් ප්‍රවාහය අරමුණු සහිතව යෙදවීම පිළිබිඹු කරයි. කෙටිකාලීන වත්කම් අඩුවීමක් තිබියදීත්, සමාගම ශක්තිමත් වත්කම් තත්ත්වයක් පවත්වාගෙන යයි. එය දිගුකාලීනව අඛණ්ඩ වර්ධනයක් සඳහා සහාය වීමේ හැකියාව තහවුරු කරයි.

## ඉදිරි මාවත

අනාගතය දෙස බලන විට, සමාගම දිගුකාලීනව කොටස් හිමියන්ගේ වටිනාකම උපරිම කිරීම කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු කරමින්, මූල්‍ය ප්‍රාග්ධනය විචක්ෂණශීලීව වෙන් කිරීම සහ ප්‍රශස්තකරණය සඳහා කැපවී සිටී. උපායමාර්ගික ප්‍රාග්ධන වියදම්, ආගන්තුක අත්දැකීම් වැඩිදියුණු කරන, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවන, සහ ඉහළ ප්‍රතිලාභ ලබා දෙන වෙළඳපල කොටස් ඉලක්ක කර ගනිමින් ආදායම් මාර්ග පුළුල් කරන මුලපිරීම් වෙත යොමු කරනු ඇත. මෙම ප්‍රමුඛතා සඳහා සහාය වීම පිණිස, සමාගම ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමට සහ ප්‍රාග්ධනයේ බර තැබූ සාමාන්‍ය පිරිවැය අවම කිරීම අරමුණු කරගත් මූල්‍යකරණ උපාය මාර්ග අනුගමනය කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත. මෙම විනයගරුක මූල්‍ය කළමනාකරණ ප්‍රවේශය, වේගයෙන් වෙනස් වන ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහ මෙහෙයුම් නම්‍යශීලීත්වය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇත.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## නිපදවන ලද ප්‍රාග්ධනය

### අප විසින් පිරිනමනු ලබන දේ

හිල්ටන් කොළඹ හෝටලය සිය ලෝක මට්ටමේ පහසුකම් සහ ඉහළ ගුණාත්මක සේවා මගින් අමුත්තන්ට විශිෂ්ට අත්දැකීම් ලබා දීමට දිගටම කැපවී සිටී. කොළඹ නගර මධ්‍යයේ උපායමාර්ගිකව පිහිටා ඇති මෙම හෝටලය, නගරයේ ප්‍රධාන ව්‍යාපාරික කලාප සහ සංස්කෘතික සලකුණු වෙත අමුත්තන්ට පහසු ප්‍රවේශයක් සලසමින්, කලාපයේ ප්‍රමුඛ පෙළේ ආගන්තුක සත්කාර ගමනාන්තයක් ලෙස සිය ස්ථානය තහවුරු කරයි.

| | |
|---|---|
| නවාතැන් | අපගේ හෝටලයේ සුවපහසුව සහ සුඛෝපභෝගීත්වය වෙනුවෙන් නිර්මාණය කර ඇති මනා ලෙස සකස් කරන ලද කාමර 342ක් සහ සූට් කාමර 36ක් ඇත. අමුත්තන්ට විවිධ කාමර ප්‍රවර්ග අතරින් තෝරා ගත හැකි අතර ඒවාට ඩිලක්ස් කාමර (Deluxe Rooms), එක්සෙකියුටිව් කාමර (Executive Rooms), සූට් කාමර (Suites) සහ ප්‍රසිඩන්ෂල් සූට් (Presidential Suites) ඇතුළත් වේ. සෑම කාමරයක්ම නවීන පහසුකම් වලින් සමන්විත වන අතර, විවේකී රැඳී සිටීමක් සහතික කරයි. |
| ආහාරපාන | අපගේ හෝටලයේ විවිධ භෝජන අත්දැකීම් ලබා දෙන ආපනශාලා කිහිපයක් ඇත. අමුත්තන්ට අපගේ Curry Leaf, Graze Kitchen, සහ Emperor's Wok යන ආපනශාලාවලින් දේශීය සහ ජාත්‍යන්තර කෑම වර්ග රස විඳිය හැකිය. වඩාත් අවිධිමත් සැකසුමක් සඳහා, අපගේ Echelon Pub සහ Sunset Blu විසින් තෝරාගත් පාන වර්ග සහ සැහැල්ලු කෑම වර්ග සමඟින් ප්‍රසන්න වාතාවරණයක් සපයයි. |
| රැස්වීම් සහ උත්සව අවකාශයන් | හිල්ටන් කොළඹ, පුළුල් රැස්වීම් සහ උත්සව පහසුකම් වලින් සමන්විත වන අතර, එයට හමුවීම් ශාලා 26ක් සහ ග්‍රෑන්ඩ් බෝල්රූම් එකක් ඇතුළත් වේ. ආයතනික හමුවීම්වල සිට සමාජ උත්සව දක්වා විවිධ වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම සඳහා අපගේ ස්ථාන නවීනතම තාක්ෂණයෙන් සමන්විත වේ. |
| විනෝදාත්මක පහසුකම් | • අපගේ හෝටලයේ අමුත්තන්ට විවේක ගැනීමට අපගේ එළිමහන් පිහිනුම් තටාකය, ව්‍යායාම් මධ්‍යස්ථානය, සහ සම්පූර්ණ සම්බාහන සේවා ඇත. පවුල් සඳහා, අපි ළමා පිහිනුම් තටාකයක් සහ ක්‍රීඩා පිටියක් පිරිනමා ඇත. ක්‍රියාශීලී විනෝදාස්වාදය අපේක්ෂා කරන අයට, අපගේ හෝටලයේ සෝනා, වාෂ්ප කාමරය (steam room), සහ රැකට්බෝල්/ස්කොෂ් පිටි ද තිබේ.<br>• විධායක විවේකාගාරය (Executive Lounge) - මෙය විධායක කාමර (Executive Rooms) සහ සූට් කාමර (Suites) වල නවාතැන් ගන්නා අමුත්තන් සඳහා පමණක් වෙන් වූ සුවිශේෂී පහසුකමකි. |
| ස්ථානය | අපගේ හෝටලය, විනෝදාත්මක පහසුකම් සඳහා වෙන් කර ඇති අක්කර 1.8 ක ක්‍රීඩා මධ්‍යස්ථාන භූමිය ද ඇතුළුව, අක්කර 6.6 කට වැඩි භූමි ප්‍රදේශයක් පුරා විහිදී ඇත. |

කොළඹ හිල්ටන් හෝටලය ප්‍රධාන අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම සමරයි!

2024 නොවැම්බර් මාසයේදී, හිල්ටන් කොළඹ, අමුත්තන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීමට සහ උසස් ආගන්තුක සත්කාර ප්‍රමිතීන් පවත්වා ගැනීමට ඇති තම අඛණ්ඩ කැපවීම තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ඒ, අමුත්තන්ගේ කාමර 264ක් ප්‍රතිසංස්කරණය කිරීම සාර්ථකව අවසන් කිරීම මගිනි. මෙම මුලපිරීම, හිල්ටන් හි ගෝලීය සන්නාම ප්‍රමිතීන්ට අනුකූලව ලෝක මට්ටමේ සුවපහසුව සහ සුඛෝපභෝගීත්වය ලබා දීමට හෝටලයේ ඇති කැපවීම අවධාරණය කරයි.






මෙම ව්‍යාපෘතිය නිම කිරීමත් සමඟ, හෝටලයේ කාමර සංඛ්‍යාවෙන් 70% ක් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර ඇත. මෙහිදී නවීන සැලසුම් අංග, දියුණු කාමර තාක්ෂණය, සහ වැඩිදියුණු කළ පහසුකම් අන්තර්ගත වේ. මෙම

වැඩිදියුණු කිරීම් සැලසුම් කර ඇත්තේ, ව්‍යාපාරික සහ විවේකී සංචාරකයන් යන සියල්ලන්ගේම අවශ්‍යතා සපුරාලන, නවීන, සුවදායී පරිසරයක් ලබා දෙමින්, උසස් ආගන්තුක සත්කාර සේවයක් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට පමණක් නොව, ඒවා අභිබවා යාමටයි. අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද කාමරවල ඇතුළත් වන විශේෂාංගः

- නවීන අලංකාරය හිල්ටන් සන්නාම ප්‍රමිතීන් සමඟ මුසු වූ අභ්‍යන්තර මෝස්තර.
- ස්මාර්ට් කාමර පාලන, වැඩිදියුණු කළ ආලෝකකරණය, සහ ergonomic (ශරීරයට හිතකර) වැඩබිම්.
- අධිවේගී Wi-Fi සහ බහුමාධ්‍ය පෝට් සමඟ වැඩිදියුණු කළ සම්බන්ධතාව.
- ඉහළ මට්ටමේ සවිකිරීම් සහිත අලුත් කළ නාන කාමර.
- පරිසර හිතකාමී සැලසුම් අංග සහ බලශක්ති කාර්යක්ෂම පද්ධති.

ආගන්තුක සුවපහසුව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා වූ මෙම උපායමාර්ගික ආයෝජනය හේතුවෙන්, හෝටලයට කාමර 368කින් යුත් සම්පූර්ණ කාමර සංඛ්‍යාව සමඟින් ක්‍රියාත්මක වීමට හැකි වී ඇත. මෙය ධාරිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව යන දෙකම සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරයි. මෙම ප්‍රතිසංස්කරණ මුලපිරීම සමස්ත අමුත්තන්ගේ අත්දැකීම් ඉහළ නංවනවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ අගනුවර වඩාත්ම නවීන සහ ඉදිරිගාමී ආගන්තුක සත්කාර සපයන හෝටලයක් ලෙස හිල්ටන් කොළඹ හෝටලයේ ස්ථානය තහවුරු කරයි.

හෝටලය දිගටම දියුණු වන විට, හිල්ටන් කොළඹ හෝටලය නවෝත්පාදනය, තිරසාර භාවිතයන් සහ හිල්ටන් උණුසුම් ආගන්තුක සත්කාරයන් තුළින් උසස් අමුත්තන්ගේ අත්දැකීම් ලබා දීමට දැඩි ලෙස කැපවී සිටී.

## ආරක්ෂිත සහ සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම

හිල්ටන් කොළඹ හෝටලයේ දී, අපගේ අමුත්තන්ගේ, කණ්ඩායම් සාමාජිකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පවතී. හිල්ටන් හි ගෝලීය සන්නාම ප්‍රමිතීන්ට අනුකූලව, හෝටලය විසින් ආරක්ෂිත මෙහෙයුම් පරිසරයක් සහතික කිරීම අරමුණු කරගත් සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුරක්ෂිතතා ප්‍රොටෝකෝලවල පුළුල් රාමුවක් ක්‍රියාත්මක කර ඇත. මෙය හිල්ටන් සන්නාමය හා සම්බන්ධ විශිෂ්ට සේවාව පවත්වා ගනිමින් සිදු කෙරේ.

වාර්තාකරණ කාලය පුරාවට, අපි ඉලක්කගත පුහුණු වැඩසටහන්, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ දැඩිව පිළිපැදීම සහ අඛණ්ඩ මෙහෙයුම් සුපරීක්ෂාකාරීත්වය තුළින් අපගේ ආරක්ෂක යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කළෙමු. සිදු කරන ලද ප්‍රධාන ආරක්ෂක මුලපිරීම් අතරටः

- සියලුම කණ්ඩායම් සාමාජිකයින් සඳහා ගිනි ආරක්ෂාව සහ මූලික ගිනි නිවීමේ පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර ක්ෂණික සහ දැනුවත් ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් සහතික කිරීම සඳහා මෙය වැදගත් වේ. රසායනික ද්‍රව්‍ය ආරක්ෂාව, "ලොක් අවුට් ටැග් අවුට්" (Lock out tag out) පුහුණුව, ස්ථාන පාදක පුහුණුව සහ උසකදී වැඩ කිරීමේ පුහුණුව වාර්ෂිකව පවත්වනු ලැබේ.
- දෙපාර්තමේන්තු හරහා සූදානම සහ ක්‍රියා පටිපාටිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නිත්‍ය හදිසි ඉවත් කිරීමේ අභ්‍යාස පවත්වනු ලැබේ. මේ අනුව, අපි වාර්ෂිකව දෙවරක් (පළමු සහ තෙවැනි කාර්තු වලදී) ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව සමඟ දේශීය රෙගුලාසිවලට අනුකූලව සම්පූර්ණ ඉවත් කිරීමේ අභ්‍යාස සිදු කරන අතර, දෙවරක් (දෙවැනි සහ හතරවැනි කාර්තු වලදී) රාත්‍රී අභ්‍යාස පවත්වයි.
- අමුත්තන් සඳහා ආරක්ෂිත විනෝදාත්මක පරිසරයක් තහවුරු කරමින්, සියලුම පිහිනුම් තටාක සහායකයින් සඳහා ජීවිතාරක්ෂක සහතික කිරීම් සහ නැවත පුහුණුව ලබා දේ.
- මෙහෙයුම් අවදානම අවම කිරීම සහ සේවා ස්ථාන ආරක්ෂාව සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනික ද්‍රව්‍ය හැසිරවීමේ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම දැඩිව ක්‍රියාත්මක කිරීම.
- ISO 22000:2018 සහ Hazard Analysis and Critical Control Point (HACCP) ප්‍රමිතීන්ට අනුකූලව, සියලුම ආහාර සහ පාන අලෙවිසැල් හරහා ආහාර ආරක්ෂාව සහ සනීපාරක්ෂක ප්‍රොටෝකෝල දැඩිව ක්‍රියාත්මක කිරීම. මෙයට හිල්ටන් හි HACCP අත්පොතෙහි දක්වා ඇති පුළුල් පුහුණුවීම්, මඟපෙන්වීම්, සහ ක්‍රියා පටිපාටි ඇතුළත් වන අතර, එය EMEA සහ APAC කලාප තුළ ක්‍රියාත්මක වේ.
- හිල්ටන් කොළඹ හෝටලය ශක්තිමත් ජල ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. පානීය ජලය, පිහිනුම් තටාක ජලය, සිසිලන කුළුණු ජලය, අමුත්තන්ගේ කාමර ජලය සහ ආහාර සැකසුම් ජලය නිතිපතා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක හා රසායනික විශ්ලේෂණයන්ට ලක් කිරීම මෙයට ඇතුළත් වේ. මෙම පරීක්ෂණ ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා පිළිගත් රසායනාගාර මඟින් සිදු කෙරේ.

මෙම ක්‍රියාමාර්ග, අවදානම් අවම කිරීම, නියාමන අනුකූලතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා අපගේ අඛණ්ඩ ප්‍රයත්නයන්හි කේන්ද්‍රීය වේ. ආරක්ෂිත සහ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති පරිසරයක් පවත්වා ගැනීමට අපගේ කැපවීම, අපගේ අමුත්තන් සහ හවුල්කරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසයට අත්‍යවශ්‍ය වන අතර, අපගේ දිගුකාලීන තිරසාරභාවය සහ සේවා සහතික කිරීමේ අරමුණු සඳහා මූලික පදනමක් සාදයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## ස්වභාවික ප්‍රාග්ධනය

### පාරිසරික තිරසාරත්වය සහ දේශගුණික ක්‍රියාකාරකම්

හිල්ටන් කොළඹ හෝටලය ලෙස, පාරිසරික කළමනාකරණ මූලධර්ම අපගේ මෙහෙයුම්වලට ගැඹුරින් කාවැදී ඇත. හිල්ටන් හි ගෝලීය "Travel with Purpose" (අරමුණක් සහිතව සංචාරය කිරීම) උපායමාර්ගයේ කොටසක් ලෙස, අපි ස්වභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීමට සහ සංරක්ෂණය කිරීමට, අපගේ පාරිසරික පියසටහන අඩු කිරීමට, සහ ශුද්ධ-ශුන්‍ය ආර්ථිකයක් (net-zero economy) කරා සංක්‍රමණය වීමට කැපවී සිටිමු. 2024 වසරේදී, අපගේ ප්‍රයත්නයන් දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, අපද්‍රව්‍ය අවම කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව, ජල සංරක්ෂණය, සහ පාරිසරික දැනුවත්භාවය වටා පුළුල් ප්‍රජා සම්බන්ධතා කෙරෙහි අවධානය යොමු කරන ලදී.

අපගේ පාරිසරික මුලපිරීම් සැලසුම් කර ඇත්තේ හිල්ටන් හි ගෝලීය ESG ඉලක්ක සපුරාලීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ ජාතික තිරසාරත්ව ප්‍රමුඛතා සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ සමපාත වීමටයි. පරිසර හිතකාමී තාක්ෂණයන්, හරිත භාවිතයන්, සහ චක්‍රීය ආර්ථික ආකෘති සඳහා ආයෝජනය කිරීමෙන්, හිල්ටන් කොළඹ හෝටලය, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ පාරිසරික වගකීම එකට පැවතිය හැකි බව "සහ පැවතිය යුතු බව" නිරන්තරයෙන් ඔප්පු කරයි.

### 2024 වසරේ ප්‍රධාන පාරිසරික අවධානය යොමු කළ ක්ෂේත්‍ර

1. බලශක්ති කාර්යක්ෂමතාව සහ දේශගුණික ක්‍රියාකාරකම්

කොළඹ හිල්ටන් හෝටලය, දේශගුණික විද්‍යාවට අනුකූලව, 2030 වන විට Scope 1 සහ 2 කාබන් තීව්‍රතාව 61% කින් අඩු කිරීමේ හිල්ටන් හි ගෝලීය දේශගුණික ඉලක්ක සමඟ අඛණ්ඩව කටයුතු කරයි. 2024 වසරේදී:

- විදුලිය සහ තාප ශක්ති භාවිතය අවම කිරීම සඳහා අපි දැඩි බලශක්ති අධීක්ෂණ පද්ධති ක්‍රියාත්මක කර මෙහෙයුම් ප්‍රශස්තකරණය කළෙමු.
- අභ්‍යන්තර දැනුවත් කිරීමේ ව්‍යාපාර හරහා කණ්ඩායම් සාමාජිකයින් අතර බලශක්ති සංරක්ෂණ භාවිතයන් ප්‍රවර්ධනය කළෙමු.

බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණය, ගොඩනැගිලි කළමනාකරණය සහ ස්මාර්ට් HVAC පද්ධති අඛණ්ඩව ඒකාබද්ධ කිරීම විමෝචනය සහ උපයෝගිතා පිරිවැය අඩු කිරීමට දායක විය.

2. අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය

2030 වන විට අපද්‍රව්‍ය ප්‍රමාණය 50% කින් අඩු කිරීමේ හිල්ටන් හි ගෝලීය ඉලක්කයට අනුකූලව, හිල්ටන් කොළඹ හෝටලය චක්‍රීය අපද්‍රව්‍ය ආර්ථිකයක් සක්‍රීයව අනුගමනය කරයි. ඒ සඳහා සිදු කළ ක්‍රියාකාරකම්:

- "කසළ බඳුනෙන් තොර දිනය" මුලපිරීම ("No Bin Day" Initiative): කසළ බඳුන්වලට අපද්‍රව්‍ය දැමීමෙන් තොර දිනයක් ක්‍රියාත්මක කිරීම. මෙය පාරිසරික දැනුවත්භාවය, අපද්‍රව්‍ය වෙන් කිරීම සහ ආහාර අපද්‍රව්‍ය අවම කිරීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනී.










- සබන් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය (Soap Recycling Project): හිල්ටන් කොළඹ රෙසිඩන්සස් සමඟ සහයෝගයෙන්, අමුත්තන්ගේ කාමරවලින් අර්ධ වශයෙන් භාවිතා කරන ලද සබන් කැබලි ප්‍රතිචක්‍රීකරණය සඳහා එකතු කිරීම.

- වෙරළ පිරිසිදු කිරීමේ ව්‍යාපාරය (Beach Cleanup Campaign)ඃ "සීරෝ ප්ලාස්ටික් ව්‍යාපාරය" (Zero Plastic Movement) සමඟ එක්ව, හිල්ටන් ගෝලීය පදනමේ (Hilton Global Foundation) ඩොලර් 1,000ක ක්‍රියාකාරී ප්‍රදානයක සහාය ඇතිව මෙම ව්‍යාපාරය පැවැත්විණි. පොරුතොට මෝය වෙරළ තීරයේ පැවති මෙම පිරිසිදු කිරීමෙන් සැලකිය යුතු ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණයක් ඉවත් කරන ලද අතර, දිගුකාලීන විසඳුමක් ලෙස PET බෝතල් එකතු කිරීමේ බඳුනක් ද ස්ථාපනය කරන ලදී.







- ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍යඃ එකතු කරන ලද ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය, චක්‍රීය භාවිතයන් තුළ ප්‍රජා සහයෝගීතාව ප්‍රවර්ධනය කරමින්, ප්‍රතිචක්‍රීකරණය සඳහා මහ නගර සභාව වෙත වගකීමෙන් යුතුව භාර දෙන ලදී.

**3. ජල සංරක්ෂණය**

2030 වන විට ජල භාවිතයේ තීව්‍රතාවය 50% කින් අඩු කිරීමේ හිල්ටන් හි ඉලක්කය හිල්ටන් කොළඹ අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. 2024 වසරේදීඃ

- අමුත්තන්ගේ කාමර සහ කාර්ය මණ්ඩල ප්‍රදේශ පුරා ජලය ඉතිරි කරන සවිකිරීම් නඩත්තු කරන ලදී.
- ලෝක ජල දිනය නිමිත්තෙන් අභ්‍යන්තර සන්නිවේදනයන් (පත්‍රිකා සහ අධ්‍යාපනික වීඩියෝ මගින්) හරහා දැනුවත්භාවය ගොඩනගා ඇත.
- ගංවතුරෙන් පීඩාවට පත් ප්‍රජාවන් තුළ විභව සක්‍රිය කිරීම සඳහා හිල්ටන් හි ගෝලීය ප්‍රජා ජල ඔරොත්තු දීමේ වැඩසටහනට සහභාගී වීම ඇගයීමට ලක් කෙරේ.

## පාරිසරික දැනුවත්භාවය සහ ප්‍රජා සහභාගීත්වය (Environmental Awareness & Community Engagement)

**2024 ලෝක පෘථිවි සතිය (World Earth Week 2024)**

හිල්ටන් කොළඹ, පාරිසරික සාක්ෂරතාවය සහ තිරසාර ජීවන රටාව පෝෂණය කිරීම අරමුණු කරගත්, අන්තර්-සම්බන්ධිත දැනුවත් කිරීමේ සහ ක්‍රියාකාරී වැඩසටහන් මාලාවක් සමඟින් ලෝක පෘථිවි සතිය සමරනු ලැබීයඃ

- "THURU" සමඟ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ වැඩමුළුවඃ මෙම වැඩමුළුව මගින් අපද්‍රව්‍ය කළමනාකරණය, ගෙවතු වගාව, දේශගුණික විපර්යාස අවම කිරීම, සහ සමාජ ව්‍යවසායකත්වය වැනි මාතෘකා ආවරණය කරන ලදී.
- හෝටල් පරිශ්‍රයේ ඖෂධ පැළෑටි වත්තක් ක්‍රියාත්මක කිරීමඃ මෙය "Travel with Purpose" යටතේ හිල්ටන් හි "Pledge 01" සමඟ සමපාත වන, තිරසාරත්වය කේන්ද්‍ර කරගත් සූපශාස්ත්‍ර මුලපිරීමකි.
- CIC සමඟ හවුල්කාරී සැසියක්ඃ නාගරික නිවාස සඳහා නවීන පොහොර තාක්ෂණය සහ තිරසාර ගෙවතු වගාව පිළිබඳව මෙම සැසිය අවධානය යොමු කරන ලදී.
- ස්ථාන පාදක සැසිඃ කාබන් පියසටහන අඩු කිරීම, තිරසාර ප්‍රසම්පාදනය, බලශක්ති සංරක්ෂණය, සහ හරිත කාර්යාල හොඳම භාවිතයන් පිළිබඳව මෙම සැසිවලදී සාකච්ඡා කෙරිණි.

## ලෝක පෘථිවි පැය (World Earth Hour)

පාරිසරික කැපවීමේ සංකේතාත්මක අභිනයක් ලෙස, හෝටලය අත්‍යවශ්‍ය නොවන විදුලි පහන් නිවා දමා, හෝටලය පුරා අධ්‍යාපනික පෝස්ටර් සහ වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කළේය. මෙම මුලපිරීම සංරක්ෂණය සහ වගකීම පිළිබඳ අපගේ අභ්‍යන්තර සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කළේය.

## විශේෂ ඇගයීම් සහ සම්මාන (Special Recognition & Awards)

**1. හිල්ටන් ගෝලීය පදනමේ ක්‍රියාකාරී ප්‍රදානය (Hilton Global Foundation Action Grant)**

හිල්ටන් කොළඹ හෝටලයට, "Travel With Purpose Week" (අරමුණක් සහිතව සංචාරය කිරීමේ සතිය) ස්වේච්ඡා ක්‍රියාකාරකම් අගය කරමින් හිල්ටන් ගෝලීය පදනමෙන් ඩොලර් 1,000ක ක්‍රියාකාරී ප්‍රදානයක් හිමි විය. මෙම අරමුදල්, සාර්ථක වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුමට සහ දිගුකාලීන ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීමේ ප්‍රයත්නයන්ට සහාය විය.

**2. තිරසාරත්ව සම්මානය - පළමු ස්ථානය (Sustainability Award - First Place)**

ෆ්‍රෙඩ්රික් නෝමන් පදනම (ජර්මනිය) විසින් පිරිනමන ලද 2024 තිරසාරත්ව සම්මාන උළෙලේ "හෝටල් සහ නවාතැන් සේවා සපයන්නන් - මහා පරිමාණ ව්‍යාපාර" (Hotel and Accommodatμon Service Providers - Large Enterprise) කාණ්ඩය යටතේ හිල්ටන් කොළඹ හෝටලය පළමු ස්ථානය දිනා ගන්නා ලදී. මෙම සම්මානය, තිරසාර භාවිතයන්, නවෝත්පාදනය, සහ දිගුකාලීන පාරිසරික කැපවීම සම්බන්ධයෙන් අපගේ කර්මාන්ත නායකත්වය පිළිගැනීමකි.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

### උපායමාර්ගික බලපෑම සහ අනාගත දැක්ම

හිල්ටන් කොළඹ හෝටලයේ පාරිසරික තිරසාරත්ව උපායමාර්ගය, අපගේ ආයතනික අවදානම් කළමනාකරණයේ සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණයේ තීරණාත්මක කොටසකි. අපගේ වැඩසටහන්, පාරිසරික අවදානම් අවම කිරීමට, මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීමට, සහ දේශගුණයට අදාළ බාධාවන්ට එරෙහිව ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට සෘජුවම දායක වේ.
2025 වසර සඳහා ඉදිරිය දෙස බලන විට, අපගේ අරමුණු වන්නේ:

- හෝටල් මෙහෙයුම් පුරා පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම පුළුල් කිරීම.
- ස්මාර්ට් ජල මීටර් සහ වැසි ජල අස්වනු නෙළීමේ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- හිල්ටන් හි චක්‍රීය නිෂ්පාදන උපායමාර්ගයට අනුකූලව ප්ලාස්ටික් රහිත කාමර පහසුකම් හඳුන්වා දීම.
- විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා අනාගත තිරසාරත්ව වාර්තා වල මැනිය හැකි පාරිසරික කාර්ය සාධන දර්ශක ප්‍රකාශයට පත් කිරීම.

### නිගමනය

ස්වභාවික ප්‍රාග්ධනය පිළිබඳ අපගේ කළමනාකරණයෙන් පිළිබිඹු වන්නේ, සුඛෝපභෝගී ආගන්තුක සත්කාරය සහ පාරිසරික තිරසාරත්වය එකිනෙකට පටහැනි අරමුණු නොව, එකිනෙකට අනුපූරක වන කැපවීම් බවයි. කොළඹ හිල්ටන් හෝටලය, ආදර්ශයෙන් පෙරට යාමට සහ අප සියල්ලන්ම රඳා පවතින ස්වභාවික ලෝකය පෝෂණය කරමින් හා ගරු කරමින් කටයුතු කිරීමට ඇති තම වගකීමෙහි ස්ථිරව පිහිටා සිටී.

## සමාජ ප්‍රාග්ධනය

### ප්‍රජා සහභාගීත්වය - Travel With Purpose 2024

කොළඹ හිල්ටන් හෝටලය ලෙස, අපගේ තිරසාර හා සමාජයට සමගාමී වර්ධනය සඳහා වූ කැපවීම හෝටල් මෙහෙයුම්වල සීමාවෙන් ඔබ්බට විහිදේ. හිල්ටන් හි ගෝලීය "Travel With Purpose" (අරමුණක් සහිතව සංචාරය කිරීම) මුලපිරීමට අනුකූලව, අපගේ ප්‍රජා සහභාගීත්ව උපායමාර්ගය, අපගේ ESG රාමුවේ ප්‍රධාන අංගයක් වේ. 2024 වසර අපගේ ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම්වල සැලකිය යුතු ව්‍යාප්තියක් සනිටුහන් කළ අතර, එය ප්‍රාදේශීය ප්‍රජාව සමඟ අපගේ පවතින සම්බන්ධතාවය සහ සමාජ සාධාරණත්වය හා අවස්ථා පෝෂණය කිරීම සඳහා අපගේ ගැඹුරු කැපවීම යන දෙකම පිළිබිඹු කරයි.

ශ්‍රී ලංකාවේ දශක තුනකට වැඩි කාලයක් මෙහෙයවන හිල්ටන් කොළඹ, තම දීර්ඝකාලීන සාර්ථකත්වය එයට සහාය වන ප්‍රජාවේ යහපැවැත්මෙන් වෙන් කළ නොහැකි බව පිළිගනී. අපගේ "Blue Energy Community Team" (බ්ලූ එනර්ජි ප්‍රජා කණ්ඩායම), හෝටල් කණ්ඩායම් සාමාජිකයින්ගෙන් සම්පූර්ණයෙන්ම සමන්විත වන අතර, ඔවුන්ගේ කාලය හා කුසලතා ස්වේච්ඡාවෙන් ලබා දෙමින්, වසර පුරා බලගතු මුලපිරීම් මාලාවක් ක්‍රියාත්මක කිරීමට උපකාරී වී ඇත. මෙම ව්‍යාපෘති අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ආපදා සහන, ආබාධිත සහාය, තරුණ සවිබල ගැන්වීම, සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරයි.

### 2024 වසරේ ප්‍රධාන ප්‍රජා මුලපිරීම්

**අධ්‍යාපනය සහ තරුණ සවිබල ගැන්වීම**

1. **පාසල් ප්‍රතිසංස්කරණය - පුත්තලම දිස්ත්‍රික්කය**
   ප්‍රාදේශීය අධ්‍යාපන බලධාරීන් සමඟ එක්ව, අපගේ ඉංජිනේරු කණ්ඩායම ග්‍රාමීය පාසල් ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමට නායකත්වය දුන්නේය. මෙය සිසුන් සඳහා යටිතල පහසුකම් සහ ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීමට හේතු විය. භෞතික ඉගෙනුම් පරිසරයන් සහ අධ්‍යාපනික මෙවලම් යන දෙකම කෙරෙහි අපගේ ද්විත්ව අවධානය අවධාරණය කරමින් ලිපි ද්‍රව්‍ය සැපයුම් ද බෙදා හරින ලදී.
2. **හෝටල් හඳුන්වාදීම - ගල්පොරුයාය පාසල (දුෂ්කර ප්‍රදේශය)**










   අපගේ ආගන්තුක සත්කාර කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාරයේ කොටසක් ලෙස, ග්‍රාමීය සිසුන් පිරිසක් හිල්ටන් කොළඹ හෝටලයට පැමිණ, ගැඹුරු ඉගෙනුම් චාරිකාවකට සහභාගී වූහ. ඔවුන් හෝටල් මෙහෙයුම් ගවේෂණය කළ අතර, ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පවතින වෘත්තීය මාර්ග වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සමඟ එක්ව කටයුතු කළහ. මෙම පියවර ග්‍රාමීය-නාගරික අවස්ථා පරතරය අඩු කිරීමට සහ දිගුකාලීන අපේක්ෂාවන් දිරිමත් කිරීමට උත්සාහ කළේය.
3. **"අපි ඔබට සවන් දෙමු" - ශ්‍රවණාබාධිත තරුණයින් සමඟ සම්බන්ධ වීම**
   රත්මලාන බිහිරි සහ අන්ධ විද්‍යාලයේ සිසුන් සඳහා හඳුන්වාදීමේ සැසියක් සංවිධානය කරන ලදී. මෙය ඔවුන්ට හෝටල් ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා දීමට සහ සේවා ස්ථානයේ සමානාත්මතාවය පෝෂණය කිරීමට උපකාරී විය. ආගන්තුක සත්කාර කර්මාන්තය පිළිබඳ ඍජු අත්දැකීමක් ලබා දීමෙන්, අපි නව කුසලතා සහ හැකියාවන් සඳහා දොරටු විවර කරන්නෙමු. මෙම සැසිය ඉගෙනීම පමණක් නොව; එය විශ්වාසය ගොඩනැගීම, ස්වාධීනත්වය පෝෂණය කිරීම සහ සිහින දිරිමත් කිරීම පිළිබඳවයි.
4. **ශ්‍රවණාබාධිත පුහුණුකරුවන් සඳහා කේක් අලංකරණ වැඩමුළුව**
   මෙම ප්‍රායෝගික වැඩමුළුව මගින් සහභාගිවන්නන්ට කේක් අලංකරණය පිළිබඳ නිර්මාණාත්මක කුසලතා ලබා දීම අරමුණු කරයි. එමගින් ඔවුන්ගේ විශ්වාසය වැඩි දියුණු කරන අතර, ස්වයං ප්‍රකාශනය සහ වෘත්තීය වර්ධනය සඳහා නව අවස්ථා විවර කරයි. දෘශ්‍ය මාර්ගෝපදේශ සහ පියවරෙන් පියවර උපදෙස් සමගින්, අපි ඔවුන්ගේ අද්විතීය කුසලතා සමරන, සමානාත්මතාවයෙන් පිරි, ආකර්ශනීය අත්දැකීමක් නිර්මාණය කිරීමට උත්සාහ කරමු. එක් එක් පුහුණුකරුගේ අලංකාර, තමුන්ටම ආවේණික නිර්මාණ දැකීමටත්, සූපශාස්ත්‍ර කලාව තුළ ඔවුන්ගේ ගමනට සහාය වීමටත් අපි බලා සිටිමු.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

**සෞඛ්‍ය සේවා සහ ආබාධිත සහාය**

1. **සෑම හුස්මකම බලාපොරොත්තුව - අපේක්ෂා ළමා පිළිකා රෝහල:**



වසරේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ අපේක්ෂා රෝහලේ ළමා ඒකකයට අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ සහ ඖෂධ පරිත්‍යාග කිරීමයි. මෙම දායකත්වය රෝග විනිශ්චය ධාරිතාව සහ ප්‍රතිකාර ලබාදීම වැඩි දියුණු කළ අතර, රෝගීන්ගේ ප්‍රතිඵල වැඩිදියුණු කරමින් සහ පීඩාවට පත් පවුල්වල මූල්‍ය පීඩනය ලිහිල් කළේය.

2. **සිනහවක් අඳිමු - ළමා රෝගීන් සඳහා විශේෂ දිවා ආහාරය:**

අපේක්ෂා පිළිකා රෝහලේ ළමා වාට්ටුවේ ජීවිතය වෙනුවෙන් සටන් කරන ළමුන් 25 දෙනෙකු සඳහා විශේෂ දිවා ආහාරය සංවිධානය කිරීම. අපගේ විශේෂ දිවා ආහාරය අපේක්ෂා රෝහලේ පිළිකා සමඟ සටන් කරන ධෛර්ය සම්පන්න ළමුන් 25 දෙනෙකුගේ ජීවිතවලට සතුට හා උණුසුම ගෙන ඒම අරමුණු කරයි. සිනහවෙන්, රසවත් ආහාරවලින් සහ ආකර්ශනීය ක්‍රියාකාරකම්වලින් පිරුණු පෝෂණීය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් මෙය සිදු කෙරේ. මෙම පියවර මගින් සතුට බෙදාගැනීම, විනෝදාස්වාදය සහ පුද්ගල අන්තර් සබඳතා තුළින් චිත්තවේගීය උද්යෝගයක් ඇති කළේය.



3. **ප්‍රීතිපුර නිවාසයට සහයෝගය:**

ශාරීරික හා මානසික ආබාධ සහිත දරුවන් සහ වැඩිහිටියන් සඳහා ආධාර කිරීම පිණිස ගෘහස්ථ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය, සෙල්ලම් බඩු සහ පෝෂණ සැපයුම් පරිත්‍යාග කරන ලදී. මෙම පියවර සියලු දෙනා සඳහා සමානාත්මතාවය සහ අභිමානය පිළිබඳ අපගේ පුළුල් විශ්වාසය පිළිබිඹු කරයි.

4. **ඩවුන් සින්ඩ්‍රෝම් නිවාස ආහාර පරිත්‍යාගය:**

අපගේ කණ්ඩායම ප්‍රාදේශීය ඩවුන් සින්ඩ්‍රෝම් සත්කාරක මධ්‍යස්ථානයක් වෙත ගොස් ආහාර වේල් ලබා දුන්නේය. මෙය ප්‍රජා පෝෂණ වැඩසටහන්වල දයාව සහ අඛණ්ඩතාව විදහා දක්වයි.

**ආපදා සහන සහ මූලික අවශ්‍යතා (Disaster Relief and Basic Needs)**

1. අවශ්‍යතා ඇති අයට ආහාර - ගංවතුර ආපදා සහන (කොලොන්නාව සහ ගම්පහ): 2024 මුල් භාගයේ ඇති වූ දරුණු ගංවතුරට ප්‍රතිචාර වශයෙන්, අතහැර දැමූ පවුල් සඳහා දින දෙකක් පුරා පිසූ ආහාර බෙදා හරින ලදී. මෙම ක්‍රියාකාරකම්, අර්බුදකාරී අවස්ථාවන්හිදී ක්‍රියාත්මක වීමට අප සතුව ඇති සූදානම සහ බිම් මට්ටමින් ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට දායකත්වය අවධාරණය කරයි.









2. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇසුරුම් - ඉදිරි කාර්යාල CSR මෙහෙයුම: අපගේ ඉදිරි කාර්යාල කණ්ඩායමේ කැපවීම මත පදනම් වූ පියවරක් ලෙස, අපහසුතා ඇති පවුල් 10ක් සඳහා ආහාර සහ දෛනික භාවිතයට ගන්නා ද්‍රව්‍ය ඇතුළත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇසුරුම් බෙදා හරින ලදී. මෙම අත්‍යවශ්‍ය ඇසුරුම්, යමෙකුගේ ජීවිතයේ සැලකිය යුතු වෙනසක් ඇති කළ හැකි, ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සමඟ උදැසන ආහාර වේලක් ඇතුළත් වන පරිදි ප්‍රවේශමෙන් සකස් කර ඇත.

**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම**

1. **කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය -**

කොලොන්නාව: අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්හි කාන්තාවන්ට ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වෘත්තීය මාර්ග පිළිබඳව දැනුවත් කිරීම සඳහා ඉලක්කගත සැසියක් පවත්වන ලදී. මෙම පියවර ආර්ථික සහභාගීත්වය ඉහළ නැංවීම, ප්‍රායෝගික මඟ පෙන්වීම ලබා දීම, සහ අඩු නියෝජනයක් ඇති කාන්තාවන් අතර නිපුණතා සංවර්ධනයට සහාය වීම අරමුණු කර ගත්තේය.

**සෘතුමය සහ සංස්කෘතික සහභාගීත්වය (Seasonal and Cultural Engagement)**

1. වාර්ෂික නත්තල් ගස ආලෝකමත් කිරීම - විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සමඟ සැමරීම: අපගේ වාර්ෂික නත්තල් ගස ආලෝකමත් කිරීමේ උත්සවයට විශේෂ අවශ්‍යතා ඇති දරුවන් 22 දෙනෙකුට සත්කාරකත්වය ලබා දුන් අතර, ඒ තුළින් සමානාත්මතාවයේ සහ බෙදාගැනීමේ හැඟීම සමරන ලදී.

උපායමාර්ගික බලපෑම සහ හිල්ටන් හි ගෝලීය ESG ඉලක්ක සමඟ ගැළපීම
මෙම පියවර, කොළඹ හිල්ටන් හෝටලය, හිල්ටන් හි 2030 "Travel with Purpose" ඉලක්ක සමඟ උපායමාර්ගිකව ගැළපීම පිළිබිඹු කරයි. ඒවාට ඇතුළත් වන්නේ:

- සමාජ බලපෑම් ව්‍යාපෘති සඳහා ආයෝජනය දෙගුණ කිරීම.
- අඩු නියෝජනයක් ඇති කණ්ඩායම් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- ඉලක්කගත අධ්‍යාපනය සහ පුහුණුව තුළින් සමාජ අසමානතා අඩු කිරීම.

අභ්‍යන්තර ස්වේච්ඡා ජාල බලමුලු ගැන්වීමෙන් සහ ප්‍රාදේශීය ආයතන සමඟ හවුල් වීමෙන්, අපි වගකිවයුතු ආයතනික පුරවැසියන් ලෙස අපගේ භූමිකාව ශක්තිමත් කර ඇත්තෙමු. මෙම ප්‍රයත්නයන් සන්නාම අගය ඉහළ නංවයි, ප්‍රජා විශ්වාසය ගොඩනඟයි, සහ සංවේදනය, සේවය, සහ හවුල් අරමුණ මත කේන්ද්‍රගත වූ ධනාත්මක සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කරයි.

## ඉදිරි දැක්ම

අපි සංකීර්ණ ආර්ථික හා සමාජීය තත්ත්වයන් හරහා ගමන් කරන විට, සමාජ ප්‍රාග්ධනය සඳහා අපගේ කැපවීම නොසැලී පවතී. 2025 වසරේදී, අපගේ ප්‍රජා සත්කාරක ප්‍රයත්නයන් පුළුල් කිරීමට, ගණනය කළ හැකි බලපෑම් වාර්තාකරණය හඳුන්වා දීමට, සහ දිගුකාලීන, ගණනය කළ හැකි වෙනසක් සහතික කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ රජයේ ආයතන සමඟ සහයෝගීතාවය වැඩිදියුණු කිරීමට අපි සැලසුම් කරමු.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## බුද්ධිමය ප්‍රාග්ධනය

කොළඹ හිල්ටන් හෝටලයේ වටිනාකම් නිර්මාණ රාමුවේ ප්‍රධාන අංගයක් ලෙස, බුද්ධිමය ප්‍රාග්ධනය ප්‍රධාන වශයෙන් අදහස් කරන්නේ ලොව පුරා කීර්තිමත් සහ ගෞරවනීය ආගන්තුක සත්කාර සන්නාමයක් වන හිල්ටන් වර්ල්ඩ්වයිඩ් සමඟ ඇති සම්බන්ධතාවයෙන් ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම්වල උපායමාර්ගික භාවිතයයි. කොළඹ හිල්ටන් හෝටලය, හිල්ටන් වර්ල්ඩ්වයිඩ් විසින් සපයනු ලබන සන්නාම ප්‍රමිතීන්, ගෝලීය අලෙවිකරණ වේදිකා, උසස් තාක්ෂණික පද්ධති, හොඳම මෙහෙයුම් භාවිතයන් සහ දක්ෂතා සංවර්ධන රාමු ආකාරයෙන් මෙම බුද්ධිමය ප්‍රාග්ධනය සක්‍රියව උපයෝගී කර ගනී. මෙම සම්පත්, උපායමාර්ගික ස්ථානගත කිරීම වැඩිදියුණු කිරීමට, සන්නාම අගය ශක්තිමත් කිරීමට, මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමට සහ කොටස් හිමියන්ට දිගුකාලීන වටිනාකමක් ලබා දීමට අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

## ගෝලීය සන්නාම සම්බන්ධතාව සහ වෙළඳපල ස්ථානගත කිරීම

කොළඹ හිල්ටන් හෝටලය, හිල්ටන් සන්නාමයේ ප්‍රබල ගෝලීය අගයෙන් ප්‍රතිලාභ ලබයි. එය පාරිභෝගික විශ්වාසය, වෙළඳපල වෙනස්කම්කරණය සහ ඉහළ මිල නියම කිරීමේ හැකියාව සඳහා වැදගත් මෙහෙයුම් බලවේගයක් ලෙස අඛණ්ඩව පවතී. මෙම ජාත්‍යන්තර සන්නාම සම්බන්ධතාවය, ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය තුළ හිල්ටන් කොළඹ හි තරඟකාරී ස්ථානගත කිරීම තහවුරු කරමින්, ප්‍රධාන ව්‍යාපාරික සහ විවේකී අංශ හරහා හෝටලයේ ආකර්ෂණය වැඩි දියුණු කරයි.

## මෙහෙයුම් පද්ධති සහ ප්‍රමිතීන්

කොළඹ හිල්ටන් හෝටලයේ මෙහෙයුම් විශිෂ්ටත්වයට ප්‍රමිතිගත ගෝලීය රාමු සහ හිල්ටන් හි හිමිකාරිත්ව මෙහෙයුම් ක්‍රියා පටිපාටි මගින් සහාය ලැබේ. මෙම පද්ධති මගින් අමුත්තන්ගේ සේවා ලබාදීම, නියාමන අනුකූලතාව, තත්ත්ව පාලනය සහ ආරක්ෂාව යන අංශවල අනුකූලතාව සහතික කරන අතර, ඒවා සමස්තයක් ලෙස සියලු ක්‍රියාකාරී අංශ හරහා මෙහෙයුම් විනය සහ ක්‍රියාවලි ප්‍රශස්තකරණයට හේතු වේ.

## මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ දැනුම හුවමාරුව

දක්ෂතා සංවර්ධනය, කොළඹ හිල්ටන් හෝටලයේ බුද්ධිමය ප්‍රාග්ධනයේ ප්‍රධාන අංගයක් ලෙස පවතී. හිල්ටන් විශ්වවිද්‍යාලය වැනි වේදිකා ඇතුළුව, හිල්ටන් හි ගෝලීය ඉගෙනුම් සහ සංවර්ධන පරිසර පද්ධතියට ප්‍රවේශ වීම තුළින්, කණ්ඩායම් සාමාජිකයින් සන්නාම ප්‍රමිතීන් සහ වර්ධනය වන අමුත්තන්ගේ අපේක්ෂාවන් සමඟ සමපාත වීමට අඛණ්ඩව පුහුණු කරනු ලැබේ. මෙම ව්‍යුහගත වැඩසටහන් නායකත්ව වර්ධනය, කාර්ය මණ්ඩල රඳවා ගැනීම සහ සේවා විශිෂ්ටත්වය පෝෂණය කරන අතර, පාරිභෝගික තෘප්තියට සහ කාර්ය සාධන ප්‍රතිඵලවලට සෘජුවම බලපායි.

## ගෝලීය බෙදාහැරීම, අලෙවිය සහ පක්ෂපාතීත්ව යටිතල පහසුකම්

කොළඹ හිල්ටන් හෝටලය, හිල්ටන් හි පුළුල් ජාත්‍යන්තර බෙදාහැරීමේ ජාලය, ආයතනික අලෙවි ප්‍රවේශය, සහ හිල්ටන් හෝනර්ස් (Hilton Honors) පාරිභෝගික ලැදියා වැඩසටහන උපයෝගී කර ගනී. මේවා සමස්තයක් ලෙස කාමර-රාත්‍රී (room-night) ජනනය සහ පාරිභෝගික රඳවා ගැනීම වැඩි දියුණු කරයි. හෝටලය, මධ්‍යගත අලෙවි උපාය මාර්ග, ගතික මිල නියම කිරීමේ ආකෘති, සහ ඉහළ වටිනාකම් සහිත නැවත පැමිණෙන අමුත්තන් (විශේෂයෙන් ගතික වෙළඳපලවලින්) වෙත ප්‍රවේශ වීමෙන් ප්‍රතිලාභ ලබයි.

## තාක්ෂණික ඒකාබද්ධ කිරීම සහ නවෝත්පාදන වේදිකා

ONQ දේපළ කළමනාකරණ පද්ධතිය (Property Management System) සහ අනෙකුත් පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ මෙවලම් ඇතුළුව, හිල්ටන් හි හිමිකාරිත්ව පද්ධති වෙත ප්‍රවේශය මෙහෙයුම් කාර්යක්ෂමතාවට සහ තත්‍ය කාලීන ව්‍යාපාරික බුද්ධියට සහාය වේ. ඩිජිටල් යතුරු සහ නව ගොඩනැගිලි කළමනාකරණ පද්ධති (BMS) ක්‍රියාකාරීත්වයන් වැනි කාමර නවෝත්පාදනයන් අමුත්තන්ගේ පහසුව වැඩිදියුණු කර ඇති අතර සේවා අනන්‍යකරණය ඉහළ නංවා ඇත.

## තිරසාරත්වය සහ උපායමාර්ගික සමගාමීත්වය

කොළඹ හිල්ටන් හෝටලයේ දිගුකාලීන පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අරමුණු වලට පාදක වන හිල්ටන් හි "Travel with Purpose" ගෝලීය ESG උපායමාර්ගය සමඟ සමපාත වේ. මෙම සමගාමීත්වය මගින් හෝටලයට ඉහළ යන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට සහ ජාත්‍යන්තර තිරසාරත්ව මිනුම් දඬු වලට අනුකූල වීමට හැකි වේ.

## උපායමාර්ගික අදාළත්වය සහ වටිනාකම වැඩිදියුණු කිරීම

කොළඹ හිල්ටන් හෝටලය හිල්ටන් වර්ල්ඩ්වයිඩ් සමඟ ඇති සම්බන්ධතාවයෙන් ලැබෙන සමුච්චිත ප්‍රතිලාභ, හෝටලයේ දිගුකාලීන තිරසාරත්වයට සහ ලාභදායිත්වයට සැලකිය යුතු ලෙස දායක වී ඇත. මෙම සමගාමීත්වය මගින් හෝටලයට ගෝලීය විශේෂඥ දැනුම, මෙහෙයුම් දැනුම-කෙසේද යන්න, සහ සන්නාම සහාය වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. එමගින් ඉහළ සේවා ප්‍රමිතීන් සහ තරඟකාරී ස්ථානගත කිරීම පවත්වා ගැනීමට උපකාරී වේ. මෙම වාසි වෙළඳපල තත්වයන් වෙනස් වීමේදී හෝටලයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කර ඇති අතර, අනාගතයේදී වටිනාකම් නිර්මාණය කිරීමේ ප්‍රධාන සාධකයක් ලෙස ඒවා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## මානව ප්‍රාග්ධනය

අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමට අනුව, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් විසින් හිල්ටන් වර්ල්ඩ්වයිඩ් වෙත බලතල සහ දේපළ මට්ටමේ මානව සම්පත් කළමනාකරණය සඳහා පූර්ණ වගකීම පවරා ඇත. මෙයට මානව සම්පත් හා සම්බන්ධ සියලු කාර්යයන් අධීක්ෂණය කිරීම ඇතුළත් වන අතර, එය හිල්ටන් හි ගෝලීය ප්‍රමිතීන්ට සහ මෙහෙයුම් විශිෂ්ටත්වයට අනුකූල බව සහතික කරයි.

හිල්ටන් හි දේපළ මට්ටමේ මෙහෙයුම්, පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රමුඛතා සංවිධාන ව්‍යුහයක් මගින් මෙහෙයවනු ලැබේ. හෝටලය, සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර, ඔහු මෙහෙයුම් කාර්ය සාධනය, කණ්ඩායම් නායකත්වය සහ අමුත්තන්ගේ තෘප්තිය සඳහා පූර්ණ වගකීම දරයි. සාමාන්‍යාධිකාරීවරයාට, එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත කණ්ඩායමක් සහාය වන අතර, ඔවුන් පෙරමුණේ කණ්ඩායම් කළමනාකරණය කිරීමේදී සහ හිල්ටන් හි සන්නාම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

| තනතුර | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---:|---:|---:|
| සාමාන්‍යාධිකාරී | - | 1 | 1 |
| අධ්‍යක්ෂ | - | 2 | 2 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 2 | 8 | 10 |
| කළමනාකරු | 4 | 10 | 14 |
| සහකාර කළමනාකරු | 10 | 58 | 68 |
| ජ්‍යෙෂ්ඨ විධායක | 12 | 46 | 58 |
| විධායක | 25 | 85 | 110 |
| කනිෂ්ඨ විධායක | 8 | 55 | 63 |
| විධායක නොවන | 47 | 223 | 270 |
| **මුළු එකතුව** | **108** | **488** | **596** |

### බඳවා ගැනීම් සහ රඳවා ගැනීම්

හෝටලයේ බඳවා ගැනීම් සහ තෝරා ගැනීමේ ක්‍රියාවලීන් උපායමාර්ගිකව සැලසුම් කර ඇත්තේ, මූලික වටිනාකම් සහ සුවිශේෂී සේවාවක් සඳහා වූ කැපවීම සමඟ සමපාත වන පුද්ගලයන් හඳුනා ගැනීමටයි. විවිධාංගීකරණය වූ, දක්ෂ සහ සේවා-නැඹුරු ශ්‍රම බලකායක් ආකර්ෂණය කර ගැනීම සඳහා හිල්ටන් විසින් මධ්‍යගත පද්ධති සහ දේශීය බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිවල සංකලනයක් යොදා ගනී. සෑම නව කණ්ඩායම් සාමාජිකයෙක්ම විස්තීරණ පුහුණු වැඩසටහනකට භාජනය වන අතර, පසුව අමුත්තන්ගේ සම්බන්ධීකරණය, ආරක්ෂාව, සන්නාම ඉදිරිපත් කිරීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වැනි ක්ෂේත්‍රවල නිපුණතා ගොඩනැගීම සඳහා අඛණ්ඩ පුහුණුවක් ලබා දෙනු ලැබේ.

**සේවකයන් ගිවිසුම් වර්ගය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව 2024**

| | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---:|---:|---:|
| ස්ථිර | 25 | 221 | 246 |
| ගිවිසුම්ගත | 83 | 267 | 350 |
| ආධුනික | - | - | - |
| **මුළු එකතුව** | **108** | **488** | **596** |

**සේවකයන් වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව 2024**

| | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---:|---:|---:|
| වයස අවුරුදු 18-30 | 64 | 163 | 227 |
| වයස අවුරුදු 31-55 | 38 | 287 | 325 |
| අවුරුදු 55ට වැඩි | 6 | 38 | 44 |
| **මුළු එකතුව** | **108** | **488** | **596** |

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

සේවක සේවා කාලය (වසර) 2024

| | විධායක | විධායක නොවන |
|---|---|---|
| 1ට අඩු | 13 | 99 |
| 1 සිට 5 | 30 | 190 |
| 6 සිට 10 | 11 | 35 |
| 11 සිට 15 | 8 | 60 |
| 16 සිට 20 | 7 | 45 |
| 21 සිට 25 | 13 | 34 |
| 26 සිට 30 | 9 | 27 |
| 31ට වැඩි | 4 | 11 |
| **මුළු එකතුව** | **95** | **501** |

### ඉගෙනීම සහ සංවර්ධනය

හිල්ටන් හි මානව ප්‍රාග්ධන උපායමාර්ගයේ ප්‍රධාන අංගයක් වන්නේ නායකත්ව සංවර්ධනයයි. Lead@Hilton වැනි ව්‍යුහගත වැඩසටහන් හරහා, නැගී එන නායකයින්ට මෙහෙයුම් විශිෂ්ටත්වය සහ සංවිධානය තුළ දිගුකාලීන වෘත්තීය දියුණුව යන දෙකටම සහාය වන හැකියාවන් ගොඩනැගීම සඳහා ඉලක්කගත පුහුණුවක් සහ උපදේශනයක් ලැබේ. මෙම පියවර මගින් හිල්ටන් හි වර්ධනය සහ සේවා ගුණාත්මකභාවය පවත්වාගෙන යන ශක්තිමත් නායකත්ව සැපයුම් දාමයක් සහතික කරයි.

| පුහුණු වර්ගය | සහභාගී වූ සංඛ්‍යාව | පුහුණු පැය ගණන |
|---|---|---|
| නායකත්ව සංවර්ධනය | 341 | 2,044 |
| ආයතනික වටිනාකම් සංවර්ධනය | 892 | 49,624 |
| තාක්ෂණික සංවර්ධනය | 530 | 8,500 |
| මෘදු කුසලතා සංවර්ධනය | 390 | 3,580 |
| එළිමහන් පුහුණුව | 241 | 1,350 |
| **මුළු එකතුව** | **2,394** | **65,098** |

### සේවක සම්බන්ධීකරණය

කණ්ඩායම් සාමාජික සම්බන්ධීකරණය, හෝටලයේ සියලු මට්ටම් වල ප්‍රමුඛතාවයක් ලෙස පවතී. හිල්ටන් විසින් ඇගයීම, විවෘත සන්නිවේදනය, සහ දියුණුව සඳහා අවස්ථා අවධාරණය කිරීම තුළින් ධනාත්මක, සමානාත්මතාවයෙන් පිරි සහ ඉහළ කාර්ය සාධනයක් සහිත සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කරයි. නිත්‍ය සේවක සම්බන්ධීකරණ සමීක්ෂණ සහ "CEO Light & Warmth Award", "Hospitality Heroes Award" සහ "Catch Me at My Best" වැනි ගෝලීය වශයෙන් පිළිගත් වැඩසටහන් - කැපී පෙනෙන කාර්ය සාධනය සමරන අතර, කණ්ඩායම් සාමාජිකයින් අතර හිමිකාරීත්වයේ සහ අභිමානයේ හැඟීමක් ඇති කරයි.

අඛණ්ඩතාවය සහ සදාචාරාත්මක හැසිරීම් හිල්ටන් හි මානව ප්‍රාග්ධන ක්‍රියා පටිපාටිවල ගැඹුරින් කාවැදී ඇත. සියලුම සේවකයින්ට හිල්ටන් හි ආචාර ධර්ම සංග්‍රහය මත පදනම්ව වාර්ෂික අනුකූලතා සහ ආචාර ධර්ම පුහුණුව සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. මෙම සංග්‍රහය වෘත්තීය හැසිරීම්, සේවා ස්ථාන ආරක්ෂාව, වෙනස් කොට සැලකීමට එරෙහි වීම, සහ නීතිමය අනුකූලතාව වටා ඇති අපේක්ෂාවන් ගෙනහැර දක්වයි. මෙය අපගේ ගෝලීය මෙහෙයුම් හරහා වගවීම සහ විශ්වාසය පිළිබඳ ස්ථාවර සංස්කෘතියක් සහතික කරයි.

ආගන්තුක සත්කාරය, අඛණ්ඩතාව, නායකත්වය, කණ්ඩායම් වැඩ, හිමිකාරීත්වය, සහ වර්තමානය වැනි අපගේ වටිනාකම් පිළිබිඹු කරන ශ්‍රම බලකායක් ඇති කිරීමට හිල්ටන් හෝටලය අඛණ්ඩව කැපවී සිටී. අපගේ මානව සම්පත් සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම තුළින්, හිල්ටන් අපගේ ව්‍යාපාරික අරමුණු වලට සහාය වනවා පමණක් නොව, අපගේ කණ්ඩායම් සාමාජිකයින්ට පුද්ගලිකව හා වෘත්තීයමය වශයෙන් දියුණු වීමට ද බලය ලබා දේ.

# අධ්‍යක්ෂවරුන්ගේ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන්, 2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කිරීමට සතුටු වෙති.

## 1. ප්‍රධාන ක්‍රියාකාරකම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ හෝටල් හිමිකරුවන් සහ ක්‍රියාකරුවන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සහ ඒ සඳහා ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් දේපළ ඉදිකිරීම, මිලදී ගැනීම, බදු දීම හෝ වෙනත් ආකාරයකින් අත්පත් කර ගැනීම සහ ඒවා වැඩිදියුණු කිරීමයි. ඒ අනුව, සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ සමාගම තමන්ට හිමි හිල්ටන් කොළඹ හෝටලය හරහා ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ නිරත විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 48 - 87 පිටුවල දක්වා ඇත.

## 3. අඛණ්ඩව පැවැත්ම

අධ්‍යක්ෂවරුන් සමාගමට එහි මෙහෙයුම් ඉදිරි අනාගතයේදී පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩව පැවැත්මක් සහිත ව්‍යාපාරයක් ලෙසිනි.

## 4. විගණකගේ වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව 48 - 51 පිටුවල දක්වා ඇත.

## 5. ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන 03 හි දක්වා ඇති අතර, සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ එම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට පෙර වසරේ භාවිතා කළ ඒවාට සාපේක්ෂව සැලකිය යුතු වෙනස්කම් කිසිවක් නොතිබුණි.

## 6. බදුකරණය

බදු සඳහා විධිවිධාන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන 10 හි දක්වා ඇති අනුපාතවලින් ගණනය කර ඇත.

## 7. ලාභාංශ

2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂවරුන් නිර්දේශ නොකරයි.

## 8. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් හිමිකාරීත්වය

වසර තුළ සහ 2024 දෙසැම්බර් 31 වන විට සමාගමේ අධ්‍යක්ෂවරුන් වූයේ:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා (2024.10.03 දින සිට පත් කරන ලදී)
- ධීෂානා එස්. අමරසේකර මහත්මිය
- පී. එච්. පී. දෙනියාය මහතා
- ආචාර්ය අයි. ඒ. කංකානම්ගේ මහතා
- එම්. එස්. වත්තේගම මහතා
- ආර්. සූරියආරච්චිගේ මහතා
- චමිල් උඩවත්ත මහතා (2024.10.11 දින සිට පත් කරන ලදී)
- දුලින්ද පෙරේරා මහතා (2024.10.11 දින සිට පත් කරන ලදී)
- ඒ. ජී. එස්. සේනාධීර මහතා (2024.10.11 දින සිට පත් කරන ලදී)
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා (2024.11.08 දින සිට පත් කරන ලදී)

2024 දෙසැම්බර් 31 වන විට අධ්‍යක්ෂවරුන් ලෙස තනතුරින් ඉවත් වූ අධ්‍යක්ෂවරුන්:

- උපුල් ධර්මදාස මහතා (2024.10.03 දින සිට තනතුරින් ඉවත් විය)
- පී. ඒ. ජයකාන්ත මහතා (2024.10.11 දින සිට තනතුරින් ඉවත් විය)
- කේ. එස්. වීරසිංහ මහතා (2024.10.11 දින සිට තනතුරින් ඉවත් විය)
- කේ. ඒ. ආර්. ජේ. ප්‍රනාන්දු මහතා (2024.10.11 දින සිට තනතුරින් ඉවත් විය)
- පී. ඒ. එස්. ඒ. කුමාර මහතා (2024.11.08 දින සිට තනතුරින් ඉවත් විය)

2024 දෙසැම්බර් 31න් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්කම්:

- උස්මාන් අන්නාස් මහතා (2025.01.08 දින සිට පත් කරන ලදී)
- මනෝජ් අල්ගම මහතා (2025.01.08 දින සිට පත් කරන ලදී)
- පී. එච්. පී. දෙනියාය මහතා (2025.01.08 දින සිට තනතුරින් ඉවත් විය)
- ආචාර්ය අයි. කංකානම්ගේ මහතා (2025.01.08 දින සිට තනතුරින් ඉවත් විය)
- රුවන් ප්‍රනාන්දු මහතා (2025.01.22 දින සිට පත් කරන ලදී)
- රොෂිකා ජයවර්ධන මහත්මිය (2025.01.22 දින සිට පත් කරන ලදී)
- එම්. එස්. වත්තේගම මහතා (2025.01.22 දින සිට තනතුරින් ඉවත් විය)
- ආර්. සූරියආරච්චිගේ මහතා (2025.01.22 දින සිට තනතුරින් ඉවත් විය)

2024 දෙසැම්බර් 31න් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්කම්වලින් පසුව, වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා
- ධීෂානා එස්. අමරසේකර මහත්මිය
- චමිල් උඩවත්ත මහතා
- දුලින්ද පෙරේරා මහතා
- ඒ. ජී. එස්. සේනාධීර මහතා
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා
- උස්මාන් අන්නාස් මහතා
- මනෝජ් අල්ගම මහතා
- රුවන් ප්‍රනාන්දු මහතා
- රොෂිකා ජයවර්ධන මහත්මිය

ඉහත අධ්‍යක්ෂවරුන් කිසිවෙකු සමාගමේ කොටස් දරන්නේ නැත.

## 9. බැඳියාවන් ලේඛනය

අධ්‍යක්ෂවරුන් 2007 අංක 7 දරණ සමාගම් පනතේ 192 (2) වගන්තියේ දක්වා ඇති පරිදි සාමාන්‍ය හෙළිදරව් කිරීම් සිදු කර ඇත. ඒ අනුව, ඔවුන්ට යම්

# අධ්‍යක්ෂවරුන්ගේ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

සම්බන්ධයක් ඇති කොන්ත්‍රාත්තු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 37.1 සටහනෙහි දක්වා ඇත.

## 10. අධ්‍යක්ෂවරුන්ගේ වේතනය

ගිණුම්කරණ කාලය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වේතනය සහ අනෙකුත් ප්‍රතිලාභ පහත පරිදි වේ; අධ්‍යක්ෂවරුන්ගේ වේතන රුපියල් 24,515,000 /- (2023 - රුපියල් 18,806,000/-).

## 11. අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් / සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ඉහත විස්තර මූල්‍ය ප්‍රකාශනවල 37 වන සටහනේ අඩංගු වේ. අධ්‍යක්ෂවරුන්ට හෙළිදරව් කර ඇති ඒවා හැර සමාගම සමඟ ඇති කිසිදු කොන්ත්‍රාත්තුවක හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක ඍජු හෝ වක්‍ර සම්බන්ධයක් නොමැත.

## 12. විගණකවරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය සමඟ කියවා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධනවලට අනුව, විගණකාධිපතිවරයා සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරයි. සමාලෝචනයට ලක් වූ වර්ෂය සඳහා විගණකවරයාට රුපියල් 4,592,021/- ක මුදලක් ගෙවිය යුතු අතර, එය විගණන ගාස්තු පමණක් සමන්විත වේ (2023 - රුපියල් 3,440,000/-).

## 13. පරිත්‍යාග

2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය තුළ සමාගම කිසිදු පරිත්‍යාගයක් සිදු කර නොමැත.

## 14. විගණන කමිටුව

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ විගණන කමිටුවේ සංයුතිය. විගණන කමිටුව 2023 ජුනි 28 දින සිට පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- පී.ඒ.එස්.ඒ කුමාර මහතා - සභාපති
- පී.එච්.පී. දෙනියාය මහතා
- එම්.එස්. වත්තේගම මහතා

විගණන කමිටුව 2024 දෙසැම්බර් 17 දින සිට පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති
- පී.එච්.පී. දෙනියාය මහතා
- එම්.එස්. වත්තේගම මහතා

මණ්ඩලයේ තවදුරටත් සිදු වූ වෙනස්කම්වලින් පසුව, විගණන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට නැවත වරක් පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති
- මනෝජ් අල්ගම මහතා
- උස්මාන් අන්නාස් මහතා

වරලත් ගණකාධිකාරීවරයෙකු වන, හිටපු අධ්‍යක්ෂවරයෙකු සහ විගණන කමිටුවේ සභාපතිවරයෙකු වන වී. කනගසභාපති මහතා, 2023 අප්‍රේල් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව ආරාධනයෙන් විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

## 15. වේතන කමිටුව

වේතන කමිටුව 2023 අප්රේල් 20 දින සිට පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- උපුල් ධර්මදාස මහතා - සභාපති
- ආර්. සූරියආරච්චිගේ මහතා
- පී.එච්.පී. දෙනියාය මහතා
- කේ.එස්.වීරසිංහ මහතා

පී.ඒ.එස්.ඒ. කුමාර මහතා 2023 නොවැම්බර් 28 දින සිට වේතන කමිටුවට පත් කරන ලදී. වේතන කමිටුව 2024 දෙසැම්බර් 17 දින සිට පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා - සභාපති
- ඒ. ජී. එස්. සේනාධීර මහතා
- ආර්. සූරියආරච්චිගේ මහතා
- චමිල් උඩවත්ත මහතා
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා

මණ්ඩලයේ තවදුරටත් සිදු වූ වෙනස්කම්වලින් පසුව, වේතන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට නැවත වරක් පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා - සභාපති
- ඒ. ජී. එස්. සේනාධීර මහතා
- රොශිකා ජයවර්ධන මහත්මිය
- චමිල් උඩවත්ත මහතා
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා

## 16. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව 2025 පෙබරවාරි 21 දින සිට පහත පරිදි ප්‍රතිස්ථාපනය කරන ලදී:

- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා - සභාපති
- රුවන් ප්‍රනාන්දු මහතා
- දුලින්ද පෙරේරා මහතා

## 17. ප්‍රාග්ධන වියදම්

වැදගත් ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 34 වන සටහනෙහි දක්වා ඇත.

## 18. දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, කම්හල් සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 12 වන සටහනෙහි දක්වා ඇත.

## 19. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 වන විට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 2,046,645,686 කින් නිරූපණය වන රුපියල් 20,466,456,858/- කි.

## 20. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

සමාගමේ මූල්‍ය ප්‍රකාශන එහි කටයුතුවල සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පිළිබිඹු කිරීම සඳහා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි. ඒ අනුව, මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 වන විට සමාගමේ කටයුතුවල තත්ත්වය සහ එදිනට අවසන් වූ වසර සඳහා වූ අලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙන බව අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

## 21. ව්‍යවස්ථාපිත ගෙවීම්

ඔවුන්ගේ දැනුමට හා විශ්වාසයට අනුව, රජයට සහ සමාගමේ සේවකයින්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් යාවත්කාලීනව සිදු කර ඇති බව අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

## 22. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල 33 වන සටහනෙහි දක්වා ඇති ඒවා හැර, වාර්තාකරණ දිනයෙන් පසු ගිණුම්වලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

## 23. වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජූනි 27 වන දින හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්, හිල්ටන් කොළඹ, 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 1 හිදී පැවැත්වේ.

මණ්ඩලයේ නියෝගය පරිදි,
**හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්**

*අත්සන් කරන ලදී*
**ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා**
*සභාපති*

*අත්සන් කරන ලදී*
**බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා**
*අධ්‍යක්ෂ*

*අත්සන් කරන ලදී*
**පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්**
*සමාගම් ලේකම්වරු*

කොළඹ
2025 ජූනි 20

# විගණන කමිටු වාර්තාව

## විගණන කමිටු ප්‍රඥප්තිය

සමාගමේ මූල්‍ය කටයුතුවලට අදාළ ඕනෑම කරුණක් පරීක්ෂා කිරීම සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් ලෙස විගණන කමිටු ක්‍රියා කරයි.

## විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ වගකීම් නිසි ලෙස ඉටු කිරීමට සහාය වීම සඳහා ඵලදායී වේදිකාවක් ලෙස ක්‍රියා කරයි. මෙය අභ්‍යන්තර පාලන පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. තීරණ ගැනීමේදී මෙන්ම මෙහෙයුම් වලදීද අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය ආවරණය කරමින් පහත සඳහන් කරුණු මෙයට ඇතුළත් වේ:

- සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ සමාගමේ අභ්‍යන්තර විගණන හා මූල්‍ය පාලන පද්ධති.
- අභ්‍යන්තර විගණකගේ කාර්ය සාධනය.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂික ස්වාධීන විගණනය.
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා වල අපක්ෂපාතී සමාලෝචනය සහ සොයාගැනීම් හා නිර්දේශ සැලකිල්ලට ගැනීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ සමාගමේ අනුකූලතාවය.

## විගණන කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණන කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2025 පෙබරවාරි 21 දින සිට මෙම කමිටුව පහත පරිදි ප්‍රතිසංවිධානය කරන ලදී:

| අධ්‍යක්ෂකවරුන්ගේ නම් | පත්වීමේ දිනය |
|---|---|
| බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා | 2024.12.17 |
| මනෝජ් අල්ගම මහතා | 2025.02.21 |
| උස්මාන් අන්නාස් මහතා | 2025.02.21 |

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීමෙන් පසු පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටු සාමාජිකයින් ලෙස ඔවුන්ගේ ධූර කාලය අවසන් කළහ:

| අධ්‍යක්ෂකවරුන්ගේ නම් | ඉල්ලා අස්වීමේ දිනය |
|---|---|
| පී. ඒ. එස්. ඒ. කුමාර මහතා | 2024.11.08 |
| පී. එච්. පී. දෙණියාය මහතා | 2025.01.08 |
| එම්. එස්. වත්තේගම මහතා | 2025.01.22 |

## විගණන කමිටු සාමාජිකයින්ගේ පසුබිම සහ අත්දැකීම්

මෙම වාර්තාවේ 12 සිට 15 දක්වා පිටුවල විගණන කමිටු සාමාජිකයින්ගේ පසුබිම සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහන් වේ.

වී. කනගසභාපති මහතා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 අප්‍රේල් මාසයේදී ගන්නා ලද තීරණයකට අනුව, වී. කනගසභාපති මහතා විගණන කමිටු රැස්වීම්වලට ආරාධනයෙන් සහභාගී වේ.

වී. කනගසභාපති මහතා මහජන ව්‍යවසායයන්හි විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වන අතර, රාජ්‍ය අංශයේ වසර 40කට වැඩි සේවා පළපුරුද්දක් ඇත. ඔහු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කර ඇත. හාවඩ් විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර, ලන්ඩන්හි වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරයෙකි. ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු  සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි.

## විගණන කමිටු රැස්වීම්

2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය තුළ, විගණන කමිටුව රැස්වීම් 5ක් පවත්වා ඇත. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමාගමේ ගණකාධිකාරී, කොළඹ හිල්ටන් හෝටලයහි සාමාන්‍යාධිකාරී සහ මූල්‍ය අධ්‍යක්ෂ, විගණකාධිපතිගේ නියෝජිතයින්, සහ හිල්ටන් කොළඹ හි කළමනාකරණ විගණකවරුන් වන M/s Ernst and Young ආරාධනයෙන් අවශ්‍ය වූ විට විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වූහ.

රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම පහත වගුවේ දක්වා ඇත:

| අධ්‍යක්ෂකවරුන්ගේ නම | සහභාගී වීමට නියමිත රැස්වීම් ගණන | සහභාගීත්වය |
|---|---|---|
| බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා | 1 | 1/1 |
| මනෝජ් අල්ගම මහතා | සඳහන් කර නැත | සඳහන් කර නැත |
| උස්මාන් අන්නාස් මහතා | සඳහන් කර නැත | සඳහන් කර නැත |
| පී. ඒ. එස්. ඒ. කුමාර මහතා | 4 | 4/4 |
| පී. එච්. පී. දෙණියාය මහතා | 5 | 5/5 |
| එම්. එස්. වත්තේගම මහතා | 5 | 5/5 |

විගණන කමිටු රැස්වීම්වල වාර්තා, විගණන කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරන සමාගම් ලේකම් විසින් සටහන් කරන ලද අතර, විගණන කමිටු රැස්වීම්වල වාර්තා ඊළඟ ප්‍රායෝගික රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදා හරින ලදී.

## මූල්‍ය වාර්තාකරණය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහ විනිවිදභාවය අධීක්ෂණය කිරීමේදී විගණන කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම වගකීමට, සියලුම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් ඇතුළත් වේ. විශේෂයෙන්, සැලකිය යුතු විනිශ්චයන් හෝ ඇස්තමේන්තු අවශ්‍ය වන සංකීර්ණ හෝ අසාමාන්‍ය ගනුදෙනු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. මෙම ගිණුම්කරණ ක්‍රමවේදයන් සුදුසු බවත්, ස්ථාවරව යොදන බවත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ අනෙකුත් අදාළ නියාමන රාමු වලට අනුකූල බවත් කමිටුව සහතික කරයි.

මීට අමතරව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට ඇති විය හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන ප්‍රකාශනවල මෑතකාලීන වර්ධනයන් කමිටුව සමීපව අධීක්ෂණය කරයි. මෙම ක්‍රියාශීලී ප්‍රවේශය, අනුකූලතාවය සහතික කරන අතර, මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය පවත්වා ගනිමින්, ගිණුම්කරණ ක්‍රියා පටිපාටි සහ හෙළිදරව් කිරීම් සඳහා කාලෝචිත ගැලපීම් සිදු කිරීමට හැකි වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය සඳහා මූල්‍ය ප්‍රකාශන නිර්දේශ කිරීමට පෙර, විගණන කමිටුව 2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, බාහිර විගණකවරුන්, අභ්‍යන්තර විගණකවරුන්, සහ හෝටල් හිල්ටන් කොළඹ හි කළමනාකරණ විගණකවරුන් වන M/s Ernst and Young සමඟ එක්ව සමාලෝචනය කරන ලදී. කමිටුවට අවශ්‍ය තහවුරු කිරීම් සහ ප්‍රකාශ ලබා දෙන ලදී. මෙම සමාලෝචනය මගින් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇති බව සහතික කළ අතර, ඒවා එම දිනට සමාගමේ තත්ත්වය සහ සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ එහි ක්‍රියාකාරකම් පිළිබඳව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ඉදිරිපත් කරන බව තහවුරු කරන ලදී.

## අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය

විගණන කමිටුව, සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිවල සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය අධීක්ෂණය කරයි. එය විගණන හෝ වෙනත් මූලාශ්‍ර හරහා හඳුනාගත් පාලන අඩුපාඩු සමාලෝචනය කරන අතර, කළමනාකරණයට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරයි. අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා කමිටුව වරින් වර පාලනයන් සහ ක්‍රියා පටිපාටි නැවත තක්සේරු කරයි.

විගණන කමිටුවට එහි අධිකාරී සීමාව තුළ ඕනෑම ගැටලුවක් විමර්ශනය කිරීමට අසීමිත බලයක් ඇත. සිය රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සියලුම සමාගම් වාර්තා, කාර්ය මණ්ඩලය සහ පහසුකම් වෙත එයට පූර්ණ ප්‍රවේශයක් ඇත. අවශ්‍ය පරිදි බාහිර උපදේශකවරුන් හෝ උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට කමිටුවට හැකි අතර, ඵලදායී අධීක්ෂණයට පහසුකම් සැලසීම සඳහා ඕනෑම සේවකයෙකු, අභ්‍යන්තර විගණකවරයෙකු හෝ බාහිර විගණකවරයෙකු එහි රැස්වීම්වලට කැඳවීමේ අයිතිය දරයි.

## අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර විගණන කාර්යාලය, විගණන කමිටුව විසින් අනුමත කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව හෝටල් මෙහෙයුම් පිළිබඳ සවිස්තරාත්මක විගණන සිදු කළේය. මෙම විගණන, කළමනාකරණය විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය ඇගයීම සහ මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ අනුකූලතාවය තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, විශේෂ අවධානයක් අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි කෙරෙහි යොමු කෙරිණි.

විගණන කමිටුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කළ අතර, එහි විෂය පථය, සම්පත් වෙන් කිරීම්, සහ කාලසීමාවන් සංවිධානය පුරා ඇති ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර ආවරණය කිරීමට ප්‍රමාණවත් බව සහතික කළේය. අභ්‍යන්තර පාලනයන්හි ශක්තිමත්භාවය, ගිණුම්කරණ ක්‍රියා පටිපාටි, සහ සමස්ත අවදානම් අවම කිරීමේ රාමුව තක්සේරු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් සමඟ නිතිපතා සම්බන්ධතා පැවැත්විණි.

අභ්‍යන්තර විගණන සොයාගැනීම් කළමනාකරණය සමඟ සාකච්ඡා කරන ලද අතර, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලෝචිතව ක්‍රියාත්මක කරන ලදී. අභ්‍යන්තර විගණන වාර්තා, කළමනාකරණයේ ප්‍රතිචාර සමඟින්,

# විගණන කමිටු වාර්තාව

සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන ගැටලු සහ කමිටුවේ තීරණ ඇතුළත් මෙම වාර්තා වල සාරාංශයක්, ඉහළම මට්ටමින් අධීක්ෂණය සහතික කිරීම සඳහා පසුව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

ගිණුම්කරණය, විගණනය, හෝ අභ්‍යන්තර පාලනයන් හා සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් හෝ ගැටලුවක් ද කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, සුදුසු ක්‍රියා පටිපාටි සහ විසඳුම් පවතින බව සහතික කරන ලදී.

## බාහිර විගණකවරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධන සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, විගණකාධිපතිවරයා සමාගමේ බාහිර විගණකවරයා ලෙස අඛණ්ඩව කටයුතු කරයි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කළේය. විගණන කමිටුව බාහිර විගණකවරයා සමඟ නිතිපතා සහ ඵලදායී සම්බන්ධතාවක් පවත්වා ගත් අතර, ඔහු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීම සහ අනුකූලතාවය පිළිබඳ ස්වාධීන අදහසක් ප්‍රකාශ කිරීමට වගකිව යුතු වේ. බාහිර විගණකවරයාට ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස සියලු විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වීමට ආරාධනා කරන ලදී. මෙම අන්තර්ක්‍රියා කමිටුවට නියාමන සහ අනුකූලතා කරුණු පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දුන් අතර, හඳුනාගත් ඕනෑම පාලන හෝ ක්‍රියා පටිපාටි අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කිරීමට හැකි විය.

## නිගමනය

සමාගමේ වත්කම් සහ මූල්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් පාලනයන් පවතින බවත්, විගණනය කරන ලද ගිණුම්වල හෙළිදරව් කර ඇති ප්‍රතිඵල කිසිදු සුවිශේෂී වැරදි ප්‍රකාශයකින් තොර බවත් විගණන කමිටුවේ අදහසයි.

**බී. ඒ. තුෂාර රොද්‍රිගෝ**
*සභාපති, විගණන කමිටුව*

දිනය: 2025 පෙබරවාරි 21

# මූල්‍ය ප්‍රකාශන

# ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | TIP/C/HDL/2024/FA/09 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 26 May 2025 |

සභාපති
හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්හි ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිමය තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට, කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

# ස්වාධීන විගණක වාර්තාව

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

**2.1.1** 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**ජී.එච්.ඩී. ධර්මපාල**
*විගණකාධිපති (වැඩබලන)*

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| | | මාස 12<br>2024.12.31<br>රු. '000 | මාස 12<br>2023.12.31<br>රු. '000 |
|---|---|---|---|
| ආදායම | 05 | **5,393,089** | 4,346,751 |
| විකුණුම් පිරිවැය | | **(2,708,885)** | (2,445,618) |
| දළ ලාභය | | **2,684,204** | 1,901,133 |
| වෙනත් ඉපයීම් සහ අලාභ | 06 | **28,621** | 13,175 |
| පරිපාලන වියදම් | | **(1,077,648)** | (904,197) |
| විකුණුම් සහ අලෙවිකරණ වියදම් | | **(151,347)** | (148,227) |
| වෙනත් වියදම් | | **(611,748)** | (698,548) |
| | | | |
| ක්ෂයකිරීම් වලට පෙර මෙහෙයුම් ලාභය | | **872,082** | 163,336 |
| ක්ෂයකිරීම් | | **(560,672)** | (367,193) |
| ක්ෂයකිරීම් වලට පසු මෙහෙයුම් ලාභය | | **311,410** | (203,857) |
| | | | |
| මූල්‍ය ආදායම් | 07 | **10,740** | 18,037 |
| මූල්‍ය වියදම් | 08 | **(590,497)** | (598,546) |
| | | | |
| බදු පෙර ලාභය/ (අලාභය) | 09 | **(268,347)** | (784,366) |
| ආදායම් බදු වියදම | 10 | **(71,490)** | 95,654 |
| කාල පරිච්ඡේදය සඳහා බදු පසු ලාභය / (අලාභය) | | **(339,837)** | (688,712) |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - බද්දෙන් ශුද්ධ වූ අගය | | - | 704,527 |
| සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය / (අලාභය) | | **(11,801)** | (31,688) |
| කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්න ආදායම/ (වියදම) | | **(351,638)** | (15,873) |
| | | | |
| කොටසක ඉපැයුම - මූලික (රු.) | 11 | **(0.17)** | (0.01) |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනට

| | | 2024.12.31<br>රු. '000 | 2023.12.31<br>රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 12 | **14,323,547** | 11,553,379 |
| කල්බදු ඉඩම් | 13 | **6,141,189** | 6,215,377 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | **89,016** | 1,705,375 |
| මුළු ජංගම නොවන වත්කම් | | **20,553,752** | 19,474,131 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 14 | **109,792** | 97,317 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 15 | **343,568** | 230,329 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | 16 | **88,407** | 42,820 |
| වෙනත් වත්කම් | 17 | **160,708** | 385,056 |
| කෙටිකාලීන මූල්‍ය වත්කම් | 18 | **66,766** | 61,947 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 19 | **103,596** | 275,356 |
| මුළු ජංගම වත්කම් | | **872,837** | 1,092,825 |
| මුළු වත්කම් | | **21,426,589** | 20,566,956 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | |
| **කොටස්හිමියන්ගේ ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | **20,466,456** | 20,466,456 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | **2,157,505** | 2,157,505 |
| සංචිත | 21 | **303** | - |
| සමුච්චිත අලාභ | | **(10,709,007)** | (10,357,067) |
| මුළු ස්කන්ධය | | **11,915,257** | 12,266,894 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොලී සහිත ණය මුදල් හා ණය ගැනීම් | 22 | **3,354,136** | 3,067,766 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැරකම් | 23 | **123,261** | 117,655 |
| විලම්භිත බදු වගකීම | 24 | **1,552,104** | 1,480,613 |
| භාවිතා කිරීමේ අයිතිය - කල්බදු ඉඩම් බැරකම | 13 | **19,105** | 24,645 |
| මුළු ජංගම නොවන වගකීම් | | **5,048,606** | 4,690,679 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 25 | **1,696,975** | 1,156,620 |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | 26 | **32,776** | 215,996 |
| කොන්ත්‍රාත් බැරකම් | 27 | **304,541** | 226,786 |
| පොලී සහිත ණය මුදල් හා ණය ගැනීම් | 22 | **595,824** | 58,333 |
| භාවිතා කිරීමේ අයිතිය - කල්බදු ඉඩම් බැරකම | 13 | **6,505** | 4,446 |
| රඳවා ගැනීමේ ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | | **166,709** | 162,012 |
| බැංකු අයිරාව | | **1,659,396** | 1,785,189 |
| මුළු ජංගම වගකීම් | | **4,462,726** | 3,609,382 |
| මුළු වගකීම් | | **9,511,332** | 8,300,062 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | | **21,426,589** | 20,566,956 |
| කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය - (රු.) | 28 | **5.82** | 5.99 |

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබෙන බව මම සහතික කරමි.

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2025 පෙබරවාරි 21 දින අත්සන් කරන ලදී.

**අධ්‍යක්ෂතුමා** **සභාපතිතුමා**

ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අංක 1 සිට 38 දක්වා වූ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන අතිරික්තය | ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ ප්‍රතිස්ථාපන සංචිත | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 20,466,456 | 1,452,978 | 178,230 | (9,814,896) | 12,282,767 |
| කාල පරිච්ඡේදය සඳහා වූ ලාභය / (අලාභය) | - | - | - | (688,712) | (688,712) |
| සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය / (අලාභය), බද්දෙන් ශුද්ධ වූ අලාභය | - | - | - | (31,688) | (31,688) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - බද්දෙන් ශුද්ධ වූ අගය | | 704,527 | | | 704,527 |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතයෙන් ප්‍රතිස්ථාපනය කිරීම | - | - | - | - | - |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතයට මාරු කිරීම් | - | - | (178,230) | 178,230 | - |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 20,466,456 | 2,157,505 | - | (10,357,067) | 12,266,894 |
| කාල පරිච්ඡේදය සඳහා වූ ලාභය / (අලාභය) | - | - | - | (339,837) | (339,837) |
| සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය / (අලාභය), බද්දෙන් ශුද්ධ වූ අලාභය | - | - | - | (11,801) | (11,801) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය (බද්දෙන් ශුද්ධ වූ) | - | - | - | - | - |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතයෙන් ප්‍රතිස්ථාපනය කිරීම | - | - | 207,816 | (207,816) | - |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතයට මාරු කිරීම් | - | - | (207,513) | 207,513 | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,466,456** | **2,157,505** | **303** | **(10,709,007)** | **11,915,257** |

ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අංක 1 සිට 38 දක්වා වූ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

| | සටහන් | 2024.12.31<br>රු. '000 | 2023.12.31<br>රු. '000 |
|---|---|---|---|
| බදු පෙර ලාභය / (අලාභය) | | **(268,347)** | (784,366) |
| **සිදු කරන ලද ගැලපීම්** | | | |
| ක්ෂය කිරීම් | 12 | **482,573** | 291,682 |
| ඉඩම් ක්‍රමක්ෂය කිරීම් | 13 | **78,099** | 75,511 |
| ණයගැතියන් හානිකරණය කිරීමේදී ඇතිවන වෙනස්කම් | 15 | **2,350** | 7,643 |
| නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන්කිරීම් | 23 | **28,460** | 22,462 |
| බිඳ වැටීම් සඳහා වෙන් කිරීම | 25 | **2,798** | 4,647 |
| පොලී වියදම | 8 | **590,497** | 598,546 |
| උපලබ්ධි නොවූ විනිමය (ලාභ) / අලාභ | 6 | **(35)** | (2,955) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමේදී ඇතිවන ලාභ | 6 | **(10,674)** | (3,188) |
| පොලී ආදායම | 7 | **(10,740)** | (18,037) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | **894,981** | 191,944 |
| තොගහි (වැඩිවීම) / අඩුවීම | 14 | **(12,476)** | 35,287 |
| ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම | 15 | **(115,588)** | (96,078) |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම | 16/26 | **(228,806)** | 105,713 |
| වෙනත් වත්කම්වල (වැඩිවීම) / අඩුවීම | 17 | **224,349** | (50,641) |
| වෙළඳ සහ වෙනත් ගෙවීම්වල වැඩිවීම / (අඩුවීම) | 25 | **(164,289)** | 89,961 |
| කොන්ත්‍රාත් බැරකම් වැඩිවීම / (අඩුවීම) | 27 | **77,755** | 47,342 |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් | | **675,926** | 323,527 |
| ආදායම් බදු ගෙවීම් | 29 | **-** | (254) |
| විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් | 23 | **(34,656)** | (13,963) |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ශුද්ධ මුදල් | | **641,270** | 309,310 |
| **ආයෝජන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදීගැනීම් | 12 | **(171,388)** | (193,842) |
| භාවිතා කිරීමට ඇති අයිතිය - කල්බදු ඉඩම් බැරකමෙහි ඇතිවූ ශුද්ධ වෙනස්වීම් | 13 | **(7,392)** | (4,806) |
| නොනිමි ප්‍රාග්ධන වැඩවල ආයෝජනය කිරීම් | | **(766,283)** | (1,289,918) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබූ මුදල | | **18,541** | 5,625 |
| පොලී ආදායම් ලැබීම් | 7 | **10,740** | 18,037 |
| ආයෝජන කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් | | **(915,781)** | (1,464,903) |
| **මූල්‍යකරණ කටයුතු සඳහා වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දිගුකාලීන ණයගැනීම් සඳහා ආපසු ගෙවීම | 22 | **-** | (500,040) |
| දිගුකාලීන ණයගැනීම් වලින් ලද මුදල් | 22 | **823,861** | 1,626,139 |
| මූල්‍ය වියදම් | 8 | **(590,497)** | (598,546) |
| මූල්‍යකරණ කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් | | **233,364** | 527,553 |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(41,146)** | (628,038) |
| වර්ෂය ආරම්භයේ තිබුනු මුදල් සහ මුදල් සමාන දෑ (සටහන් අංක 30) | | **(1,447,886)** | (822,800) |
| ඇ.ඩොලර් ඉතුරුම් තැන්පතු සම්බන්ධයෙන් වූ උපලබ්ධි නොවූ විනිමය ලාභ / (අලාභ) | 35 | **2,955** | |
| කාල පරිච්ඡේදය අවසානයේ තිබුණු මුදල් සහ මුදල් සමාන දෑ | | **(1,488,998)** | (1,447,886) |

ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අංක 1 සිට 38 දක්වා වූ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

## 1. සමායතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් ආයතනය ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත හා ලියාපදිංචි සීමා සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් ආයතනය සත්කාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින අතර හිල්ටන් කළම්බෝ හෝටලය විසින් එහි හිමිකාරිත්වය දරනු ලබයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා බලය පවරන ලද දිනය

2025 පෙබරවාරි 21 දින සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ( මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද, සාමාන්‍යයෙන් SLFRS වශයෙන් හඳුන්වන ලබන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ලැබ ඇත.

### 2.2 තක්සේරුව සඳහා පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැර, සෙසු මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් සකස් කර ඇත ;

- සාධාරණ අගය මත, පසුව තක්සේරු කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ
- නිර්වාචිත ප්‍රතිලාභ බැදීමේ වර්තමාන අගයට හඳුනා ගනු ලබන නිර්වාචිත ප්‍රතිලාභ බැදියාවට අදාළ බැරකම

### 2.3 ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල සහ ප්‍රදර්ශක ව්‍යවහාරික මුදල

සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල සහ ප්‍රදර්ශක ව්‍යවහාරික මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

### 2.4 සංසන්දනාත්මක තොරුතුරු

සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යටතේ පූර්ව මූල්‍ය තොරතුරුවලට සංගත ආකාරයෙන් ගිණුම්කරන ප්‍රතිපත්තීන් යොදා ගෙන තිබුණි.

### 2.5 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 ප්‍රකාරව සමාන අයිතමයන් අඩංගු එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනය තුළ දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී. ලං. ගි. ප්‍ර. 01 සඳහා වූ සංශෝධනවලින් අනුමත කරන එකිනෙකට සමාන නොවන ස්වභාවයෙන් යුත් අයිතමයන් හෝ කාර්යයන් තිබේ නම් එම අයිතමයන් හෝ කාර්යයන් ද වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

### 2.6 හිලව් කිරීම

හඳුනාගත් අගයන් හිලව් කිරීම සඳහා නීතිමය වශයෙන් බලාත්මක කරන ලද අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමින් පියවා දැමීමේ හෝ බැරකම පියවීමට හා ඒ හා සමගාමීව වත්කම උපලබ්ධි කිරීමට අපේක්ෂාවක් ඇතිනම් පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කර එහි ශුද්ධ අගය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇත. යම් ගිණුම්කරන ප්‍රමිතයක් හෝ වෙනත් අර්ථ නිරූපණයක් මගින් නියම කර නොමැති නම් සහ ගිණුම්කරන ප්‍රතිපත්ති තුළ විශේෂයෙන් හෙළිදරව් කර ඇති ආකාරයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ආදායම් සහ වියදම් හිලව් කර නොමැත.

## 3. ගිණුම්කරන ප්‍රතිපත්ති

සමාගම විසින් ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ආකාරයෙන් යොදාගෙන ඇති අතර සටහන් අංක 3.1 සඳහන් ගිණුම්කරන ප්‍රතිපත්තිවල වෙනස්වීම් හැර, පෙර වර්ෂවලදී භාවිතා කළ ඒවා සමග අනුරූප වේ.

**සංසන්දනාත්මක තොරතුරු**

වඩාත් මැනවින් ඉදිරිපත් කිරීම කල යුතු අවස්ථාවලදී සහ ප්‍රවර්තන වර්ෂයේ අගයන් සමග සංසන්දනය වන ආකාරයෙන් කල යුතු අවස්ථාවලදී පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

අදාළ වන පරිදි, සංඛ්‍යාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු, පෙර කාල සීමාවට අදාළ වන ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කරනු ලබයි. ඊට අමතරව, ගිණුම්කරන ප්‍රතිපත්තියක අතීතයට බලපාන සංශෝධනයක් හෝ අතීතයට බලපාන නැවත ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයේ අයිතමවල නැවත වර්ගීකරණයක් සිදු වන්නේ නම් සමාගම විසින් අදාළ පූර්ව කාලසීමාව ආරම්භයේදී අමතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් ඉදිරිපත් කරනු ඇත.

### 3.1 ගිණුම්කරන ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් වූ වෙනස්වීම්

**නව සහ සංශෝධිත ප්‍රමිතීන් හා අර්ථ නිරූපනයන්**

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 16 - කල්බදු**

කල්බදු කාලය මාස 12 ක් හෝ ඊට අඩු නොමැති නම් හෝ කල්බදුහිමියාගේ ගිණුම්කරනය වර්තමාන පරිචය හා සමානව පැවතියද අදාළ වත්කම අඩු වටිනාකමකින් යුතු වන්නේ නම් සියලුම කල්බදු, වත්කම් සහ වගකීම් ලෙස හඳුනා

ගතයුතු බව ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 16 සඳහන් තනි බදු ගැණුම්කරු ගිණුම්කරන මොඩලයක් මගින් සම්පාදනය කරනු ලබයි. මෙයින් ශ්‍රී.ලං.ගි.ප්‍ර 17 - කල්බදු, IFRIC 4 - යම් එකඟවීමක් තුළ කල්බද්දක් පවතීදැයි තීරණය කිරීම, SIC 15 - මෙහෙයුම් කල්බදු - දිරිදීමනා සහ SIC 27 - කල්බද්දක නීතිමය පැතිකඩ හා සම්බන්ධ ගනුදෙනුවල හරය ඇගයීම ආදීය අවලංගු කෙරෙනු ඇත. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 15 - ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් උපයන ආදායම් භාවිතා කරනු ලබන ආයතන සඳහා පෙර භාවිතා කළ යෙදවුම සඳහා අවසර දෙනු ලැබේ.

2019 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරන කාල පරිච්ඡේදයන් සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 16 බලාත්මක වේ.

2019 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 16 අනුගමනය කිරීමේදී හිල්ටන් කළම්බොහි නාගරික සංවර්ධන අධිකාරියට අයත් රථගාල සම්බන්ධයෙන් වූ ඉඩම් කල්බදු අයිතිය කෙරෙහි බලපෑමක් සිදු වනු ඇත.

## 3.2 වැදගත් ගිණුම්කරන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනාගතය සම්බන්ධයෙන් වූ ඉතා වැදගත් ගිණුම්කරන උපකල්පනයන් යොදා ගැනීම අවශ්‍ය වේ. තවද, වාර්තාකරන කාල සීමාව අවසානයේ වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් සම්බන්ධ හෙළිදරව් කිරීම සඳහා බලපානු ලබන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සමාගමේ කළමනාකරනය විසින් සිදු කිරීම අවශ්‍ය වේ. කෙසේ නමුත්, මෙම උපකල්පනයන් සහ ඇස්තමේන්තුවල පවතින අවිනිශ්චිතභාවය, අනාගත කාල සීමාවන්හිදී වත්කම් හෝ බැරකම්වල ධාරණ අගය සඳහා ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇති කළ හැකිය. එම නිසා, මෙම තීන්දු සහ ඇස්තමේන්තුවලට වඩා සත්‍ය අත්විඳීම සහ ප්‍රතිඵල වෙනස් විය හැකිය.

සමාගමේ ගිණුම්කරන ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී, පහතින් දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගත් අගයන්ට වඩාත් ම සැළකිය යුතු බලපෑමක් ඇති වෙන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කළමනාකාරීත්වය විසින් සිදු කර තිබුණි:

### අ) බදුකරණය

ආදායම් බදු සඳහා මෙන්ම එකතු කළ අගය මත බදුකරණය සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු සඳහා ද සමාගම යටත් වේ. ප්‍රවර්තන සහ විලම්භිත බදු මෙන්ම මූල්‍ය ප්‍රකාශන තුළ සහ බදු පැනවීම සඳහා වූ බදු කළ හැකි ලාභයට අදාළව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීමේ ගැලපීම සඳහා වන බදු මාර්ගෝපදේශයන් නිකුත් කිරීමට නියමිතව පවතින වෙනත් බදු සඳහා වූ මුළු වෙන්කිරීම් තීරණය කිරීම සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කාලය තුළ බදු නීති භාවිතාව පිළිබඳ අර්ථකතනය කිරීම සැළකිල්ලට ගනිමින් සහ පවතින අවිනිශ්චිතතාවයන් පිළිබඳ සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය.

අමතර බදු පවතීද යන උපකල්පන මත පදනම්ව ප්‍රවර්තන, විලම්භිත සහ වෙනත් බදු සඳහා වත්කම් සහ වගකීම් සමාගම විසින් හඳුනාගෙන තිබුණි. අවසාන බදු ප්‍රතිඵලය, මූලිකව වාර්තා කළ අගයන්ට වඩා වෙනස් වන්නේ නම් එම වෙනස් වූ අගයන් වාර්තා කළ කාල පරිච්ඡේදය තුළ වූ ආදායම්, විලම්භිත සහ බදු අගයන්වලට බලපෑමක් කරනු ඇත.

### ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණනය

සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ සාධාරණ අගයට දක්වා ඇත. එම වත්කම්වල සාධාරණ අගය තක්සේරු කිරීමේදී ඒ හා සමාන වත්කම්වල වර්තමාන වෙළඳපල මිල ගණන් ඇත්නම් එම සාක්ෂි සැළකිල්ලට ගනු ලබයි. එවැනි තොරතුරු නොමැති නම් තාර්කික වූ සාධාරණ අගය ඇස්තමේන්තු අගයන් අතරින් සාධාරණ අගයන් ලෙස සැළකිය හැකි අගයන් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවකුගේ සහය ඇතිව සමාගම විසින් තීරණය කරනු ලබයි.

### ඇ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමාගම විසින් අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදී සමාලෝචනය කරනු ලබයි. මෙම වටිනාකම්, අනුපාතයන් තක්සේරු කිරීම කළමනාකරණයේ විනිශ්චයන් ලෙස සිදු කෙරෙන අතර එබැවින් ඒවා අවිනිශ්චිතාවයට යටත් වේ.

### ඈ) අඛණ්ඩභාවය

අඛණ්ඩභාවයක් සහිතව ඉදිරියට පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව අධ්‍යක්ෂවරුන් විසින් අගය කර තිබෙන අතර ඉදිරි අනාගතය සඳහා ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය සම්පත් සමාගම සතුව පවතින බව පිළිබඳවද සෑහීමකට පත්ව ඇත. තවදුරටත්, අඛණ්ඩභාවයක් සහිතව ඉදිරියට පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැළකිය යුතු සැකයක් ඇති විය හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නොමැති අතර ඔවුන් සමාගමේ මෙහෙයුම් කටයුතු ඇවර කිරීමට හෝ නවතා දැමීමට අදහස් නොකරයි. එම නිසා, අඛණ්ඩභාවය පදනම් කරගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

### ඉ) මූල්‍ය වත්කම් මත වූ හානිකරණ අලාභ

විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ වාර්තා කළ යුතු හානිකරණ අලාභයක් පවතීදැයි යන්න තහවුරු කර ගැනීමට යම් නිරපේක්ෂ සාක්ෂියක් ඇත්දැයි තිරීණය කිරීම සඳහා සෑම වාර්තාකරණ කාල පරිච්ඡේයකටම වරක් හෝ නිරන්තරයෙන් සමාගම විසින් අගය කිරීම් සිදු කරයි.

### ඊ) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්

ආයුගණක අගය කිරීම් භාවිතා කරමින් නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය තීරණය කරනු ලබයි. ආයුගණක අගය

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

කිරීමක්, අනාගතයේ සිදු වන සත්‍ය වර්ධනයවීම්වලට වඩා වෙනස් විය හැකි, විවිධ උපකල්පන සිදු කිරීම මත පදනම් වේ. වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධනයන්, මරණ අනුපාත ආදීය තීරණය කිරීම මෙහි ඇතුළත් වේ. අගය කිරීම්වල පවතින සංකීර්ණතාවය, ඒ මත පදනම් වන උපකල්පනයන් සහ ඒවායේ දිගු කාලීන ස්වභාවය හේතුවෙන් නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමක් මෙම උපකල්පනයන්හි වෙනස්වීම්වලට දැඩි ලෙස සංවේදී වේ. සෑම වාර්තාකරණ දිනකටම වරක් සියලුම උපකල්පනයන් සමාලෝචනය කරලු ඇත.

සුදුසු වට්ටම් අනුපාතයක් තීරණය කිරීමේදී, කළමනාකරණය විසින් නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්මෙහි අපේක්ෂිත කාලය හා සම්බන්ධ තක්සේරු කළ කල්පිරීමක් සහිත ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල ඉපැයීම සළකනු ලබයි. මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කළ මරණ අනුපාත වගුව පදනම් කර ගනු ලබන අතර අනාගත වැටුප් වැඩිවීම්, අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතයන් සහ සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩි කිරීමේ අනුපාතය මත පදනම් වේ.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් අනුගමනය කරනු ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහතින් දක්වා ඇත. වෙනත් සටහනක් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේදයන් සඳහා අනුරූපීව පහත ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කර ඇත.

### 4.1 ආදායම් හඳුනා ගැනීම

#### (i) ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම්වලින් ඉපැයූ ආදායම

හෝටලය, සත්කාරක සහ විනෝදාත්මක සේවා සැපයීම් ව්‍යාපාරයේ නිරතව සිටියි. භාණ්ඩ හා සේවා පාලනය ගණුදෙනුකරු වෙත මාරු කිරීමේදී, එම භාණ්ඩ හා සේවා සඳහා වූ හුවමාරු කිරීමකදී හෝටලය හිමිකම් කියන අපේක්ෂිත ප්‍රතිෂ්ඨාව ලෙස දක්වන අගයකයට, ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම්වලින් ඉපැයූ ආදායම් හඳුනා ගනු ලබයි.

එය ගණුදෙනුකරු වෙත භාණ්ඩ හා සේවා මාරු කිරීමට පෙර අදාළ භාණ්ඩ හා සේවා පාලනය කිරීම හේතුවෙන් සාමාන්‍යයෙන් හෝටලය, ස්වකීය ආදායම් ගිවිසුම් තුළ එය ප්‍රතිපත්තියක් ලෙස ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් භාවිතා කිරීමේ බලපෑම කළමනාකරණය විසින් තක්සේරු කර ඇති අතර එය පහත දැක්වේ:

**(අ) සේවා සැපයීම**

යම් කාලයක් ඇතුළත කාර්යසාධන වගකීම් සපුරා ඇති අවස්ථාවකදී සේවා සැපයීම් වෙනුවෙන් ඉපැයූ ආදායම හඳුනා ගනු ලබයි.

කාමර ආදායම, දිනක නේවාසික කාමර මත හඳුනා ගනු ලබන අතර ආහාර සහ පාන වර්ග, විකිණීම සිදුවූ කාලය සඳහා ගිණුම් ගත කරනු ලබයි. (එනම් කාර්යසාධන වගකීම් සපුරා ඇති අවස්ථාවකදීය.) හෝටලය සම්බන්ධයෙන් වූ වෙනත් ආදායම්, එවැනි සේවා සැපයීමේදී ගිණුම්ගත කරනු ලබයි.

#### (ii) පොලිය

ක්‍රමක්ෂයට මණිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සහ විකිණීම සඳහා වර්ග කර ඇති පොලී සහිත මූල්‍ය වත්කම්, පොලී ආදායම් හෝ වියදම්, සඵල පොලී අනුපාතය යොදා ගනිමින් වාර්තා කරනු ලබන අතර එය ඇත්ත වශයෙන්ම මූල්‍ය වත්කමක හෝ වගකීමක ශුද්ධ ධාරණ අගයක් සඳහා සුදුසු නම් මූල්‍ය උපකරණයක අපේක්ෂිත ජීව කාලය හෝ කෙටි කාලයක් මගින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ මුදල් ලැබීම් වට්ටම් කරනු ලබන අනුපාතය වේ. මූල්‍ය නොවන වත්කම් මත වූ පොලී ආදායම, ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතය තුළ ඇතුළත් කර ඇත. වෙනත් සියලුම පොලී ආදායම්, මූල්‍ය ආදායම තුළ ඇතුළත් කර ඇත..

#### (iii) සාප්පු කුලී ආදායම

උපචිත පදනම මත සාප්පු කුලී ආදායම හඳුනා ගනු ලබයි.

**පිරිවැටුම පදනම් වූ බදු**

පිරිවැටුම පදනම් වූ බදු සඳහා එකතු කළ අගය මත බදු, සංචාරක සංවර්ධන බදු සහ සමාජ ආරක්ෂණ දායක බදු ඇතුළත් වේ. හෝටලයේ බදු වර්ගයන් අදාළ නීති මගින් පනවා ඇත.

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලබයි.

### 4.2 වියදම් හඳුනා ගැනීම

දරන ලද වියදම් සහ ආදායම්වල විශේෂිත අයිතමයන් ඉපැයීම් අතර වූ සෘජු සම්බන්ධතාවය මත පදනම්ව විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනා ගනු ලබයි. ව්‍යාපාරය පවත්වා ගෙන යාම සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා දරන ලද සියලු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වා ඇත.

සමාගමේ කාර්යසාධන අංගයන් සාධාරණව ඉදිරිපත් කිරීමේ පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා "වියදම්වල කාර්යභාරය" ("function of expenses") නැමැති ක්‍රමවේදය යොදා ගෙන ඇත.

ප්‍රවර්තන සහ විලම්භිත බදුවලින් ආදායම් බදු වියදම සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලබයි.

### 4.3 බදුකරණය

#### 4.3.1 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන වර්ෂය සම්බන්ධයෙන් සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා සිදු කරන යම් ගැලපීම් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් ආපසු අය කර ගැනීමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත අගයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ. වාර්තාකරණ දිනට පනවන

ලද හෝ සාරානුකූලව පනවන ලද බදු අනුපාතයන් සහ බදු නීති, අදාළ බදු අගයන් ගණනය කිරීම සඳහා භාවිතා කර ඇත.

### 4.3.2 විලම්භිත බදු

වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ වත්කම් සහ වගකීම්වලට අදාළ බදු පදනම් හා මූල්‍ය වාර්තාකරණ අරමුණු මත පදනම් වූ ඒවායේ ධාරණ අගයන් අතර ඇති වන තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත බදු සපයනු ලබයි.

ඉඩ දිය හැකි සියලු වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනා ගනු ලබයි. ඉඩ දිය හැකි තාවකාලික වෙනස්කම් මෙන්ම ඉදිරියට ගෙන එන ලද භාවිතා නොකළ බදු ආපසු ලැබීම් සහ භාවිතා නොකළ බදු අලාභයන්, බදු කළ හැකි ලාභයෙන් ආවරණය කර ගත හැකි ප්‍රමාණයක් සඳහා ඉදිරියට ගෙන එන ලද භාවිතා නොකළ බදු ආපසු ලැබීම් සහ භාවිතා නොකළ බදු අලාභයන් උපයෝජනය කළ හැකිය.

සෑම වාර්තාකරණ දිනකට වරක් විලම්භිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කරන අතර එය මුළු විලම්භිත බදු වත්කමක් හෝ ඉන් කොටසක් උපයෝජනය කිරීම සඳහා වන ප්‍රමාණවත් බදු කළ හැකි ලාභයක් තවදුරටත් නොමැති වන ආකාරයෙන් අඩු කරනු ලබයි. සෑම වාර්තාකරණ දිනකට වරක් හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් නැවත තක්සේරු කරනු ලබන අතර විලම්භිත බදු වත්කම නැවත අය කර ගැනීමට ඉඩ දෙන අනාගත බදු කළ හැකි ලාභයට සමාන ප්‍රමාණයකට හඳුනා ගනු ලබයි.

වාර්තාකරණ දිනට පනවන ලද හෝ සාරානුකූලව පනවන ලද බදු අනුපාතයන් සහ බදු නීති, පදනම් කර ගනිමින් වත්කම් උපලබ්ධි කිරීම හෝ වගකීම් පියවීම සිදු කරන වර්ෂයකදී යොදා ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයකට විලම්භිත බදු වත්කම් සහ වගකීම් අගය කරනු ලබයි.

## 4.4 මූල්‍ය නොවන වත්කම්

### 4.4.1 දේපළ, පිරියත සහ උපකරණ

#### a) හඳුනා ගැනීම සහ අගය කිරීම

**මූලික හඳුනා ගැනීමකදී**

වත්කමක් හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින අවස්ථාවකදී දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලබන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 - දේපළ, පිරියත සහ උපකරණ මගින් වත්කමක පිරිවැය විශ්වාසනීය ආකාරයෙන් අගය කළ හැකිය. මූලික වශයෙන් සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරණ අලාභවලින් (පවතී නම්) ශුද්ධ වූ පිරිවැයකට දේපළක සහ උපකරණ අගය කරනු ලබයි. මෙම පිරිවැය තුළ දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය සහ හඳුනා ගැනීමේ දර්ශකයන් සපුරා ඇත්නම් අදාළ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වූ ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල ඉතා වැදගත් කොටස් නිතර නිතර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවකදී, එම කොටස් විශේෂිත ජීව කාලයක් සහිත ඒක පුද්ගල වත්කම් ලෙස සමාගම විසින් හඳුනා ගනු ලබන අතර ඒ අනුව, ඒවා ක්ෂය කිරීමද සිදු කරයි. ඒ අයුරින්, විශාල ප්‍රතිසංස්කරණයක් සිදු කරන අවස්ථාවකදී, හඳුනා ගැනීමේ දර්ශකයන් සපුරා ඇත්නම් එම පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය තුළ හඳුනා ගනු ලබයි. වෙනත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය, අදාළ පිරිවැය දරන අවස්ථාවේදී ලාභ අලාභ තුළ හඳුනා ගනු ලබයි.

**පසුකාලීන අගය කිරීමකදී**

සියලු දේපළ, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂය කිරීම අඩු කළ පසු ලැබෙන සාධාරණ අගයකට පසුකාලීනව අගය කරනු ලබන අතර එම අගය කිරීම, බාහිර ස්වාධීන තක්සේරුකරුවන් විසින් සිදු කරනු ලබයි. ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය ප්‍රමාණාත්මක ලෙස එහි ධාරණ අගයෙන් වෙනස් නොවීම තහවුරු කර ගැනීම සඳහා වන ප්‍රමාණවත් කාල පරාසයකින් අගය කිරීම් සිදු කර ඇත.

වෙනත් විස්තීරණ ආදායම තුළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගනු ලබන අතර ස්කන්ධය තුළ වූ ප්‍රත්‍යාගණන අතිරික්තය වෙත බැර කරනු ඇත. කෙසේ නමුත්, අදාළ වත්කම සම්බන්ධයෙන් පූර්ව වශයෙන් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගත් ප්‍රත්‍යාගණන ඌණතාවයක් වේ නම් එම ප්‍රමාණය අවලංගු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට අදාළ ප්‍රත්‍යාගණන වර්ධනය ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලබයි. ප්‍රත්‍යාගණන ඌණතාවයක් හඳුනා ගැනීමේදී, අදාළ වත්කම සම්බන්ධයෙන් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය තුළ දැනටමත් පවත්නා අතිරික්තයක් ඇත්නම් එය හිලව් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට හැර ප්‍රත්‍යාගණන ඌණතාවය ලාභ අලාභ තුළ හඳුනා ගනු ලබයි. අපහරණය කිරීමකදී හෝ පොත්වලින් ඉවත් කිරීමකදී, විකිණීමට භාජනය වන අදාළ වත්කම සම්බන්ධයෙන් වූ ප්‍රත්‍යාගණන සංචිතය රඳවා ගත් ලාභ සඳහා මාරු කරනු ලබයි.

වත්කම්වල ප්‍රත්‍යාගණිත ධාරණ අගය සහ වත්කමේ මුල් පිරිවැය මත වූ ක්ෂය කිරීම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය තුළින් රඳවා ගත් ලාභ වෙත වාර්ෂික මාරුකිරීමක් සිදු කරනු ලබයි.

**පසුකාලීන පිරිවැය**

ව්‍යාපාරය සඳහා යොදා ගැනීමේ හෝ ව්‍යාපාරයේ ඉපැයීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ මාර්ගය වශයෙන් ස්ථාවර ස්වභාවයක් ගනු ලබන වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සළකනු ලබන අතර එම වියදම් වත්කමක ධාරණ අගය තුළ හඳුනා ගනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා කිරීම හා සම්බන්ධ පිරිවැයයන්, එය දරන අවස්ථාවේදී, විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලබයි.

**ක්ෂය කිරීම**

අපේක්ෂිත ජීව කාලය පුරාවට දේපළ සහ උපකරණ පිරිවැය, අවශේෂ වටිනාකමක් දක්වා ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමවේදය භාවිතා කරමින් ක්ෂය කිරීම ගණනය කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

මිලදී ගත් දින සිට අපහරණය කළ දින දක්වා අනුපාතිකව ක්ෂය කිරීම සිදු කරයි. අපේක්ෂිත ජීව කාලය මත පදනම් වූ ක්ෂය කිරීම් අනුපාතයන් පහතින් දැක්වේ:

| වත්කම් කාණ්ඩය | % |
|---|---|
| ගොඩනැගිලි | 1.82 |
| පිරියත සහ යන්ත්‍ර | 7.50 |
| ශීතකරණ සහ මුළුතැන්ගෙයි උපකරණ | 7.50 |
| පරිගණක සහ රූපවාහිනී | 20.00 |
| මෝටර් රථ | 25.00 |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | 10.00 |
| මෙහෙයුම් උපකරණ | 33.00 |

* මෘදුකාංග, අගයෙන් ප්‍රමාණාත්මක නොවන අනුයාත සංරචකයක් වීම හා ආදායම උත්පාදනය සඳහා සෘජුවම දායක නොවීම හේතුවෙන් "පරිගණක සහ රූපවාහිනී" යටතේ වර්ගීකරණය කර ඇත.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයකදී, වත්කමක අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන්, සමාලෝචනය කර අවශ්‍ය වේ නම් ගැලපිලි සිදු කරනු ලබයි.

**හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම**

වත්කම් අපහරණයකදී හෝ වත්කම් භාවිතයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභයන් නොලැබෙන අවස්ථාවකදී දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලබයි. වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කිරීමකදී ඇතිවන ලාභ හෝ අලාභ (ශුද්ධ අපහරණයෙන් ලද මුදල් සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ගණනය කර ඇත.), එම ඉවත් කිරීම සිදු කරන වර්ෂය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවලින් යම් අයිතමයක් සම්බන්ධයෙන් වූ ස්කන්ධය තුළ ඇතුළත් ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කම ඉවත් කරන අවස්ථාවේදී සෘජුවම ස්කන්ධය වෙත මාරු කරනු ලබයි.

**ණය ගැනීමේ පිරිවැයයන්**

අපේක්ෂිත උපයෝජනය සඳහා සූදානම් කිරීම සඳහා සැළකිය යුතු කාල පරිච්ඡේදයක් අවශ්‍යයෙන්ම ගත කරනු ලබන වත්කමක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ නිශ්පාදනය කිරීම සඳහා සෘජුවම අදාළ වන ණය ගැනීමේ පිරිවැයයන්, එම වත්කමෙහි පිරිවැය තුළ වූ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලබයි. අනෙකුත් සියලු ණය ගැනීමේ පිරිවැයයන් ඒවා සිදු කරන කාල පරිච්ඡේදය තුළ වියදම් ලෙස දක්වනු ලබයි.

### 4.4.2 මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනකට වරක් වත්කමක් හානිකරණය වීම සම්බන්ධයෙන් වූ කිසියම් ලක්ෂණයක් ඇත්දැයි තක්සේරු කරනු ලබයි. එවැනි යම් ලක්ෂණයක් පවතී නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වන අවස්ථාවකදී සමාගම විසින් වත්කමක අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක හෝ මුදල් උපයන ඒකකයක විකිණීම සඳහා වූ පිරිවැය අඩු කළ සාධාරණ අගය සහ ඉන් උපයෝජිත වටිනාකම අතරින් වැඩි අගය, වත්කමක අය කර ගත හැකි වටිනාකම වන අතර එය වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩයන් අතරින් විශාල වශයෙන් ස්වාධීන මුදල් ප්‍රවාහයන් ජනිත කිරීමට නොහැකි අවස්ථාවකදී තනි වත්කමක් සඳහා තීරණය කරනු ලබයි. වත්කමක ධාරණ අගය, එහි අය කර ගත හැකි අගය ඉක්මවා ඇති අවස්ථාවකදී, වත්කම හානිකරණය වී ඇති බව සළකනු ලබන අතර එය එහි අය කර ගත හැකි අගය දක්වා ලියා හරිනු ලබයි. උපයෝජිත වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාලානුරූප වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවධානම් පිළිබඳ ප්‍රවර්තන වෙළඳපොල තක්සේරු කිරීම් පිළිබිඹු කරන බදු පෙර වට්ටම් අනුපාතය යොදා ගනිමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන අගය දක්වා වට්ටම කරනු ලබයි. විකිණීම සඳහා වූ පිරිවැය අඩු කළ සාධාරණ අගය තීරණය කිරීමේදී සුදුසු තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කර ඇත. එම ගණනය කිරීම්, තක්සේරු කිරීමේ ගුණාකාර හෝ වෙනත් සාධාරණ අගය දැක්වෙන දර්ශකයන් මගින් තහවුරු කර ඇත.

දේපළ මින් පෙර ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණනය ස්කන්ධය තුළ දක්වා ඇති අවස්ථාවකදී හැර, අඛණ්ඩ මෙහෙයුම් කටයුතු සඳහා වූ හානිකරණ අලාභයන්, ආදායම් ප්‍රකාශනය තුළ හානිකරණය වූ වත්කමේ කාර්යභාරය සමග අනුරූප වන වියදම් කාණ්ඩයන් තුළ හඳුනා ගනු ලබයි. මෙවැනි අවස්ථාවකදී, හානිකරණය, පෙර සිදු කළ ප්‍රත්‍යාගණන අගය වෙන තෙක් ස්කන්ධය තුළද හඳුනා ගනු ලබයි.

සෑම වාර්තාකරණ දිනකට වරක් පෙර හඳුනා ගත් හානිකරණ අලාභයන් තවදුරටත් නොපවතින බවට හෝ අඩු වී ඇති බවට දැක්වෙන ලක්ෂණයක් ඇත්දැයි තහවුරු කර ගැනීමට වත්කම් සඳහා තක්සේරු කිරීමක් සිදු කරනු ලබයි. එවැනි ලක්ෂණයක් පවතී නම්, සමාගම අය කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු ගත කරයි. පූර්ව හානිකරණ අලාභය හඳුනාගෙන තිබුණු කාලයේ සිට වත්කමේ අය කර ගත හැකි වටිනාකම තීරණය කිරීම සඳහා යොදා ගත් ඇස්තමේන්තුවල වෙනසක් පවතින අවස්ථාවකදී ඇත්නම් පමණක් පෙර හඳුනා ගත් හානිකරණ අලාභය අවලංගු කරනු ඇත. එම කරුණ එලෙස සිදු වන්නේ නම් වත්කමෙහි ධාරණ අගය, එහි අය කර ගත හැකි වටිනාකම දක්වා වැඩි වී ඇත. එම වැඩි වූ අගය, ක්ෂය කිරීම්වලින් ශුද්ධ වූ තීරණය කරනු ලද ධාරණ අගය ඉක්මවිය නොහැකි අතර පෙර වර්ෂවල වත්කම් සඳහා හානිකරණ අලාභ හඳුනා ගෙන නොමැත. වත්කම ප්‍රත්‍යාගණන අගයට පවත්වා ගෙන යන හා එම අවලංගු කිරීම ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සළකනු නොලබන අවස්ථාවකදී එවැනි අවලංගු කිරීමක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලබයි.

### 4.4.3 සාධාරණ අගය තක්සේරු කිරීම

සමාගම විසින් සියලු දේපළ, පිරියත සහ උපකරණ සාධාරණ අගයට තක්සේරු කරනු ලබයි. තක්සේරු කරනු ලබන දිනට වෙළඳපොල පාර්ශවකරුවන් අතර ක්‍රමවත් ගණුදෙනුවකදී වත්කමක් විකිණීමට ලැබෙන මිල හෝ වගකීමක් මාරු කිරීමට ගෙවන මිල, සාධාරණ අගය වේ. වත්කම විකිණීමට හෝ වගකීමක් මාරු කිරීමට අදාළ ගණුදෙනු සිදු වන පූර්ව නිගමනය මත සාධාරණ අගය තක්සේරු කිරීම පදනම් වන අතර එය:

- වත්කම් හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළඳපොල තුළ හෝ
- ප්‍රධාන වෙළඳපොල නොමැති විටෙක, වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසිදායකම වෙළඳපොල තුළ සිදු කරනු ලබයි.

ප්‍රධාන වෙළඳපොල හෝ වඩාත් වාසිදායකම වෙළඳපොල වෙත සමාගම පිවිසිය හැකි විය යුතුය.

වෙළඳපොල පාර්ශවකරුවන් ඔවුන්ගේ ආර්ථික හොඳම කැමැත්ත මත ක්‍රියා කරන බව සළකා බලමින් වත්කම හෝ වගකීම මිල කිරීමේදී යොදා ගනු ලබන උපකල්පනයන් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය තක්සේරු කරනු ලබයි.

යම් අවස්ථාවලට යෝග්‍ය වන පරිදි, තක්සේරු කිරීමේ තාක්ෂණයන් සමාගම භාවිතා කරන අතර ඒවා අදාළ නිරීක්ෂ්‍ය යෙදවුම් භාවිතය උපරිම කර ගැනීමින් සහ නිරීක්ෂ්‍ය නොවන යෙදවුම් භාවිතය අවම කරමින් සාධාරණ අගය තක්සේරු කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් දත්ත සඳහා වේ.

සාධාරණ අගය තක්සේරු කරනු ලබන හෝ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කරනු ලබන සියලු වත්කම් සහ වගකීම්, සාධාරණ අගය ධූරාවලිය තුළ වර්ග කර දක්වනු ලබන අතර එය සමස්ථයක් ලෙස සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා වැදගත් වන පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව පහතින් විස්තර කර ඇත.

පළමු මට්ටම - සක්‍රීය වෙළඳපොල තුළ අනන්‍ය වූ වත්කම් හෝ වගකීම් සඳහා ප්‍රකාශිත වෙළඳපොල මිල ගණන්

දෙවන මට්ටම - සෘජුවම හෝ වක්‍ර ආකාරයෙන් නිරීක්ෂ්‍ය කළ හැකි සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා වැදගත් වන පහළම මට්ටමේ යෙදවුම් සඳහා වූ තක්සේරු කිරීමේ තාක්ෂණයන්

තෙවන මට්ටම - නිරීක්ෂ්‍ය කළ නොහැකි සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා වැදගත් වන පහළම මට්ටමේ යෙදවුම් සඳහා වූ තක්සේරු කිරීමේ තාක්ෂණයන්

නිරන්තරයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගනු ලබන වත්කම් සහ වගකීම් සඳහා සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී වර්ගීකරණය නැවත තක්සේරු කරමින් ධූරාවලියේ මට්ටම් අතර මාරු කිරීම් සිදු වී තිබේදැයි සමාගම තීරණය කරයි. (සමස්ථයක් ලෙස සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා වැදගත් වන පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව).

පුනරාවර්තන වන සාධාරණ අගය තක්සේරු කිරීම් දෙකම සඳහා ප්‍රතිපත්තීන් සහ ක්‍රමවේදයන් සමාගමේ කළමනාකාරීත්වය විසින් තීරණය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණ තක්සේරු කිරීමේදී බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගනු ලබයි. සමාගමේ විගණන කමිටුව සමග සාකච්ඡා කර අනුමත කර ගැනීමෙන් පසුව කළමනාකරණය විසින් බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගැනීම පිළිබඳව තීරණය කරනු ලබයි. වෙළඳපොල දැනුම, කීර්තිය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතිගතභාවය පවත්වා ගන්නේද යන්න තෝරා ගැනීමේ දර්ශකයන් ලෙස ඇතුළත් කර ඇත.

## 4.5 පෙර ගෙවුම් කල්බදු වාරික

කල්බදු කාල සීමාව පුරාවට සමාන වාර්ෂික පදනම මත කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කරනු ලබන අතර කල්බදු කාල සීමාව පුරාවට සරල මාර්ග පදනම මත ආදායම් ප්‍රකාශනයට අය කරනු ලබයි.

## 4.6 තොග

යල්පිනු සහ හෙමින් චලනය වන අයිතමයන් සඳහා නියමිත වෙන්කිරීම් සිදු කිරීමෙන් පසුව පිරිවැය සහ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම අතරින් අඩු අගයට තොග තක්සේරු කරනු ලබයි. උපලබ්ධි වියදම් සහ/හෝ දැනට පවතින තත්ත්වයේ සිට විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන කිරීමේ පිරිවැය සඳහා ඉඩ දීමෙන් පසුව, ව්‍යාපාරයේ සාමාන්‍ය පරිපාටිය තුළ තොග විකිණිය හැකි මිල, ශුද්ධ උපලබ්ධි අගය වේ.

තොග සඳහා වූ සියලු වර්ගවල පිරිවැය, හරිත සාමාන්‍ය පදනමක් මත තීරණය කරනු ලබයි.

## 4.7 මූල්‍ය වත්කම් - හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

එක් ආයතනයක මූල්‍ය වත්කම් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීම් හෝ ස්කන්ධ උපකරණයක් සඳහා වර්ධනයක් සපයන කිසියම් ගිවිසුමක් මූල්‍ය උපකරණයක් වේ.

**මූල්‍ය වත්කම්**

**(අ) මූලික හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම**

ක්‍රමක්ෂය මත, වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගය මත සහ ලාභ අලාභ හරහා සාධාරණ අගය මත පසුකාලීන තක්සේරු කිරීමකදී මෙන් මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි.

මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණයන් මත හා ඒවා කළමනාකරණය කිරීම සඳහා වූ හෝටලයේ ව්‍යාපාර මොඩලය මත මූලික හඳුනා ගැනීමකදී මූල්‍ය වත්කම්

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

වර්ගීකරණය රඳා පවතිනු ලබයි. සමාගම විසින් ප්‍රායෝගික යෝග්‍යතාවය භාවිත කර ඇති වැදගත් මූල්‍යකරණ අංගයන් සඳහා ඇතුළත් නොවන වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා හැර, හෝටලය මූල්‍ය වත්කමක්, එහි සාධාරණ අගයට තක්සේරු කරනු ලබන අතර මූල්‍ය වත්කම, ලාභ අලාභ හරහා වන සාධාරණ අගයට නොමැති අවස්ථාවකදී ගණුදෙනු පිරිවැය ද එකතු කරයි. ප්‍රායෝගික යෝග්‍යතාවය භාවිත කර ඇති වැදගත් මූල්‍යකරණ අංගයන් සඳහා ඇතුළත් නොවන වෙළඳ ලැබිය යුතු මුදල්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 යටතේ ගණුදෙනු මිලකට තක්සේරු කරයි.

ක්‍රමක්ෂය පිරිවැය මත හෝ වෙනත් විස්තීරණ ආදායම හරහා වූ සාධාරණ අගය මත වර්ගීකරණය කිරීමට හා තක්සේරු කිරීමට නියමිත මූල්‍ය වත්කමක් සඳහා එය ගෙවිය යුතු මූලික මුදල මත වූ 'මූලික කොටස සහ පොලී පමණක් ගෙවීම්' යන මුදල් ප්‍රවාහයන් සඳහා වර්ධනයක් ලබා දීම අවශ්‍ය වේ.

මුදල් ප්‍රවාහයන් ජනිත කිරීම සඳහා වන මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරය, මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා වූ හෝටලයේ ව්‍යාපාර මොඩලය තුළ පෙන්නුම් කරයි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයෙන්, මූල්‍ය වත්කම් විකිණීමෙන් හෝ දෙකෙන්ම මුදල් ප්‍රවාහයන් හට ගන්නේදැයි ව්‍යාපාර මොඩලය තීරණය කරනු ඇත.

රෙගුලාසි හෝ වෙළඳපොල තුළ වූ සම්මුතීන් මගින් ස්ථාපිත කළ කාල රාමුවක් තුළ මූල්‍ය වත්කම් භාරදීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම්, වෙළඳ දිනය තුළ එනම් හෝටලය වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට කටයුතු කරන දිනය තුළ හඳුනා ගනු ලබයි

**(ආ) පසුකාලීන තක්සේරු කිරීම**

පසුකාලීන තක්සේරු කිරීමේ අරමුණ සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ 4 ක් සඳහා වර්ගීකරණය කරනු ලබයි.

i. ක්‍රමක්ෂය මත වූ මූල්‍ය වත්කම් (ණය උපකරණ)
ii. සම්මුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීය කිරීම සමග වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් (ණය උපකරණ)
iii. පොත්වලින් ඉවත් කිරීම මත සම්මුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීය කිරීම සිදු නොකිරිමත් සමග වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගයට තෝරා ගනු ලැබූ මූල්‍ය වත්කම් (ස්කන්ධ උපකරණ)
iv. ලාභ හෝ අලාභ හරහා වූ සාධාරණ අගයකට වන මූල්‍ය වත්කම්

**ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය උපකරණ)**

හෝටලය සඳහා මෙම කාණ්ඩය ඉතා වැදගත් වේ. පහත කොන්දේසි දෙක සපුරා ඇති නම් හෝටලය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයිඃ

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් රඳවා ගැනීමට ව්‍යාපාර මොඩලය තුළ මූල්‍ය වත්කම පවත්වා ගෙන යනු ලබයි. සහ
- ගෙවිය යුතු මූලික මුදල මත වූ 'මූලික කොටස සහ පොලි පමණක් ගෙවීම්' යන මුදල් ප්‍රවාහයන් සඳහා, විශේෂිත දිනයන්හීදී, මූල්‍ය වත්කමෙහි ගිවිසුම් ගත නියමයන් වර්ධනයක් සපයනු ලබයි.

ක්‍රමක්ෂය පිරිවැය මත වූ මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කරනු ලබන අතර එය හානිකරණයට යටත් වේ. වත්කම පොත්වලින් ඉවත් කිරීමේදී, නවීකරණය කිරීමේදී හෝ හානිකරණය කිරීමේදී හඳුනා ගන්නා ලාභයන් සහ අලාභයන් ලාභ අලාභ තුළ හඳුනා ගනු ලබයි.

ක්‍රමක්ෂය පිරිවැය මත වූ හෝටලයේ මූල්‍ය වත්කම් තුළ මුදල් සහ බැංකු ශේෂයන්, කෙටිකාලීන ආයෝජනයන්, සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්, වෙළඳ ලැබිය යුතු මුදල් සහ ජංගම නොවන ආයෝජනයන්ගෙන් සමන්විත වේ.

වෙනත් විස්තීර්ණ ආදායම හරහා වූ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය උපකරණ), වෙනත් විස්තීර්ණ ආදායම හරහා වූ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ස්කන්ධ උපකරණ) සහ ලාභ අලාභ හරහා වූ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් හෝටලය වර්ගීකරණය කර නොමැත.

**(ඇ) හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම**

මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් පවතී නම් එය) මූලික වශයෙන් පොත්වලින් ඉවත් කරන්නේඃ

- වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට හැකි අයිතිය කල් ඉකුත් වී තිබීම හෝ
- හෝටලය විසින්, වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති එහි අයිතිය මාරු කිරීම හෝ තුන්වන පාර්ශවයක් සඳහා 'පසු කර යාමක්' ('pass-through') සඳහා එකගවීමක් යටතේ ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ලැබෙන මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන්ම ගෙවීමට ඇති වගකීමක් සම්බන්ධයෙන් උපකල්පනය කර තිබීම සහ

(අ) හෝටලය විසින් වත්කමෙහි සියලුම අවධානම් සහ ප්‍රතිලාභ සාරානුකූලව මාරු කිරීම

(ආ) හෝටලය විසින් වත්කමෙහි සියලුම අවධානම් සහ ප්‍රතිලාභ සාරානුකූලව මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන නමුත් වත්කමෙහි පාලනය මාරු කර තිබීම. යන දෙකෙන් යමක් සිදු කර තිබීම

හෝටලය විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති එහි අයිතිය මාරු කිරීමේදී හෝ 'පසු කර යාමක්' ('pass-through') සඳහා එකගවීමක් සඳහා එළඹ තිබෙන අවස්ථාවකදී, හිමිකාරීත්වය සතු අවධානම් සහ ප්‍රතිලාභයන් රඳවා තබා ගන්නේ නම් සහ ඒ කුමන ප්‍රමාණයකටද යන්න ඇගයීමට ලක් කරනු ලබයි.

වත්කමෙහි සියලුම අවධානම් සහ ප්‍රතිලාභ සාරානුකූලව මාරු කිරීම හෝ රඳවා ගැනීම එය සිදු කර නොතිබුණ අවස්ථාවකදී, මෙන්ම වත්කමක් පාලනය කිරීම ද පවරා නොතිබුණ අවස්ථාවකදී හෝටලය එහි අඛණ්ඩ සහභාගීත්වයේ ප්‍රමාණයට මාරු කළ වත්කම අඛණ්ඩව හඳුනා ගනු ලබයි. එම අවස්ථාවේදී, ඒ හා සම්බන්ධ වගකීමද හෝටලය හඳුනා ගනු ලබයි. හෝටලය විසින් රඳවා ගෙන ඇති අයිතිය සහ බැඳියාව පිළිබිඹු කිරීමේ පදනම මත මාරු කළ වත්කම සහ ඒ හා සම්බන්ධ වගකීම තක්සේරු කරනු ලබයි.

මාරු කළ වත්කම සඳහා වූ ඇපකරුවකු ලෙස සලකනු ලබන අඛණ්ඩ සහභාගීත්වය, වත්කමක මුල් ධාරණ අගයේ අවම වටිනාකමට සහ නැවත ගෙවීම සඳහා හෝටලය ඉල්ලුම් කළ හැකි ප්‍රතිෂ්ඨාවෙහි උපරිම අගයට තක්සේරු කරනු ලබයි.

**(ඇ) හානිකරණය**

ලාභ අලාභ හරහා සාධාරණ අගයට නොතැබූ සියලු ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභයන් සඳහා දීමනාවක්, හෝටලය විසින් හඳුනා ගනු ලබයි. අපේක්ෂිත ණය අලාභයන්, ගිවිසුම්වලින් හිඟ වූ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සහ හෝටලය විසින් ලැබෙන බවට අපේක්ෂා කරන සියලු මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත පදනම් වන අතර ඒවා මුල් සඵල පොලී අනුපාතයේ ආසන්නතාවයට වට්ටම් කරනු ලබයි. අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් තුළ රඳවා තබා ගත් ඇපකර හෝ ගිවිසුම්ගත නියමයන් තුළ අන්තර්ගත අනෙකුත් ණය වැඩි දියුණු කිරීම් විකිණීම තුලින් උපයන මුදල් ප්‍රවාහයන් ඇතුළත් වේ.
ලැබිය යුතු වෙළඳ ණය මුදල් වෙනුවෙන් හෝටලය විසින් අපේක්ෂිත ණය අලාභයන් ගණනය කිරීම සඳහා සරල ප්‍රවේශයක් යොදා ගනු ලබයි. එම නිසා, හෝටලය ණය අවධානමේ වෙනස්වීම් පිළිබඳ නිරීක්ෂණය නොකර ඒ වෙනුවට සෑම වාර්තාකරණ දිනට අපේක්ෂිත ණය අලාභයන්හි ජීව කාලය මත පදනම්ව අලාභ දීමනාවක් හඳුනා ගනු ලබයි. හෝටලය විසින් ණයගැතියන්ට සහ ආර්ථික පරිසරයට විශේෂිත වූ ඉදිරි අනාගතයක් සඳහා වූ කරුණු ගලපා එහි ඓතිහාසික ණය අලාභ අද්දැකීම පදනම් කර ගනිමින් වෙන්කිරීම් අනුකෘතියක් ස්ථාපිත කර තිබුණි.

## මූල්‍ය වගකීම්

**(අ) මූලික හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම**

මූලික හඳුනා ගැනීමේදී, සුදුසු පරිදි, ලාභ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම්, ණය මුදල්, ණය ගැනීම්, ගෙවිය යුතු මුදල්, හෝ සඵල හෙජින් කටයුත්තකදී හෙජින් උපකරණ ලෙස නම් කර ඇති ව්‍යුත්පන්නයන් ලෙස මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත.

ණය සහ ණය ගැනීම් හා ගෙවිය යුතු මුදල් ඇති අවස්ථාවක, සෘජුවම සම්බන්ධ වූ ගණුදෙණු පිරිවැයෙන් ශුද්ධ අගයකට සහ මූලික වශයෙන් සාධාරණ අගයට සියලු මූල්‍ය වගකීම් හඳුනා ගනු ලබයි.

බැංකු අයිරාවන්ද ඇතුළත් වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්, සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්, හෝටලයේ මූල්‍ය වගකීම් යටතට ගනු ලබයි.

ලාභ අලාභ හරහා වූ සාධාරණ අගයට මූල්‍ය වගකීම් සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ හෝටලය සතුව නොපවතියි.

**(ආ) පසුකාලීන තක්සේරු කිරීම**

පහතින් විස්තර කර ඇති පරිදි මූල්‍ය වගකීම් තක්සේරු කිරීම එහි වර්ගීකරණය මත රඳා පවතිනු ලබයි.

**ණය සහ ණය ගැනීම්**

මෙය හෝටලයට වඩාත්ම අදාළ කාණ්ඩයකි. මූලික හඳුනා ගැනීමට පසුව, පොලි සහිත ණය සහ ණය ගැනීම්, සඵල පොලී අනුපාතික ක්‍රමවේදය තෝරා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව තක්සේරු කරනු ඇත. සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා මෙන්ම වගකීම් හඳුනාගැනීමෙන් ඉවත්කිරීමකදී, අදාළ ලාභ සහ අලාභ ප්‍රකාශණය තුළ ඉපැයීම් හා අලාභ හඳුනා ගනු ලබයි.

අත්පත් කර ගැනීම මත වූ යම් වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලී අනුපාතයේ අන්තර්ගත කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සඵල පොලී අනුපාතය ක්‍රමක්ෂය කිරීම, ලාභ අලාභ ප්‍රකාශනය තුළ මූල්‍ය පිරිවැය ලෙස ඇතුළත් කර ඇත. පොලී සහිත ණය මුදල් සහ ණය ගැනීම් සඳහා සාමාන්‍ය යෙන් මෙම කාණ්ඩය යොදා ගනු ලබයි.

**(ඇ) පොත්වලින් ඉවත් කිරීම**

වගකීම යටතේ වගකීම නිදහස් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් පිරුණු විට මූල්‍ය වගකීම හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලබයි. සාරානුකූලව වෙනස් වූ නියමයන් හෝ සාරානුකූලව නවීකරණය කළ දැනට පවතින වගකීමකට අදාළ නියමයන් යටතේ එකම ණයහිමියාගෙන් ලද තවත් එකකින් දැනට පවතින මූල්‍ය වගකීමක් ප්‍රතිස්ථාපනය කරන අවස්ථාවේදී එවැනි හුවමාරුවක් හෝ නවීකරණය කිරීමක් මුල් වගකිම පොත්වලින් ඉවත් කිරීමක් ලෙස සළකනු ලබන අතර නව වගකීමක් ලෙස හඳුනාගැනීමකි. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ අලාභ ප්‍රකාශණයෙහි හඳුනා ගනු ලබයි.

**මූල්‍ය උපකරණ හිලව් කිරිම**

හඳුනා ගත් අගයන් හිලව් කිරීම සඳහා වර්තමානයේදී බලාත්මක වන නීතිමය අයිතියක් ඇත්නම් සහ වත්කම් උපලබ්ධි කිරීමට හා වගකීම් පියවීම සඳහා එක්වරම ශුද්ධ පදනම මත පියවීමට අභිලාෂයක් ඇත්නම් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කිරීම සිදු කරන අතර ශුද්ධ අගය, මූල්‍ය තත්ත්ව ඒකාබද්ධ ප්‍රකාශනය තුළ වාර්තා කරනු ලබයි.

## 4.8 මුදල් සහ බැංකු ශේෂයන්

මුදල් සහ බැංකු ශේෂයන්, අතැති මුදල් සහ බැංකුවේ ඇති ශේෂයන් ලෙස නිර්වචනය කරයි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ තුළ අතැති මුදල් සහ ගෙවිය යුතුව පවතින බැංකු අයිරාවන්වලින් ශුද්ධ වූ බැංකුවේ ඇති තැන්පතු ඇතුළත් වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

එමෙන්ම කෙටි කාලීන කල්පිරීම් සහිත ආයෝජනයන් එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් ආයෝජනයන් ද මුදල් සමාන දෑ ලෙස සළකනු ලබයි.

### 4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, ස්කන්ධය ලෙස වර්ග කරනු ලබයි. ස්කන්ධ උපකරණ නිකුත් කිරීමේ සෘජු වියදම්වලින් ශුද්ධ වූ, ලැබුණු හෝ ලැබිය යුතු, මුදල් හෝ වෙනත් සම්පත්වල සාධාරණ අගයට මෙම ස්කන්ධ උපකරණ තක්සේරු කරනු ලබයි.

### 4.10 විශ්‍රාමික ප්‍රතිලාභ බැඳියාව

#### 4.10.1 නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

අපේක්ෂිත ඒකක ණය ක්‍රමය යොදා ගනිමින් ආයුගණක තක්සේරු කිරීම මත පදනම්ව ඇස්තමේන්තුගත කළ වාර්තාකරණ දිනට නිර්වාචිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනා ගත් වගකීම, නිරූපනය කරයි. ආයුගණක තක්සේරු කිරීම්, වට්ටම් අනුපාතයන් සහ අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන සිදුකිරීම හා සම්බන්ධ වේ. මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් සඳහා, නිර්වාචිත ප්‍රතිලාභ වගකීම වඩාත් සංවේදී වේ. මෙම ප්‍රතිලාභයන් වෙත බාහිරව අරමුදල් සපයා නොමැත.

නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම තුලින් හට ගන්නා සියලු ආයුගණක ලාභ සහ අලාභ සමාගම වෙනත් විස්තීර්ණ ආදායම තුළ වහාම හඳුනා ගනු ලබයි.

කෙසේ නමුත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් සිදු කිරීමේ පනත යටතේ, පාරිතෝෂික ගෙවීම සඳහා වූ වගකීම, වර්ෂ 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීම මත පමණක් හට ගනු ලබයි.

#### 4.10.2 නිර්වාචිත දායකත්ව සැලැස්ම

පසු - සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් යටතේ ආයතනයක් ස්ථාවර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක් වෙත ගෙවනු ලබන හා තවදුරටත් මුදලක් ගෙවීම සඳහා නීතිමය හෝ අර්ථසාධක වගකීමක් නොමැති නම් එය නිර්වාචිත දායකත්ව සැලැස්මක් වේ. නිර්වාචිත දායකත්ව සැලැස්ම් සඳහා දායකත්වයන් වෙනුවෙන් වූ වගකීම, තුළ සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනා ගනු ලබන අතර එය සේවකයින් සපයන ලද සේවාවන්ට අදාළ කාල පරිච්ඡේදයන්ට අදාළව විස්තීර්ණ අදායම් ප්‍රකාශනය තුළ දක්වා ඇත.

**(අ) සේවක අර්ථසාධක අරමුදල**

සමාගම සහ සේවකයන් විසින් සෑම සේවකයෙකුගේම වැටුපෙන් පිළිවෙලින් සියයට 12 ක් හා සියයට 8 ප්‍රතිශතයක් බැගින් අනුමත අර්ථසාධක අරමුදලට දායක කරනු ලබයි.

**(ආ) සේවක භාරකාර අරමුදල**

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුපෙන් සියයට 3 ක ප්‍රතිශතයක් බැගින් සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

### 4.11 මූල්‍ය වගකීම්

#### 4.11.1 මූලික හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම් හෝ ගිවිසුම්ගත විදිවිධානයන්ගේ හරය සහ මූල්‍ය වගකීම්වල නිර්වචනයන් මගින් ඇතිවන වෙනත් මූල්‍ය වගකීම් ලෙස සමාගම මූල්‍ය වගකීම් වර්ගීකරණය කරනු ලබයි. මූල්‍ය වගකීම සඳහා වූ ගිවිසුම්ගත වෙන්කිරීම් වෙනුවෙන් සමාගම පාර්ශවයක් වන අවස්ථාවේදී සමාගම, මූල්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලබයි.

**අ) ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම්**

ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම් තුළ වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වගකීම් හෝ මූලික හඳුනා ගැනීමේදී එලෙස නම් කර ඇති මූල්‍ය වගකීම් අන්තර්ගත වේ. මූලික හඳුනා ගැනීමට පසුව, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම්, සාධාරණ අගයට තක්සේරු කරන අතර එහි වෙනස්වීම් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනියි. මූලික හඳුනාගැනීමේදී, අත්පත් කර ගැනීම මත සෘජුවම සම්බන්ධ ගණුදෙනු පිරිවැය, දරන අවස්ථාවේදී ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලබයි. මූලික හඳුනා ගැනීමකදී ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වගකීම් ලෙස නම් කිරීම සඳහා වූ නිර්නායකයන්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් සඳහා වූ ඒවාම වේ.

**ආ) වෙනත් මූල්‍ය වගකීම්**

තැන්පතු, සමාගම විසින් නිකුත් කළ ණය සහ වෙනත් ණයට ගත් මුදල් යනාදිය ඇතුළත් වෙනත් මූල්‍ය වගකීම්, අත්පත් කර ගැනීම සඳහා සෘජුවම සම්බන්ධ වන ගණුදෙනු පිරිවැය අඩු කරන ලද සාධාරණ අගයට මූලිකව තක්සේරු කරන අතර පසුව, සඵල පොලී අනුපාතිකය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි. නිකුත් කිරීම මත වූ යම් වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලී අනුපාතියේ අවශ්‍යම කොටසක් වන පිරිවැයන් සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරයි.

#### 4.11.2 මූල්‍ය වගකීම් පොත්වලින් ඉවත් කිරීම

වගකීමක් සම්බන්ධයෙන් වූ බැඳියාව පියවූ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් පොත්වලින් ඉවත් කරයි. සාරානුකූලව වෙනස් වූ නියමයන් මගින් අදාළ ණයහිමියාම වෙනත් එකකින් දැනට පවතින මූල්‍ය වගකීම ප්‍රතිස්ථාපනය කර ඇති අවස්ථාවක හෝ දැනට පවතින වගකීමක නියමයන් සාරානුකූලව නවීකරණය කර ඇත්නම් එම හුවමාරුව හෝ නවීකරණය, මුල් වගකීම හඳුනා ගැනීම පොත්වලින් ඉවත් කිරීම මෙන්ම නව වගකීම හඳුනා ගැනීමක් ද ලෙස සළකනු ලබයි. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලබයි.

### 4.12 වෙන්කිරීම්

පූර්ව සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස ඇති වන ඇතිවන වර්තමාන බැඳියාවක් (නීතිමය හෝ අර්ථසාධක) පවතින සහ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභවලින් සමන්විත සම්පත්වල පිටට

ගලා යාමක් අවශ්‍ය විය හැකි හා වගකීමක ප්‍රමාණය පිළිබඳව තාර්කික ඇස්තමේන්තුවක් සැකසිය හැකි අවස්ථාවකදී, වෙන්කිරීම් හඳුනා ගනු ලබයි. යම් වෙන්කිරීමක් සම්බන්ධයෙන් වූ වියදමෙන්, යම් ආපසු ගෙවීමක් වේ නම් එය අඩු කර විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරනු ලබයි.

### 4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යටතේ නියම කර ඇති ආකාරයට වක්‍ර ක්‍රමය යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත. අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ බැංකු අයිරාවන්වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 4.14 අංශීය තොරතුරු

වෙනත් අංශයන්වලින් වෙනස්ව පවතින අවධානම් සහ ප්‍රතිලාභයන් මත පදනම්ව, සේවාවන් සැපයීමේ නිරතව සිටින සුවිශේෂී වූ අංගයක්, අංශයක් ලෙස හඳුන්වයි. සමාගම සතුව සුවිශේෂී වූ අංගයක් ලෙස හඳුනා ගැනීමට අංශයක් නොමැති අතර සියලු මෙහෙයුම් කටයුතු එකම අංශයක් ලෙස සළකනු ලබයි.

### 4.15 නිකුත් කළ නමුත් තවමත් බලාත්මක නොවූ ප්‍රමිතීන්

2024 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබෙන, අදාළ වන සියලුම ප්‍රමිතීන් සහ අර්ථදැක්වීම් සමාගම විසින් අනුගමනය කර තිබුණි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| | 2024.12.31<br>රු. '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| **5. ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම් මගින් උපැයූ ආදායම** | | |
| **5.1** ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම් මගින් උපැයූ දළ ආදායම | **5,445,959** | 4,389,326 |
| අඩුකලා: සංචාරක සංවර්ධන බද්ද | **(52,870)** | (42,575) |
| ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම් මගින් උපැයූ ශුද්ධ ආදායම | **5,393,089** | 4,346,751 |

ආදායම ගණනය කරන විට එකතු කළ අගය මත බදු වට්නාකම වූ රු. මිලියන 1,033 (2023- රු. මිලියන 720) අඩු කර දක්වා ඇත.

### 5.2 ආදායම

| | | |
|---|---|---|
| කාමරවලින් ඉපැයූ ආදායම | **1,848,222** | 1,137,293 |
| ආහාර සහ පාන වර්ගවලින් ඉපැයූ ආදායම | **3,342,408** | 3,034,962 |
| වෙනත් මෙහෙයුම් දෙපාර්තමේන්තුවලින් ඉපැයූ ආදායම | **56,153** | 55,845 |
| සමාජ ආරක්ෂණ බදු | **146,306** | 118,651 |
| | **5,393,089** | 4,346,751 |

## 6. වෙනත් ඉපැයීම් සහ අලාභ

| | | |
|---|---|---|
| පිරියත සහ උපකරණ අපහරණය කිරීමෙන් ලද ලාභය | **10,674** | 3,188 |
| කඩ සාප්පු කුලී ආදායම් | **15,168** | 15,673 |
| උපලබ්ධි නොවූ විනිමය ඉපැයීම් / (අලාභ) | **35** | 2,955 |
| උපලබ්ධි වූ විනිමය ඉපැයීම් | **(82)** | (13,668) |
| විවිධ ආදායම් | **2,826** | 5,027 |
| | **28,621** | 13,175 |

## 7. මූල්‍ය ආදායම

| | | |
|---|---|---|
| **පොලී ආදායම - ණය මුදල් සහ ලැබිය යුතු මුදල්** | | |
| භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලිය | **4,941** | 961 |
| සේවක ණය මත වූ පොලිය | **436** | 609 |
| නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා වූ පොලිය | **30** | 409 |
| ස්ථාවර තැන්පතු සඳහා වූ පොලිය | **2,623** | 2,507 |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ ප්‍රතිස්ථාපන සංචිතය සඳහා වූ පොලී ආදායම | **2,712** | 13,551 |
| | **10,740** | 18,037 |

## 8. මූල්‍ය වියදම්

| | | |
|---|---|---|
| බැංකු අයිරා පොලිය | **209,850** | 296,254 |
| කාලීන ණය පහසුකම | **379,638** | 299,097 |
| කල්බදු වත්කම් | **1,008** | 3,195 |
| | **590,497** | 598,546 |

## 9. කාල පරිච්ඡේදය සඳහා ලාභය

| | 2024.12.31<br>රු. '000' | 2022.12.31<br>රු. '000' |
|---|---|---|
| පහත වියදම් ඇතුලු සියලු වියදම් අය කර ගැනීමෙන් පසුව කාල පරිච්ඡේදය සඳහා ලාභය වාර්තා කර ඇතඃ | | |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **24,515** | 18,806 |
| විගණකයන්ගේ වේතනය - සමාගම | **1,952** | 1,200 |
| - කොළම්බො හිල්ටන් | **2,600** | 2,240 |
| ක්ෂය කිරීම් | **560,672** | 367,193 |
| සේවක වියදම් (පහත සේවක ප්‍රතිලාභ සැලසුම් වියදම් ඇතුලුව) | **740,983** | 606,880 |
| - නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම වියදම - පාරිතෝෂිකය | **28,460** | 22,462 |
| - නිර්වාචිත දායක සැලසුම් වියදම් - සේ.අ.අ සහ සේ.භා.අ | **87,842** | 75,780 |
| කාණ්ඩායම් සේවා සහ ප්‍රතිලාභ ගාස්තු - හිල්ටන් ඉන්ටර්නැෂනල් | **105,273** | 85,008 |
| නෛතික ගාස්තු | **12,057** | 6,337 |
| සමාජ ආරක්ෂණ දායක බදු වියදම් | **276,784** | 349,175 |

### 9.1 වියදම් නැවත වර්ගීකරණය

පෙර වසරවලදී, ආදායම් මධ්‍යස්ථානවලට අදාළ සේවක ආපනශාලාවේ පිරිවැය, විකුණුම් පිරිවැයට නැවත වර්ගීකරණය කරන ලද අතර, එය අත්වැරදීමකින් වෙනත් මෙහෙයුම් වියදම්වලට බැර කර තිබූ අතර, මුල් පිරිවැය පරිපාලන වියදම් යටතේ සටහන් කර තිබුණි. මීට අමතරව, 2024 සිට, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ආදායම සමඟ දළ වශයෙන් ගණනය කර ඇති අතර, අනුරූපී පිරිවැය වත්මන් සහ පෙර වසර දෙකෙහිම පරිපාලන වියදම් යටතේ ගැලපීම් කර ඇත. මෙය මෙම වසරේදී නිවැරදිව නැවත වර්ගීකරණය කර ඇත.

| | පෙර සටහන් කර ඇති පරිදි | නිවැරදි කිරීමේ බලපෑම | නැවත සකස් කරන ලද |
|---|---|---|---|
| මෙහෙයුම් වියදම් | 616,505 | 82,043 | 698,548 |
| පරිපාලන වියදම් | 867,590 | (82,043) | 785,547 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | - | 118,651 | 118,651 |
| ප්‍රතිවර්ගීකරණය කරන ලද පරිපාලන වියදම් | 867,590 | 36,607 | 904,197 |

## 10. ආදායම් බදු වියදම

| | නිවැරදි කිරීමේ බලපෑම | නැවත සකස් කරන ලද |
|---|---|---|
| පෙර වර්ෂවල ඇතිවූ අධි/ඌන වෙන්කිරීම් | - | (17,731) |
| විලම්භිත බදු (ආදායම)/ වියදම | 71,490 | (77,923) |
| | 71,490 | (95,654) |

2024 වර්ෂය සඳහා අදාළ ආදායම් බදු අනුපාතය 30% කි. විලම්භිත බදු සඳහා 30% ක අනුපාතය භාවිතා කර ඇති අතර, ඉන් ඇතිවන බලපෑම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත.

**10.1** 2024 දෙසැම්බර් 31 දිනෙන් සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ බදු අය කළ හැකි ලාභය සහ ගිණුම්කරණ ලාභය අතර සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| | 2024.12. 31.<br>රු. '000' | 2023.12. 31<br>රු. '000' |
|---|---|---|
| ආදායම් බදුවලට පෙර ගිණුම්කරන ලාභය | **(268,347)** | (784,367) |
| සමාහාර ප්‍රතික්ෂේපිත අයිතමයන් | **618,814** | 383,516 |
| සමාහාර අනුදත හැකි වියදම් | **(733,631)** | (625,103) |
| වෙළඳ ලාභය සහ වෙනත් මූලාශ්‍රවලින් ලද ආදායම් සියයට 30 කින් | **(383,163)** | (1,025,954) |
| වෙනත් මූලාශ්‍රවලින් ලද ආදායම් සියයට 30 කින් | **-** | - |
| මුළු බදු අය කළ හැකි ලාභය | **-** | - |
| බදු අය කළ හැකි ලාභය | **-** | - |
| | | |
| වෙනත් මූලාශ්‍රවලින් ලද ආදායම්වලින් බදු අය කිරීම සියයට 30 කින් | **-** | - |
| ප්‍රවර්ථන වර්ෂයේ මුළු බදු වියදම | **-** | - |

## 10.2 විලම්භිත බදු

| | | |
|---|---|---|
| **විලම්භිත බදු ඇති වෙන ආකාරයඃ** | | |
| - තාවකාලික වෙනස්කම් හටගැනීම හා ප්‍රතිවර්තනය කිරීම (සටහන 24) | **71,490** | (77,923) |
| මුළු විලම්භිත බදු අයකිරීම | **71,490** | (77,923) |

## 10.3 ඉදිරියට ගෙන ආ බදු අලාභ

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ බදු අලාභ | **14,048,890** | 13,057,369 |
| (-) වර්ෂය තුළ කල් ඉකුත් වූ අලාභ | **(9,937,175)** | - |
| වර්ෂය තුළ ඇති වූ බදු අලාභ | **383,163** | 1,025,954 |
| ප්‍රවර්තන වර්ෂය තුල හිලව් කළ බදු අලාභ - ආයෝජන ආදායමෙන් | **-** | (34,433) |
| අනාගත කාල පරිච්ඡේදයන් සඳහා ඉදිරියට ගෙන ආ බදු අලාභ | **4,494,878** | 14,048,890 |

## 11. කොටසක ඉපැයුම - මූලික

සාමාන්‍ය කොටස්හිමියන්ට හිමි වර්ෂයේ ලාභය, වර්ෂය තුළ ඉතිරිව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යා වෙන් බෙදා මූලික කොටසක ඉපැයුම ගණනය කරනු ලබයි.

| | 2024.12.31<br>රු. '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| සාමාන්‍ය කොටසක් සඳහා ලාභය | **(0.17)** | (0.01) |
| **ලවය සඳහා යොදා ගනු ලබන අගය** | **රු. '000** | **රු. '000** |
| සාමාන්‍ය කොටස්හිමියන්ට හිමි වර්ෂයේ ලාභය | **(351,638)** | (15,873) |
| **හරය සඳහා යොදා ගනු ලබන අගය** | **සංඛ්‍යාව '000** | **සංඛ්‍යාව '000** |
| කොටසක මූලික ලාභය ගණනය කිරීමේ අරමුණ සඳහා වූ හරිත සාමාන්‍යය කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | **2,046,646** | 2,046,646 |

## 12. දේපළ, පිරියත සහ උපකරණ

| | කල්බදු ඉඩම්වල වූ ගොඩනැගිලි රු. '000 | පිරියත සහ යන්ත්‍ර රු. '000 | හොටල් ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් රු. '000 | මෝටර් වාහන රු.'000 | ශිතකරන සහ මුළුතැන්ගේහි උපකරණ රු. '000 | රූපවාහිනී යන්ත්‍ර සහ පරිගණක රු. '000 | මෙහෙයුම් උපකරණ රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය** | | | | | | | | |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,123,575 | 407,765 | 564,166 | 56,020 | 474,650 | 52,060 | 151,330 | 7,829,566 |
| අපහරණය කිරීම් | - | - | (2,272) | - | (593) | (978) | - | (3,844) |
| වර්ෂය තුළ එකතු කිරීම් | 48,754 | 10,315 | 52,266 | - | 3,844 | 29,260 | 49,403 | 193,842 |
| නොනිමි වැඩවලින් මාරු කිරීම - කාමර ප්‍රතිසංස්කරණය ප්‍රාග්ධනීකරණය | 2,085,124 | | 204,743 | - | - | - | - | 2,289,866 |
| නොනිමි වැඩවලින් මාරු කිරීම - ගොඩනැගිලි ව්‍යුහය | 1,123,560 | | | | | | | 1,123,560 |
| ප්‍රත්‍යාගණන ලාභය | 1,396,705 | - | - | 107,785 | | | 124,683 | 1,629,173 |
| නොනිමි වැඩ වලට මාරු කිරීම | (318,342) | | | | | | | (318,342) |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | (486,616) | | | (56,020) | | | (142,216) | (684,852) |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,972,759 | 418,080 | 818,903 | 107,785 | 477,901 | 80,342 | 183,200 | 12,058,970 |
| අපහරණය කිරීම් | - | (818) | (7,378) | - | (3,337) | (3,018) | - | (14,550) |
| වර්ෂය තුළ එකතු කිරීම් | 18,391 | 7,936 | 43,744 | - | 34,522 | 42,940 | 23,855 | 171,388 |
| නොනිමි වැඩවලින් මාරු කිරීම - කාමර ප්‍රතිසංස්කරණය ප්‍රාග්ධනීකරණය | 2,194,388 | - | 179,278 | - | | 22,691 | | 2,396,358 |
| නොනිමි වැඩවලින් මාරු කිරීම - ගොඩනැගිලි ව්‍යුහය | 692,862 | | | | | | | 692,862 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **12,878,400** | **425,199** | **1,034,548** | **107,785** | **509,086** | **142,956** | **207,055** | **15,305,028** |
| **සමුච්චිත ක්ෂය කිරීම්** | | | | | | | | |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 365,629 | 73,533 | 166,047 | 42,015 | 97,361 | 30,017 | 125,564 | 900,166 |
| වර්ෂය සඳහා අයකිරීම් | 120,987 | 30,862 | 61,167 | 14,005 | 35,678 | 12,331 | 16,652 | 291,682 |
| අපහරණය කිරීම | - | - | (682) | - | (133) | (585) | - | (1,400) |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | (486,616) | | | (56,020) | | | (142,216) | (684,852) |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 104,395 | 226,532 | - | 132,905 | 41,763 | - | 505,595 |
| වර්ෂය සඳහා අයකිරීම් | 207,369 | 31,533 | 90,922 | 26,946 | 37,756 | 24,326 | 63,722 | 482,573 |
| අපහරණය කිරීම | - | (327) | (2,941) | - | (1,001) | (2,414) | | (6,683) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **207,369** | **135,600** | **314,512** | **26,946** | **169,661** | **63,672** | **63,722** | **981,481** |
| **ලියා හල අගය** | | | | | | | | |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,757,946 | 334,232 | 398,119 | 14,005 | 377,289 | 22,043 | 25,766 | 6,929,400 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,972,759 | 313,685 | 592,371 | 107,785 | 344,996 | 38,579 | 183,200 | 11,553,379 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **12,671,031** | **289,599** | **720,036** | **80,839** | **339,425** | **79,284** | **143,333** | **14,323,547** |

හෝටයේ දේපළ, පිරියත සහ උපකරණවල සම්පූර්ණ අයිතිය සහ පාලනය, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සතු වේ.

**12.2** 1998 වසරේදී ලෝක වෙළඳ මධ්‍යස්ථානය සහ හිල්ටන් හෝටලය යා කරන පාලමක් ඩොලර් 360,000ක වියදමින් ඉදිකරන ලදී. ඕවසීස් රියල්ටි ලිමිටඩ් සහ හිල්ටන් ඉන්ටර්නැෂනල් විසින් පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 180,000ක් සහ එක්සත් ජනපද ඩොලර් 90,000ක් දායක වූ අතර, ඉතිරි මුදල සමාගම විසින් දායක විය. සමාගම විසින් දැරූ එක්සත් ජනපද ඩොලර් 90,000ක් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිල්ල යටතේ ප්‍රාග්ධනීකරණය කර ඇත.

**12.3** 2019 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගම, දේපළ පිරියත සහ උපකරණ අගය මැණීමේදී ප්‍රත්‍යාගණන ක්‍රමවේදය භාවිත කරනු ලබයි. සමාගම සතු දේපළ පිරියත සහ උපකරණවල සාධාරණ අගය තීරණය කිරීම සඳහා 2023 මුදල් වර්ෂය තුළ ජී. ඩබ්ලිව්. ජී. අබේගුණවර්ධන නැමැති බලය ලත් ස්වාධීන තක්සේරුකරු විසින් සිදු කළ ප්‍රත්‍යාගණනය තුළින් ගොඩනැගිලි, මොටර් වාහන සහ මෙහෙයුම් උපකරණවල සාධාරණ අගය හඳුනා ගෙන ඇත. වෙළඳපොල පදනම් කර ගත් සාක්ෂි ඇසුරින් සාධාරණ අගය තීරණය කරනු ලබයි. විශේෂිත දේපළක ස්වභාවය, පිහිටි ස්ථානය හෝ තත්ත්වය තුළ ඇති වන මොනයම් හෝ වෙනස්කම් සඳහා ගැලපීම් සිදු කරන ලද විවෘත වෙළඳපොල මිල ගණන් මත පදනම්ව තක්සේරු කිරීම සිදු කරන අතර මෙම සියල්ල, සාධාරණ අගය මැණීමේ ධුරාවලියෙහි 3 වන මට්ටමට අයත් වේ. 2023 දෙසැම්බර් 31 දින තක්සේරු කිරීම සිදු කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| | |
|---|---|
| දේපළ | ගොඩනැගිලි (ප්‍රමාණය - වර්ග අඩි 431,286) 02. සහ වෙනත් වංචල වත්කම් අංක 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ |
| තක්සේරු ක්‍රමවේදය | ක්ෂය කරන ලද ප්‍රතිස්ථාපන පිරිවැය ප්‍රවිෂ්ටය මත පදනම් වේ. |
| තක්සේරු කිරීමේ බලාත්මක දිනය | 2023 දෙසැම්බර් 31 |
| දේපළ තක්සේරුකරු | ජී. ඩබ්ලිව්. ජී. අබේගුණවර්ධන මහතා, වරලත් තක්සේරු කිරීමේ මැණුම්කරු |

ක්ෂය කිරීම් අඩු කළ පිරිවැය මත දේපළ පිරියත සහ උපකරණ අගය ඉදිරිපත් කර ඇත්නම් ධාරණ අගය පහත පරිදි විය.

| | 2024.12.31<br>රු. '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| පිරිවැය | 19,726,510 | 17,158,765 |
| සමුච්චිත ක්ෂය කිරීම් | (7,487,792) | (7,005,220) |
| ලියා හල අගය | 12,238,718 | 10,153,545 |

**12.4** කාමර 264 ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රමානුකූලව අවසන් කරන ලද අතර, 2024 නොවැම්බර් මාසයේදී එහි අවසන් නිමාව සිදුවිය. වත්කම් භාවිතයට ගත් පසු ප්‍රාග්ධනීකරණය අවශ්‍ය වූ හෙයින්, අවසන් කොන්ත්‍රාත්කරු ඉන්වොයිසි ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ බැවින්, පිරිවැය උපදේශක (ප්‍රමාණ මිනුම් ශිල්පී) විසින් සපයන ලද ඇස්තමේන්තුගත පිරිවැය මත පදනම්ව අදාළ වියදම් ප්‍රාග්ධනීකරණය කරන ලදී. අවසන් සහතික කළ කොන්ත්‍රාත්කරු ඉන්වොයිසි ලැබුණු පසු, ප්‍රාග්ධනීකරණය කළ මුදල් සමාලෝචනය කර, අවශ්‍ය තැන්වලදී, සැබෑ පිරිවැය පිළිබිඹු කිරීමට ගැලපීම් සිදු කර ඇත.

**13.**

| රු. "000" | 99 වර්ෂ කල්බදු ප්‍රධාන දේපළ | UDA රථ ගාල | එකතුව |
|---|---|---|---|
| 2022.12.31 දිනට ශේෂය | 6,256,992 | 4,806 | 6,261,798 |
| ක්‍රමක්ෂය | (70,705) | (4,806) | (75,511) |
| එකතු කිරීම් | - | 29,091 | 29,091 |
| 2023.12.31 දිනට ශේෂය | 6,186,287 | 29,091 | 6,215,377 |
| ක්‍රමක්ෂය | (70,707) | (7,392) | (78,099) |
| එකතු කිරීම් | - | 3,911 | 3,911 |
| **2024.12.31 දිනට ශේෂය** | **6,115,580** | **25,609** | **6,141,189** |

**13.1** ප්‍රධාන දේපළෙහි බදු ගිවිසුම්ගත ඉඩම 2012 ජූනි 28 වන දින සිට වසර 99 ක කාලයක් සඳහා වලංගු වේ. රුපියල් බිලියන 7ක් වූ බදු ගිවිසුම්ගත ඉඩම් වටිනාකම ප්‍රාග්ධනීකරණය කර ඇති අතර, ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කර ඇත.

**13.2** 2016 දෙසැම්බර් 13 දිනැති කැබිනට් තීරණයට අනුව, ක්‍රීඩා සංකීර්ණය පිහිටා ඇති අක්කර 1.8ක ඉඩම් කැබැල්ලේ බදු කාලය, ප්‍රධාන ගොඩනැගිල්ලේ බද්දට අනුකූලව 2111 ජූනි දක්වා දීර්ඝ කරන ලදී. තවද, 2022 මාර්තු 3 දිනැති පසුකාලීන කැබිනට් තීරණයකින්, එම කාලසීමාව සඳහා වූ මුළු බදු වාරිකය වන රුපියල් මිලියන 4,440 ක බදු වාරිකය, සමාගමේ ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් ලෙස ආයෝජකයෙකු සමඟ උප-බදු ගිවිසුමක් අවසන් කරන තෙක් කල් දැමීමට තීරණය කරන ලදී.

**13.3** මෝටර් රථ ගාලක් ලෙස භාවිත කිරීම සඳහා, හෝටලයට යාබදව පිහිටි පර්චස් 52ක ඉඩම් කොටසක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ සමාගම විසින් බදු ගිවිසුමකට එළඹ ඇත. බදු කාලය 2020 ජනවාරි 1 දින සිට ආරම්භ වන වසර 30 කි. බදු කුලිය සෑම වසර පහකට වරක් රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන පරිදි සංශෝධනයට ලක් වේ. මුල් වසර පහේ කාලය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන බැවින්, ඊළඟ වසර පහේ කාලය සඳහා වන බදු කුලිය, මූලික වසරේ බදු වාරිකයට වඩා 5%ක වැඩිවීමක් මත පදනම්ව ප්‍රාග්ධනීකරණය කර ඇත. මෙම ගැලපීම සිදු කර ඇත්තේ, බදු වගකීම සහ භාවිත අයිතියේ පසු වටිනාකම සාධාරණව පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහාය.

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|

## 14. තොග

| | | |
|---|---|---|
| ආහාර | **42,554** | 32,200 |
| පාන වර්ග | **58,872** | 56,516 |
| ඉංජිනේරු ගබඩාව (ඉන්ධන සහ උදුන් තෙල්) | **8,366** | 8,600 |
| | **109,792** | 97,317 |

## 15. වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්

| | | |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | **356,109** | 240,521 |
| අඩු කලා :ණයගැතියන් හානිකරණය | **(12,542)** | (10,192) |
| | **343,568** | 230,329 |

## 16. සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්

| | | |
|---|---|---|
| හිල්ටන් කොළම්බො රෙසිඩන්ස් | **3,852** | 5,309 |
| හිල්ටන් වීරවිල | **1,829** | 6,803 |
| හිල්ටන් යාල | **10,997** | 4,277 |
| හිල්ටන් ක්වාලා ලාම්පූර් | **-** | 2,031 |
| හිල්ටන් ශා අලාම් 1 - නගරය | **-** | 42 |
| මුදල් අමාත්‍යාංශය | **71,728** | 24,358 |
| | **88,407** | 42,820 |

## 17. වෙනත් වත්කම්

| | | |
|---|---|---|
| තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම් | **90,426** | 116,003 |
| වෙනත් ලැබිය යුතු මුදල් | **36,052** | 40,257 |
| අත්තිකාරම් - ප්‍රතිසංස්කරණ වියදම් | **-** | 194,941 |
| ලැබිය යුතු ආදායම් බදු - සටහන් අංක 29 | **34,231** | 33,855 |
| | **160,708** | 385,056 |

## 18. ජංගම මූල්‍ය වත්කම්

| | | |
|---|---|---|
| කැදවුම් තැන්පතු | **961** | 836 |
| ණය සේවා සංචිතය (ඩීඑස්ආර්) - ගිණුම | **65,805** | 61,111 |
| මුළු කෙටි කාලීන ආයෝජනයන් | **66,766** | 61,947 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

## 19. මුදල් සහ බැංකු ශේෂයන්

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදල් ඉතිරි කිරීම් | **43,791** | 113,297 |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිත ගිණුම (ඉතිරි කිරීම ගිණුම) | **20,909** | 112,249 |
| ණය සේවා සංචිතය (ඩීඑස්ආර්) - ගිණුම | **36** | 36 |
| මුදල් සහ ක්‍රියාත්මක බැංකු ගිණුම | **38,860** | 49,774 |
| | **103,596** | 275,356 |

විදේශ ව්‍යවහාර ඉතිරි කිරීමේ ගිණුමේ වර්ෂය අවසාන ශේෂය, ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුව, ශේෂ පත්‍ර දිනට පැවති අවසාන අනුපාතය මත, ක්‍රියාත්මක මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියලට මාරු කරන පරිවර්තනය කරනු ලබයි.

## 20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| **නිකුත් කළ හා සම්පූර්ණයෙන්ම ගෙවූ** | | |
| සාමාන්‍ය කොටස් 2,046,645,685 | **20,466,456** | 20,466,456 |

ශ්‍රී ලංකා රජයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනට සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 100% ක් දරයි. 2023 මාර්තු 14 දිනැති කැබිනට් තීරණ අංක 23/0431/604/046 සහ 2023 පෙබරවාරි 27 දිනැති කැබිනට් සංදේශ අංක MF/018/CM/2023/055 අනුව හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වත්කම් බැහැර කිරීම, ශ්‍රී ලංකා රජයේ නව ප්‍රතිපත්තිමය උපදෙස් ලැබෙන තෙක් දැනට අත්හිටුවා ඇත.

## 21. සංචිතයන්

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමේ සංචිතය (සටහන් අංක 21.1) | **303** | - |

### 21.1 ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමේ සංචිතය

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | - | 178,228 |
| එකතු කලාඃ වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම් | **207,816** | - |
| අඩු කලා ඃ ස්කන්ධය ප්‍රකාශනයට අගයන් මාරු කිරීම | - | - |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් මිලදී ගැනීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය කළ ප්‍රමාණය | **(207,513)** | (178,228) |
| වර්ෂය අවසානයේදී ශේෂය | **303** | |

වසර තුළ එක්සත් ජනපද ඩොලර් 700,000කට සමාන මුදලක් ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිතයට මාරු කර ඇත.

## 22. පොලී සහිත ණය ගැනීම්

| | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල් | එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ගෙවිය යුතු මුදල් | එකතුව | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල් | එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ගෙවිය යුතු මුදල් | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| කාලීන ණය - සම්පත් බැංකුව | **262,500** | **2,187,500** | **2,450,000** | - | 1,626,139 | 1,626,139 |
| කාලීන ණය - මහජන බැංකුව | **333,324** | **1,166,636** | **1,499,960** | 58,333 | 1,441,627 | 1,499,960 |
| | **595,824** | **3,354,136** | **3,949,960** | 58,333 | 3,067,766 | 3,126,099 |

ඇප සහ නැවත ගෙවීමේ කොන්දේසි

### 22.1 කාලීන ණය

| | 2023.01.01 දිනට ශේෂය | ලබා ගත් ණය මුදල | නැවත ගෙවීම | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| කාලීන ණය - මහජන බැංකුව | 2,000,000 | - | (500,040) | 1,499,960 |
| කාලීන ණය - සම්පත් බැංකුව | - | 1,626,139 | - | 1,626,139 |
| | 2,000,000 | 1,626,139 | (500,040) | 3,126,099 |

| | 2024.01.01 දිනට ශේෂය | ලබා ගත් ණය මුදල | නැවත ගෙවීම | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| කාලීන ණය - මහජන බැංකුව | 1,499,960 | - | - | 1,499,960 |
| කාලීන ණය - සම්පත් බැංකුව | 1,626,139 | 823,861 | - | 2,450,000 |
| | 3,126,099 | 823,861 | - | 3,949,960 |

| මූල්‍ය ආයතනය | මහජන බැංකුව | සම්පත් බැංකු |
|---|---|---|
| ණය පහසුකමෙහි ස්වභාවය | කාලීන ණය | කාලීන ණය |
| මුදල | රු. මිලියන 1,500 | රු. මිලියන 2,450 |
| පොලී අනුපාතය | AWPLR +1.5% | AWPLR +1.5% |
| ඇපය | දේපළ උකස් කර ඇත. | දේපළ උකස් කර ඇත. |
| නැවත ගෙවිය යුතු කාල සීමාව | වර්ෂ 7 | වර්ෂ 7 |

2023 මාර්තු මාසයේදී, හිල්ටන් කොළඹ හෝටල් දේපලෙහි බදු අයිතිය මත සම්පත් බැංකු පීඑල්සී වෙත රුපියල් මිලියන 3,050 ක ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරයක් නිකුත් කරන ලදී. මෙය මහජන බැංකුව වෙත දැනට පවතින ප්‍රාථමික උකසට සම මට්ටමින් නිකුත් කර ඇත. සම්පත් බැංකුවෙන් ලැබෙන මුළු බැංකු පහසුකම, රුපියල් මිලියන 600ක අයිරා පහසුකමක් සහ රුපියල් මිලියන 2,450ක කාලීන ණයකින් සමන්විත වේ. මෙයට මහජන බැංකුවේ පවතින ණයෙන් රුපියල් මිලියන 500ක අර්ධ වශයෙන් නිරවුල් කිරීමක් ද ඇතුළත් වේ. 2023 මාර්තු 28 වන දින සම්පත් බැංකු පීඑල්සී වෙත නිකුත් කරන ලද ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරයට අනුව, අඛණ්ඩව සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට අර්ධ වශයෙන් මුදල් සැපයීම සහ මහජන බැංකුවේ පවතින ණයෙන් රුපියල් මිලියන 500ක් අර්ධ වශයෙන් නිරවුල් කිරීම සඳහා, වසර 2ක සහන කාලයක් සහිතව රුපියල් මිලියන 2,450 ක නව කාලීන ණය පහසුකමක් ලබා දෙන ලදී. ඒ අනුව, පහසුකම් දෙකෙහිම ඊළඟ ප්‍රාග්ධන වාරික ගෙවීම් 2025 දී පමණක් කල් පිරෙනු ඇත.

## 23. විශ්‍රාමික ප්‍රතිලාභ බැරකම්

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | **117,655** | 77,467 |
| වර්ෂය සඳහා අය කිරීම | **11,972** | 8,131 |
| වර්ෂය සඳහා පොලී වියදම | **16,488** | 14,332 |
| සංක්‍රාන්තික වගකීම / (වත්කම) සහ ආයුගණක අලාභය / (ලාභය) | **(343)** | 8,648 |
| උපකල්පන වෙනස් කිරීම් මගින් හෝ පෙර වර්ෂවල දී සිදු කළ ඌණ / (අධි) වෙන් කිරීම් හේතුවෙන් ඇතිවන අලාභ / (ලාභ) | **12,144** | 23,041 |
| වර්ෂය තුළදී සිදු කළ ගෙවීම් | **(34,656)** | (13,963) |
| වර්ෂය අවසාන ශේෂය | **123,261** | 117,655 |

සමාගමේ විශ්‍රාමික ප්‍රතිලාභ බැරකම, පියල් එස්. ගුණතිලක සහ ඇසෝසියේට්ස් ආයතනය විසින් සිදු කර ඇති ආයුගණක තක්සේරු කිරීම මත පදනම් වේ. වට්ටම් අනුපාතිකය උපකල්පනය සහ වාර්ෂික මූලික වැටුප වැඩිවීම යන උපකල්පනයන් සඳහා හැර සියලුම උපකල්පනයන් එලෙසම පවතින අතර, ඊළග වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමට අදාළ දායකත්වයෙහි ප්‍රමාණාත්මක වෙනස්වීමක් අපේක්ෂා නොකරයි. භාණ්ඩාගාර බැඳුම්කරවල ඉපැයුම් අනුපාත නිරූපණය කිරීම සඳහා වට්ටම් අනුපාතිකය සියයට 12 ක් දක්වා (පෙර වර්ෂයේ සියයට 14 කි) සංශෝධනය කර ඇත. සේවක ප්‍රතිලාභ තීරණය කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන උපකල්පන වන්නේ:

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | **12%** | 14% |
| අනාගත වැටුප් වැඩිවීම | **6%** | 6% |
| විශ්‍රාමික වයස | **අවුරුදු 60** | අවුරුදු 60 |

| | වට්ටම් අනුපාතිකය | | වැටුප් වැඩිවීම | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | 2024 | 2023 |
| ප්‍රතිශතය එක් අගයකින් වැඩිවීම | **(6,353)** | (5,957) | **6,971** | 6,632 |
| ප්‍රතිශතය එක් අගයකින් අඩුවීම | **6,992** | 6,551 | **(6,432)** | (6,110) |

**ගෙවීම් සඳහා වූ කල් පිරීමේ විශ්ලේෂණය අදාළ දිනට - වට්ටම් නොකළ**

| | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|
| ඊළග මාස 12 ක් ඇතුළත | **2,203** | 1,137 |
| වර්ෂ 1 ත් 2 ත් ඇතුළත | **311** | 7,383 |
| වර්ෂ 2 ත් 5 ත් ඇතුළත | **34,625** | 35,558 |
| වර්ෂ 5 ත් 10 ත් ඇතුළත | **82,194** | 135,450 |
| මුළු අපේක්ෂිත ගෙවීම් | **119,334** | 179,529 |

නිර්වාචිත ප්‍රතිලාභ බැරකම සඳහා භරිත සාමාන්‍ය කාලය වර්ෂ 6.2 වේ. (2023 - වර්ෂ 6.1)

## 24. විලම්භිත බදු වගකීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් ක්‍රමය මගින් විලම්භිත බදු හඳුනා ගනු ලබන අතර, එය මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වල ධාරණ අගයන් සහ බදුකරණ අරමුණු සඳහා ඒවායේ ධාරණ අගයන් අතර ඇති තාවකාලික වෙනස්කම් මත ගණනය කරයි. විලම්භිත බදු සඳහා ගණනය පදනම් වී ඇත්තේ වත්කම් සහ වගකීම්වල ධාරණ අගයන් සාක්ෂාත් කර ගැනීමේ හෝ නිරවුල් කිරීමේ අපේක්ෂිත ආකාරය මත වන අතර, වාර්තාකරණ දිනය වන විට පනවන ලද හෝ පසුව අදාළ වන බදු අනුපාත භාවිතා කරනු ලැබේ. විලම්භිත බදු වත්කම්, ආදායම් බදු පාඩු වල බදු බලපෑම් වලින් පැන නගින අගයන් සහ ඉදිරියට ගෙන යා හැකි ණය ඇතුළුව, වත්කම උපයෝගී කර ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි වීමේ සම්භාවිතාවක් තිබේ නම් පමණක් හඳුනා ගනු ලැබේ. විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලබන අතර, අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කර ගැනීමට තවදුරටත් සම්භාවිතාවක් නොමැති නම් ඒවා පහළට ගලපනු ලැබේ.

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | **1,480,613** | 633,891 |
| ලාභ අලාභ ප්‍රකාශනයේ හඳුනාගැනීම් | **71,491** | (77,923) |
| අනෙකුත් විස්තීරණ ආදායම් වල හඳුනාගැනීම් | **-** | 924,645 |
| වර්ෂයේ අවසාන ශේෂය | **1,552,104** | 1,480,613 |

### 24.1 අවසාන විලම්භිත බදු වගකීමේ ශේෂය පහත අයිතමයන් හා සම්බන්ධ වේ:

| | | |
|---|---|---|
| බදු අරමුණු සඳහා වූ කඩිනම් කළ ක්ෂය කිරීම | **1,954,762** | 1,717,385 |
| බදු අරමුණු සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තය | **924,645** | 924,645 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැරකම | **(36,978)** | (35,297) |
| ණයගැතියන් හානිකරණය | **(705)** | (2,293) |
| ඉදිරියට ගෙන ආ බදු අලාභ භාවිතා කිරීම හා සම්බන්ධ විලම්භිත බදු වත්කම | **(1,289,620)** | (1,123,828) |
| | **1,552,104** | 1,480,613 |

විලම්භිත බදු සියයට 30 ක අනුපාතයකට ගණනය කර ඇත.

## 25. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| වෙළඳ ගෙවිය යුතු මුදල් | **358,956** | 342,641 |
| විවිධ ණයහිමියෝ සහ ඇතුළත් උපචිත වියදම් | **184,789** | 130,785 |
| උපචිත ප්‍රතිසංස්කරණ වියදම් | **701,881** | 321,198 |
| ගෙවිය යුතු කළමනාකරන ගාස්තු | **11,318** | - |
| ගෙවිය යුතු කළමනාකරන ගාස්තු* | **(4,806)** | (4,806) |
| වෙනත් වගකීම් | **71,412** | 66,197 |
| බිඳ වැටීම සඳහා ප්‍රතිස්ථාපනය කිරීම | **18,804** | 16,006 |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු මුදල් | **354,620** | 284,598 |
| | **1,696,975** | 1,156,620 |

* 2018 සහ 2019 වසර සඳහා හිල්ටන් ඉන්ටර්නැෂනල් එල්එල්සී වෙතින් කළමනාකරණ ගාස්තු ආපසු හැරවීම ලැබිය යුතු ශේෂය ලෙස පිළිබිඹු කරයි.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| **26. සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල්** | | |
| හිල්ටන් ඉන්ටනැෂනල් ඒෂියා පැසිෆික් | **12,662** | 19,966 |
| හිල්ටන් ඉන්ටනැෂනල් එල්එල්සී | **16,318** | 163,604 |
| හිල්ටන් ක්වාලා ලාම්පූර් | - | 25,565 |
| හිල්ටන් හොටෙල් මැනේජ්මන්ට් (ෂැන්ගා) සමාගම | - | 3,666 |
| හිල්ටන් වීරවිල | **387** | 301 |
| හිල්ටන් කොළම්බො රෙසිඩන්ස් | **3,410** | 2,894 |
| | **32,776** | 215,996 |
| **27. කොන්ත්‍රාත් වගකීම්** | | |
| සිටි ලෙජර ණය | **157,055** | 68,702 |
| අමුත්තන්ගේ අත්තිකාරම් තැන්පතු | **147,487** | 158,084 |
| | **304,541** | 226,786 |
| **28. කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය** | | |
| ශුද්ධ වත්කම් අගය (රු.) | **11,915,257** | 12,266,894 |
| සාමාන්‍ය කොටස් සංඛ්‍යාව "000" | **2,046,646** | 2,046,646 |
| කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය | **5.82** | 5.99 |
| **29. ආදායම් බදු වගකීම** | | |
| ආරම්භක ශේෂය | **(33,855)** | (11,858) |
| කාල පරිච්ඡේදය සඳහා වූ ගෙවීම | - | (254) |
| පෙර වර්ෂවලට අදාළ ඌණ / (අධි) වෙන්කිරීමේ ගැලපීම් | - | (17,730) |
| බදු බැර කිරීම් | | |
| රඳවා ගැනීමේ බදු | **(377)** | (4,014) |
| වර්ෂයේ අවසාන ශේෂය<br>(සටහන් අංක 17 - ප්‍රවර්ථන වර්ෂයේ ශේෂය වෙනත් වත්කම් වෙත මාරු කර ඇත) | **(34,231)** | (33,855) |

## 30. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා වූ සටහන්

### 30.1 වර්ෂයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ

| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
|---|---|---|
| මුදල් සහ බැංකු ශේෂයන් | 49,774 | 7,141 |
| කැදවුම් තැන්පතු | 836 | 836 |
| ණය සේවා සංචිත (ඩීඑස්ආර්) - ගිණුම | 61,111 | - |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිත ගිණුම ( ඉතිරි කිරීමේ ගිණුම) | 112,249 | 49,989 |
| ණය සේවා සංචිත (ඩීඑස්ආර්) - ගිණුම | 36 | - |
| විදේශ ව්‍යවහාර මුදල් ඉතිරි කිරීම් | 113,297 | 242,521 |
| ප්‍රතිමිලදී ගැණුම් ආයෝජනය | - | 15,016 |
| ස්ථාවර තැන්පතු | - | 10,444 |
| බැංකු අයිරාව | (1,785,190) | (1,148,747) |
| | (1,447,886) | (822,800) |

### 30.2 වර්ෂයේ අවසාන මුදල් හා මුදල් සමාන දෑ

| | | |
|---|---|---|
| මුදල් සහ බැංකු ශේෂයන් | 38,860 | 49,774 |
| කැදවුම් තැන්පතු | 961 | 836 |
| ණය සේවා සංචිත (ඩීඑස්ආර්) - ගිණුම | 65,805 | 61,111 |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ සංචිත ගිණුම (ඉතිරි කිරීමේ ගිණුම) | 20,909 | 112,249 |
| ණය සේවා සංචිත (ඩීඑස්ආර්) - ගිණුම | 36 | 36 |
| විදේශ ව්‍යවහාර මුදල් ඉතිරි කිරීම් | 43,791 | 113,297 |
| ප්‍රතිමිලදී ගැණුම් ආයෝජනය | (1,659,396) | (1,785,189) |
| බැංකු අයිරාව | (1,489,033) | (1,447,885) |

## 31. 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය උපකරණ තක්සේරු කිරීමේ පදනම සම්බන්ධ විශ්ලේෂණය

| කාණ්ඩ අනුව මූල්‍ය වත්කම් | ණය සහ ලැබිය යුතු මුදල් | |
|---|---|---|
| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
| ජංගම වත්කම් තුල ඇති මූල්‍ය උපකරණ | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 343,568 | 230,330 |
| වෙනත් වත්කම් | 160,708 | 385,056 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | 88,407 | 42,820 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 66,766 | 61,947 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 103,596 | 275,356 |
| එකතුව | 763,044 | 995,511 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

| කාණ්ඩ අනුව මූල්‍ය වගකීම් | ක්‍රමක්ෂය මත තක්සේරු කළ මූල්‍ය වගකීම් | |
|---|---|---|
| | 2024.12.31<br>රු '000' | 2023.12.31<br>රු. '000' |
| ජංගම වගකීම් තුළ ඇති මූල්‍ය උපකරණ | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | **1,696,975** | 1,156,620 |
| සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් | **32,776** | 215,996 |
| බැංකු අයිරාව | **1,659,396** | 1,785,189 |
| කොන්ත්‍රාත් වගකීම් | **304,541** | 226,786 |
| එකතුව | **3,693,687** | 3,384,590 |

දැනුම ඇති සහ කැමැත්තක් ඇති පාර්ශවයන් අතර සිදු වන, එහෙත් බලහත්කාරයෙන් හෝ ඇවර කිරීමක විකිණීමකදී සිදු නොවන, වර්තමාන ගණුදෙනුවක් තුළ දී හුවමාරු විය හැකි උපකරණයේ වටිනාකම මූල්‍ය වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය තුළ ඇතුළත් වේ.

කළමනාකරණය විසින් අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජනයන්, සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්, සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් සහ බැංකු අයිරාවන් විශාල වශයෙන් ඒවායේ ආසන්න ධාරණ අගයට අගයනු ලබන අතර මෙම උපකරණවල කෙටි කාලීන කල්පිරීම ඊට හේතු වී ඇත.

## 32. මූල්‍ය අවධානම කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

වෙළඳපොල අවධානම (ව්‍යවහාරික මුදල් අවධානම, පොලී අනුපාත අවධානම සහ මිල අවධානය මෙයට ඇතුළත් වේ), ණය අවධානම සහ ද්‍රවශීලතා අවධානම වැනි විවිධ වූ මූල්‍ය අවධානම් සඳහා සමාගමේ ක්‍රියාකාරකම් මුහුණ පානු ලබයි., සමාගමේ සමස්ථ අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය, මූල්‍ය අවධානම් පුරෝකථනය කිරීමට නොහැකිවීම යන්න මත අවදානය යොමු කරන අතර සමාගමේ මූල්‍ය කාර්යසාධනය මත සිදු විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට කටයුතු කරනු ලබයි . අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවධානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන මූල්‍ය උපකරණ යටතට කෙටි කාලීන තැන්පතු, මුදල් වෙළඳපොල ආයෝජන සහ මුදල් අයත් වේ. සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය ඉහළ නංවමින් පවත්වා ගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වේ. සමාගම සතුව වෙළඳ ලැබිය යුතු මුදල් සහ වෙළඳ ගෙවිය යුතු මුදල් වැනි විවිධ වූ වෙනත් මූල්‍ය උපකරණ පවතින අතර ඒවා සමාගමේ ව්‍යාපාරික කටයුතු තුලින් සෘජුවම ගොඩනැංවිය හැකි ඒවා වේ.

### 32.1 ණය අවධානම

මූල්‍ය උපකරණ හෝ ගණුදෙනුකාර කොන්ත්‍රාත්තුවක් යටතේ එහි සඳහන් කොන්දේසි සපුරාලීමට අනෙකුත් පාර්ශවයට නොහැකි වීමෙන් මූල්‍ය අලාභයක් කරා ගමන් කළ හැකි අවධානම ණය අවධානම නම් වේ. මෙම හෝටලය ස්වකීය මෙහෙයුම් ක්‍රියාකාරකම් (ප්‍රාථමික වෙළඳ ලැබිය යුතු මුදල්) සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් හේතුවෙන් ණය අවධානමට අනාවරණය වේ.

හඳුනාගත්, ණය ලබා ගැනීමට සුදුසු තෙවන පාර්ශවයන් සමග පමණක් හෝටලය වෙළඳ කටයුතු සිදු කරයි. ණය කොන්දේසි මත වෙළඳ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත ගණුදෙනුකරුවන් ණය සත්‍යාපනය කිරීමේ ක්‍රමවේදය යටත්ව කටයුතු කළ යුතු වීම හෝටලයේ ප්‍රතිපත්තිය වේ. ඊට අමතරව, ලැබිය යුතු ශේෂයන් අඛණ්ඩ පදනමක් මත අධීක්ෂණය කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස හෝටලය බොල් ණයවලට නිරාවරණය වීම සැලකිය යුතු නොවේ.

මුදල් හා මුදල් සමාන දෑ, වෙනත් මූල්‍ය නොවන වත්කම් සහ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් නැමැති හෝටලයේ වෙනත් මූල්‍ය වත්කම් තුළින් හට ගන්නා ණය අවධානම සම්බන්ධයෙන් අනෙක් පාර්ශවය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් හට ගනු ලබන ණය අවධානමට හෝටලයේ නිරාවරණය වේ. අනෙක් පාර්ශවයේ අවධානම පිළිබඳ අධික අවධානයක් ලබාදීම වැළැක්වීම සඳහා හෝටලය ස්වකීය මෙහෙයුම් කළමනාකරණය කරනු ලබන අතර අනෙකුත් පාර්ශවය ඔවුන්ගේ වගකීම් සපුරාලන බව තහවුරු කිරීම සඳහා සියලු තාර්කික පියවරයන් ගනු ලබයි.

## 32.2 ණය අවධානමට නිරාවරණයවීම

සාමාන්‍යයෙන් ණය අවධානම අනුව ඇති මූල්‍ය වත්කම්වල උපරිම අවධානම් තත්ත්වයන් ඒවායේ ධාරණ අගයට සමාන වේ (තිබේ නම්, ඇපකරයක ප්‍රතිශ්ඨාව නොමැතිව). උපරිම අවධානම් තත්ත්වයන් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

| රු. "000" වලින් | 2024 දෙසැම්බර් 31 දිනට | | | | |
|---|---|---|---|---|---|
| | අතැති මුදල් සහ බැංකුවේ මුදල් | කෙටිකාලීන ආයෝජනයන් | වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල |
| බැංකුවේ ඇති තැන්පතු | - | 66,766 | - | - | 66,766 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | - | - | 343,568 | - | 343,568 |
| සම්බන්ධිත පාර්ශවයන්ලෙන් ලැබිය යුතු මුදල | 88,407 | 88,407 | | | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 82,688 | 20,909 | - | - | 103,596 |
| **මුළු ණය අවධානම් නිරාවරණයවීම්** | **82,688** | **87,675** | **343,568** | **88,407** | **602,337** |

| රු. "000" වලින් | 2023 දෙසැම්බර් 31 දිනට | | | | |
|---|---|---|---|---|---|
| | අතැති මුදල් සහ බැංකුවේ මුදල් | කෙටිකාලීන ආයෝජනයන් | වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල |
| බැංකුවේ ඇති තැන්පතු | - | 61,947 | - | - | 61,947 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | - | - | 230,329 | - | 230,329 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල | - | - | - | 42,820 | 42,820 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 163,108 | 112,249 | - | - | 275,356 |
| මුළු ණය අවධානම් නිරාවරණයවීම් | 163,108 | 174,196 | 230,329 | 42,820 | 610,453 |

## 32.3 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්

| රු. "000"වලින් | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| පෙර ගෙවිය යුතු නොවන හෝ හානිකරණය නොවන වූ | | **216,374** | 193,808 |
| පෙර ගෙවිය යුතු නමුත් හානිකරණය නොවූ | 30-60 | **86,223** | 32,571 |
| | 61-90 | **8,690** | 9,311 |
| | 91-120 | **2,346** | 1,710 |
| | 121-150 | **21,242** | - |
| | 151> | **21,233** | 3,121 |
| දළ ධාරණ අගය | | **356,110** | 240,520 |
| අඩුකලා: හානිකරණ වෙන්කිරීම | | | |
| එකිනෙක වෙන් වෙන් ව ඇගයූ හානිකරණ වෙන්කිරීම | | **(12,542)** | (10,192) |
| එකතුව | | **343,568** | 230,329 |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

### 32.4 සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්

හිල්ටන් සමාගම් දාමයේ අනුබද්ධිත සමාගම්වලින් ලැබිය යුතු මුදලින් ශේෂය සමන්විත වේ.

### 32.5 මුදල් හා මුදල් සමාන දෑ සම්බන්ධ ණය අවධානම

සමාගම විසින් ප්‍රවර්තන ශ්‍රේණි ගත කිරීම් සහ ආර්ථික පසුබිම පදනම්ව, මූලික කරුණු සහ වෙළඳපොල දර්ශක විශ්ලේෂණය සැළකිල්ලට ගනිමින්, පිළිගත හැකි වෙනත් මුදල් විශේෂයන් සහිත බලයලත් ලැයිස්තුවක් පවත්වාගෙන යනු ලබයි. 2024 දෙසැම්බර් 31 දින වන විට, මුදල් සහ මුදල් සමාන දෑ රු. මිලියන 1,489 ක් (2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1,447 ක්) සමාගම විසින් පවත්වා ගෙන ගොස් තිබුණි

### 32.6 ද්‍රවශීලතා අවධානම

සමාගමේ කෙටිකාලීන සහ ස්වාභාවික වර්ධනය ඇතුළත් වන මධ්‍යකාලීන මූල්‍යකරන බැරකම් සපුරාලීම මෙන්ම අනපේක්ෂිත බැරකම් සහ අවස්ථාවන් වෙනුවෙන් යොදා ගැනීම සඳහා සමාගම සතුව තිබිය යුතු අරමුදල් සැළකිය යුතු මට්ටමක පවත්වා ගැනීම තහවුරු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

සමාගම, අරමුදල් හිඟතාවයක් සම්බන්ධව එහි ඇතිවන අවධානම, දෛනික මුදල් කළමනාකරන ක්‍රියාවලිය භාවිතා කරමින් අධීක්ෂණය කරයි. මෙම ක්‍රියාවලිය, සමාගමේ මූල්‍ය ආයෝජනයන් සහ මූල්‍ය වත්කම් (උදාහරණ ලෙස ලැබිය යුතු ගිණුම්, වෙනත් මූල්‍ය වත්කම්) මෙන්ම මෙහෙයුම්වලින් ඇති වූ ප්‍රක්ශේපිත මුදල් ප්‍රවාහයන් ද සැළකිල්ලට ගනු ලබයි.

| ශුද්ධ (ණය) / මුදල් | 2024.12.31<br>රු. '000 | 2023.12.31<br>රු. '000 |
|---|---|---|
| කෙටිකාලීන ආයෝජනයන් | **66,766** | 61,947 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | **103,596** | 275,356 |
| මුළු ද්‍රවශීලතා වත්කම් | **170,362** | 337,304 |
| බැංකු අයිරාවන් | **(1,659,396)** | (1,785,189) |
| මුළු ණය ගැනීම් | **(1,659,396)** | (1,785,189) |
| ශුද්ධ (ණය) / මුදල් | **(1,489,033)** | (1,447,885) |

### 32.7 කල් පිරීම් විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමාගමේ මූල්‍ය වගකීම්වල කල් පිරීම් සටහන, පහතින් දක්වා ඇති වගුවෙහි සම්පිණ්ඩනය කර ඇත.

| රු. | 2024 දෙසැම්බර් 31 දිනට | | 2023 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | වසරක් ඇතුළත | එකතුව | වසරක් ඇතුළත | එකතුව |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | **1,696,975** | **1,696,975** | 1,156,620 | 1,156,620 |
| සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් | **32,776** | **32,776** | 215,996 | 215,996 |
| රඳවා ගත් ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | **166,709** | **166,709** | 162,012 | 162,012 |
| බැංකු අයිරාවන් | **1,659,396** | **1,659,396** | 1,785,189 | 1,785,189 |
| එකතුව | **3,555,855** | **3,555,855** | 3,319,816 | 3,319,816 |

### 32.8 වෙළඳපොල අවධානම

වෙළඳපොල මිල ගණන් වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණ සම්බන්ධ අනාගත මුදල් ප්‍රවාහයන්වල සාධාරණ අගය විචලනය වීමේ අවධානම වෙළඳපොල අවධානම නම් වේ. සමාගම සතු මූල්‍ය උපකරණ භාවිතය හරහා හෝටලය, වෙළඳපොල අවධානමට මෙන්ම විශේෂයෙන්ම ව්‍යවහාර මුදල් අවධානමට සහ වෙනත් මිල ගණන් අවධානම් විශේෂයන්වලටද නිරාවරණය වේ.

## 33. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

වාර්තාකරණ දිනට පසුව, මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදු කළ යුතු හෝ හෙළිදරව් කළ යුතු කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් සිදු වී නොතිබුණි.

## 34. ප්‍රාග්ධන බැඳීම්

පහත කරුණු හැර, මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු ප්‍රාග්ධන බැඳීමක් හෝ අසම්භාව්‍ය වගකීමක් නොතිබුණි.

**34.1** සමාගම විසින් 2014 ඔක්තෝබර් මාසයේ සිට හිල්ටන් වර්ල්ඩ්වයිඩ් සමඟ අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමට අනුව හෝටලයේ පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ආරම්භ කරන ලදී. ප්‍රතිසංස්කරණ වැඩසටහන අදියර 2කින් සිදු කරන ලදී: 1) පොදු ප්‍රදේශ සහ සේවා වැඩිදියුණු කිරීම, 2) අමුත්තන්ගේ කාමර 264. මෙම ව්‍යාපෘතිය අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ කාලීන ණයක් හරහා ණය මූල්‍යනය මගින් සිදු කරන ලදී. ව්‍යාපෘතිය 2024 නොවැම්බර් මාසයේදී සාර්ථකව නිම කරන ලදී.

කාමර ප්‍රතිසංස්කරණය සඳහා සමාගම දැනටමත් එළඹ ඇති කොන්ත්‍රාත්තු වල ඇස්තමේන්තුගත වටිනාකම් සහ 2024 දෙසැම්බර් 31 වන විට ඉතිරිව ඇති ශේෂයන් පහත පරිදි වේ:

| සැපයුම් අයිතමය | මුළු ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකම<br>රු. '000 | මෙතෙක් සිදු කළ ගෙවීම්<br>රු. '000 | ගෙවීමට ඇති ඇස්තමේන්තුගත ශේෂය<br>රු. '000 |
|---|---|---|---|
| ප්‍රධාන කොන්ත්‍රාත්කරු (සිවිල්/අභ්‍යන්තර නිර්මාණ/යාන්ත්‍රික, විදුලි, නල කාර්යයන්) | 2,377,482 | 1,766,157 | 611,325 |
| සේවාලාභී විසින් සපයන ලද භාණ්ඩ | 831,873 | 645,910 | 185,963 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොන්ත්‍රාත්තුව - අදියර 01, 02 සහ 03 | 295,436 | 253,545 | 41,891 |
| වත්මන් උපදේශක | 160,510 | 151,636 | 8,874 |
| **එකතුව** | **3,665,301** | **2,817,248** | **848,054** |

### 34.2 කල්බදු බැඳීම්

| | 2024.12.31<br>රු. '000 | 2023.12.31<br>රු. '000 |
|---|---|---|
| **අවලංගු කළ නොහැකි මෙහෙයුම් කල්බදු මත වූ ගෙවිය යුතු කල්බදු වාරික;** | | |
| එක් වර්ෂයක් ඇතුළත | **6,505** | 4,446 |
| එක් වර්ෂයක් සහ වර්ෂ 5 ක් ඇතුළත | **19,105** | 24,645 |
| | **25,610** | 29,091 |

මෙම කල්බදු බැඳීම, වර්ෂ 5 ක කල්බදු දේපළක් වූ නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 52ක රථ ගාල සම්බන්ධයෙන් වේ.

## 35. අසම්භාව්‍යතාවයන්

**35.1** හෝටලය, උත්සවයකදී සිදුවූ අනතුරක් හේතුවෙන් සිදුවූ හානි සම්බන්ධයෙන් නඩුවක විත්තිකරුවෙකි. පැමිණිලිකරු විසින් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් වෙත දැන්වීමක් සමඟ විත්තිකරුට සිතාසි නිකුත් කිරීමට සහ නඩුව ලැයිස්තුගත කිරීමට පියවර ගත යුතුය. මේ වන තෙක් දැන්වීමක් ලැබී නොමැත (DMR 01012/2014). මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනට එවැනි නඩුවක ප්‍රතිඵලය පුරෝකථනය කිරීමට කළමනාකාරිත්වයට නොහැක. ඒ අනුව, ඉහත සඳහන් නඩු සඳහා මෙම මූල්‍ය ප්‍රකාශනවල කිසිදු විධිවිධානයක් සලසා නොමැත.

**35.2** SLFRS 37 ට අනුව, හෝටල්, ආපනශාලා සහ නවාතැන් ආයතන විසින් කොළඹ මහනගර සභාවට ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු ආරවුලකට අදාළව සමාගම විසින් විධිවිධානයක් සලසා ඇත. කොළඹ මහනගර සභාව 2007 ජූලි 6 වන දින ගැසට් නිවේදනයක් නිකුත් කරමින්, 2007 ජනවාරි 1 දින සිට අය කරන බලපත්‍ර ගාස්තු සංශෝධනයක් නිවේදනය කරන ලදී. මෙම සංශෝධනයට එරෙහිව හිල්ටන් කොළඹ ඇතුළු කොළඹ නගරයේ හෝටල් විසින් සාමූහිකව 2007 දී මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. නඩුවේ ප්‍රතිඵලය අවිනිශ්චිතව පවතී. වැඩි විස්තර නඩු කටයුතු යටතේ සටහන අංක 38.6 හි දක්වා ඇත.

**35.3** වාර්තාකරණ දිනය වන විට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු තක්සේරු කිහිපයක් නිකුත් කර ඇත. කළමනාකාරිත්වය, විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමෙන් පසු, එම ඉතිරිව ඇති තක්සේරුකරණයන්ගෙන් සැලකිය යුතු වගකීම් ඇති වීමට ඉඩ නොමැති බව තීරණය කර ඇත. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 වන විට, කළමනාකාරිත්වය විසින් කිසිදු අදාළ විධිවිධානයක් සලසා නොමැත.

## 36. ඇප ලෙස තබා ඇති වත්කම්

ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මුදල් සැපයීම සඳහා මහජන බැංකුව සහ සම්පත් බැංකුව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම්වලට එරෙහිව සමාගම විසින් හිල්ටන් කොළඹ දේපළ පිළිවෙලින් රුපියල් මිලියන 2,750 ක් සහ රුපියල් මිලියන 3,050 ක් සඳහා උකස් කර ඇත.

## 37. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

### 37.1. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගනුදෙනු

සම්බන්ධිත පාර්ශ්වයන්ට, සමාගමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරී බලය සහ වගකීම ඇති පුද්ගලයන් ලෙස අර්ථ දක්වා ඇති ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකාරීත්වය අතරට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ඇතුළත් වේ.

කාල සීමාව තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ වේතන රුපියල් 24,515,000/- කි (2022 වසර අවසානය - රුපියල් 18,806,000/-).

### 37.2 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල් (සටහන 16)

### 37.3 සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් (සටහන 26)

### 37.4 සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු

| විස්තරය (Description) | 31.12.2024<br>රු. '000 | 31.12.2023<br>රු. '000 |
|---|---|---|
| කළමනාකරණ සමාගම - හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් කෝපරේෂන් | | |
| සේවා ලැබීම් | **60,567** | 172,416 |
| සේවා සඳහා ගෙවීම් | **(190,191)** | (80,124) |
| කළමනාකරණ ගාස්තු | **11,318** | - |
| අනුබද්ධ/සමූහ හෝටල් | | |
| i. හිල්ටන් වර්ල්ඩ්වයිඩ් මැනේජ් ලිමිටඩ් - එක්සත් රාජධානිය | | |
| ජී.එස්.බී. ගෙවීම් | **(112,577)** | (65,042) |
| ජී.එස්.බී. ගාස්තු | **105,273** | 85,008 |
| ii. හිල්ටන් කොළම්බෝ - නේවාසික සේවා සැපයීම (ශුද්ධ) | **(1,972)** | (1,676) |
| iii. හිල්ටන් යාළ රිසෝර්ට්ස් - සේවා සැපයීම (ශුද්ධ) | **6,719** | (4,165) |
| iv. හිල්ටන් වීරවිල - සේවා සැපයීම (ශුද්ධ) | **(5,060)** | 1,750 |
| v. හිල්ටන් ක්වාලාලම්පූර් (සිංගප්පූරුව) - සේවා සැපයීම (ශුද්ධ) | **23,534** | (16,282) |
| vi. හිල්ටන් ෂාහ් ආලම් 1-සිටි (මැලේසියාව) - සේවා සැපයීම (ශුද්ධ) | **(42)** | 42 |
| vii. හිල්ටන් හොටෙල් මැනේජ්මන්ට් (ෂැංහයි) කම්පැනි ලිමිටඩ් - සේවා සැපයීම (ශුද්ධ) | **(3,666)** | 3,666 |

සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු වල නියමයන් සහ කොන්දේසි

සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සිදු කෙරේ. වසර අවසානයේදී ඇති ජංගම ගිණුම් ශේෂයන් අනාරක්ෂිත, පොලී රහිත වන අතර මුදල් ගෙවීමෙන් පියවීම් කෙරේ.

### 37.5 සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම

| සම්බන්ධිත පාර්ශ්වයේ නම | පොදු අධ්‍යක්ෂ | ගනුදෙනුවේ ස්වභාවය | කොන්ත්‍රාත් වටිනාකම (රු.) | ගෙවන ලද මුදල (රු.) | ගෙවීමට ඇති මුදල (රු.) |
|---|---|---|---|---|---|
| ඕවර්සීස් රියල්ටි (සිලෝන්) පීඑල්සී | ප්‍රවීර් සමරසිංහ මහතා | හිල්ටන් කොළඹ 253 වන අමුත්තන්ගේ කාමර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා අලංකාර ලාම්පු සැපයීම සහ සවි කිරීම | 46,071,660 | 29,817,491 | 16,254,168 |

## 38. වාර්තාකරණ දිනය වන විට පවතින නඩු කටයුතු

### 38.1 SC HCCA LA 225/16

මෙය HCCA LA 69/14 නඩුවේ 2016 මාර්තු 31 දිනැති අධිකරණ නියෝගයට එරෙහිව Cornel & Co Ltd විසින් ගොනු කරන ලද අභියාචනයකි. පාර්ශ්වයන් සමථයකට පත්වීමේ හැකියාව සොයමින් සිටින බැවින්, නඩුව නැවත 2025 මැයි 28 වන දින සඳහන් කිරීමට නියමිතය.

### 38.2 H.C. [සිවිල්] 1/98 [2] [ගොනු කළ දිනය 1998/03/31]

මෙම නඩුව Cornel & Co Ltd., විසින් Mitsui & Co Ltd, Taisei Corporation සහ HDL [5 වන වගඋත්තරකරු] ඇතුළු තවත් විත්තිකරුවන් 9 දෙනෙකුට එරෙහිව ගොනු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 දක්වා

පැමිණිලිකරු බස්නාහිර පළාතේ මහාධිකරණයේ නඩුවක් ගොනු කර, පැමිණිල්ලේ [m] සහ [n] ඉල්ලීම් වලට අනුව, සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම වැළැක්වීමට එක්ස්-පාර්තේ තහනම් නියෝග ලබාගෙන ඇත.

මෙම නඩුව 2003 ඔක්තෝබර් 29 සිට සමථයක් (ඇත්නම්) බලාපොරොත්තුවෙන් කල් දමා ඇත.

### 38.3 ඩී.සී. කොළඹ නඩු අංක 21819/MR

මෙම නඩුව නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් 1 වන විත්තිකරු වන ගාමිණී ලක්ෂ්මන් පීරිස් මහතාට එරෙහිව රුපියල් 35,938,000.00 ක් සහ රුපියල් 36,071,000.00 ක මුදලක් සඳහා තීන්දුවක් ලබා ගැනීමට ගොනු කර ඇත. HDL 2 වන විත්තිකරු වේ.

නඩුව 2004 මාර්තු 17 සිට සමථයක් (ඇත්නම්) බලාපොරොත්තුවෙන් කල් දමා ඇත.

### 38.4 නඩු අංක H.C. (සිවිල්) 754/2018/MR (ගොනු කළ දිනය: 2018/10/26)

මෙම නඩුව නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් සමාගම සහ සමාගම් ලේකම්වරුන් සමාගමේ කොටස් පැවරීම සඳහා කිසිදු පියවරක් ගැනීමෙන් වළක්වාලීම සඳහා අන්තර්කාලීන වාරණ නියෝගයක් ඉල්ලා ගොනු කර ඇත.

අන්තර්කාලීන වාරණ නියෝග 2021 දෙසැම්බර් සහ 2023 පෙබරවාරි මාසවලදී අවලංගු කරන ලදී. නඩුව පූර්ව නඩු විභාග අදියරේ පවතී.

පැමිණිලිකරු විසින් 2024.04.04 දින ගොනු කරන ලද සංශෝධිත පැමිණිල්ල 2025.01.17 දින අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී. දැන් 2025 මාර්තු 17 දින මුල් පැමිණිල්ල මත පදනම්ව කරුණු ඉදිරිපත් කරනු ලැබේ.

### 38.5 HC (සිවිල්) 116/96 (1)

නිහාල් ශ්‍රී අමරසේකර මහතා වාණිජ මහාධිකරණයේ 2024 සැප්තැම්බර් 24 දින පෙත්සමක් ගොනු කරමින්, අදාළ කාරණයට ඇතුළත් කළ සමථ නියෝගයකට අනුව වරෙන්තුවක් ක්‍රියාත්මක කිරීමට තමා උත්සාහ කරන බව ප්‍රකාශ කර ඇත.

විරෝධතා ගොනු කිරීම සඳහා කාරණය 2025 මාර්තු 5 දිනට නියම කර ඇත.

### 38.6 කොළඹ මහනගර සභා නඩුව

කොළඹ මහනගර සභාව විසින් මාලිගාවත්ත මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහළොවක් ගොනු කර ඇත. මේවා 2009 (13224/M), 2010 (14155/M), 2011 (15461/M), 2012 (17966/M), 2013 (28928/14), 2014 (16394/15), 2015 (15577/16), 2016 (15591/17), 2017 (16908/18, 16910/18), 2018 (16248/19), 2019 (4691/20), 2020 (7576/21), 2021 (11637/22), 2022 (25125/23), 2023 (37682/24) වසරවලදී අවශ්‍ය බලපත්‍රයක් නොමැතිව අවන්හලක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙනි.

2009 සිට 2018 දක්වා ගොනු කරන ලද නඩු මහේස්ත්‍රාත් අධිකරණයේදී අවසන් වී ඇති අතර, ගරු මහේස්ත්‍රාත්වරයා හිල්ටන් කොළඹට එරෙහිව තීන්දුව ලබා දී ඇත. අදාළ නඩුවල තීන්දු වලට එරෙහිව අභියාචනා ගොනු කර ඇති අතර, ඒවා මහාධිකරණය හමුවේ ලැයිස්තුගත කිරීමට නියමිතව ඇත.

2009 සහ 2010 වර්ෂ සඳහා හෝටල් පරිශ්‍ර තුළ ක්‍රියාත්මක අවල්හල් සම්බන්ධයෙන් වාර්ෂික වෙළඳ බලපත්‍රය නිකුත් කිරීමේ පූර්ව කොන්දේසියක් ලෙස බලපත්‍ර ගාස්තු මුළු වාර්ෂික පිරිවැටුමෙන් සියයට 0.1 කට ප්‍රමාණයක් බදු ලෙස අය කිරීමට කොළඹ නගර සභාව විසින් ගත් තීරණයට අන්යොන්‍ය වශයෙන් සීමිත අභියෝගයක් ලෙස හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් විසින් රිට් අයදුම්පතක් (179/2011) ගොනු කර තිබුණි. 2019 සැප්තැම්බර් 19 දින තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද අතර අභියාචනාධිකරණයේ අධිපතියන් විසින් අයදුම්පත ප්‍රතික්ශේප කර ගෙවන ලෙස නියෝග කරන ලදී. එම දිනට පිරිවැය තීරණය කර නොතිබුණි. නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කර තිබුණු අතර එය තවමත් සලකා බැලීමට කටයුතු කරයි. 2020 (08/2020), 2020 (18/2020), 2020 (93/2020), 2020 (32/2020), 2019 (134/2019), 2019 (124/2019), 2020 (96/2020), 2020 (01/2020) සහ 2020 (204,2020) වර්ෂයන් තුළදී නඩු ගොනු කර ඇත.

### 38.7 D.C. Colombo නඩු අංක DMR 1012/2014

ගංගාරම් මුල්චන්ද්‍ර ධන්සින්ගාලි එදිරිව හොටෙල් ඩිවලොපර්ස් සහ හිල්ටන් වර්ල්ඩ්වයිඩ්. මෙම නඩුව මුල්චන්ද්‍ර මහතා විසින් උත්සවයකදී සිදුවූ අනතුරක් හේතුවෙන් රුපියල් මිලියන 5 ක හානි පූරණයක් ලබා ගැනීම සඳහා ගොනු කරන ලදී. පැමිණිලිකරු විසින් හොටෙල් ඩිවලොපර්ස් වෙත දැන්වීමක් සමඟ හිල්ටන් වර්ල්ඩ්වයිඩ් වෙත සිතාසි නිකුත් කර නඩුව ලැයිස්තුගත කළ යුතුය. මේ වන තෙක් HDL වෙත දැන්වීමක් ලැබී නොමැත.

# දස අවුරුදු මූල්‍ය සාරාංශය සහ ප්‍රධාන දර්ශක

| (රු. '000) | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | | | | | | | | | | |
| කාමර | **1,848,222** | 1,137,293 | 666,637 | 236,944 | 313,080 | 1,171,875 | 1,219,736 | 1,317,248 | 1,151,953 | 734,422 |
| ආහාර සහ පාන | **3,342,408** | 3,034,962 | 2,185,005 | 907,480 | 732,119 | 1,614,671 | 1,631,492 | 1,593,286 | 1,330,543 | 797,303 |
| අනෙකුත් මෙහෙයුම් දෙපාර්තමේන්තු | **56,153** | 55,845 | 35,625 | 33,957 | 35,936 | 92,206 | 59,312 | 104,828 | 58,184 | 39,978 |
| සමාජ ආරක්ෂණ බද්ද | **146,306** | 118,651 | | | | | | | | |
| | **5,393,089** | 4,346,751 | 2,887,267 | 1,178,381 | 1,081,135 | 2,878,753 | 2,910,540 | 3,015,362 | 2,540,680 | 1,571,703 |
| විකුණුම් පිරිවැය | **(2,708,885)** | (2,445,618) | (1,825,497) | (922,695) | (811,092) | (1,403,693) | (1,427,161) | (1,214,204) | (440,698) | (280,647) |
| දළ ලාභය | **2,684,204** | 1,901,133 | 1,061,770 | 255,686 | 270,043 | 1,475,060 | 1,483,379 | 1,801,158 | 2,099,982 | 1,291,056 |
| | | | | | | | | | | |
| අනෙකුත් ලාභ සහ අලාභ | **28,621** | 13,175 | 206,589 | 31,191 | 25,391 | 20,807 | 54,355 | 29,429 | 39,914 | 40,750 |
| පරිපාලන වියදම් | **(1,228,995)** | (1,052,424) | (855,958) | (585,498) | (591,036) | (910,514) | (854,539) | (828,206) | (1,331,329) | (831,538) |
| අනෙකුත් වියදම් | **(611,748)** | (698,548) | (302,759) | (167,921) | (171,603) | (281,942) | (283,429) | (383,491) | (294,905) | (200,213) |
| **ක්ෂය වීමට පෙර මෙහෙයුම් ලාභය** | **872,082** | 163,336 | 109,642 | (466,543) | (467,205) | 303,411 | 399,766 | 618,890 | 513,662 | 300,055 |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය | **(560,672)** | (367,193) | (371,065) | (386,618) | (378,443) | (515,265) | (500,861) | (461,542) | (368,254) | (249,682) |
| **ක්ෂය වීමෙන් පසු මෙහෙයුම් ලාභය** | **311,410** | (203,857) | (261,424) | (853,161) | (845,648) | (211,854) | (101,095) | 157,348 | 145,408 | 50,373 |
| | | | | | | | | | | |
| ප්‍රත්‍යාගණන අලාභ | - | - | - | | | (61,223) | - | - | - | |
| මූල්‍ය ආදායම | **10,740** | 18,037 | 18,162 | 11,222 | 10,873 | 10,708 | 15,627 | 25,533 | 27,575 | 41,957 |
| මූල්‍ය පිරිවැය | **(590,497)** | (598,546) | (389,502) | (134,477) | (42,569) | (50,078) | (40,994) | (9,905) | (38) | (617) |
| බදු පෙර ලාභය/(අලාභය) | **(268,347)** | (784,366) | (632,763) | (976,415) | (877,342) | (312,447) | (126,461) | 172,976 | 172,945 | 91,713 |
| ආදායම් බදු වියදම | **(71,490)** | 95,654 | (252,358) | 19,190 | (40,764) | (13,182) | (1,046) | 85,041 | (31,933) | (65,104) |
| කාල සීමාව සඳහා බදු පසු ලාභය/(අලාභය) | **(339,837)** | (688,712) | (885,122) | (957,225) | (918,106) | (325,629) | (127,507) | 258,017 | 141,012 | 26,609 |
| | | | | | | | | | | |
| **අනෙකුත් විස්තීරණ ආදායම** | | | | | | | | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 704,527 | - | | - | 1,452,978 | - | - | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම් මත නිර්වාචික ප්‍රතිලාභ | **(11,801)** | (31,688) | 2,970 | 22,630 | (8,088) | (22,455) | 14,996 | 2,415 | (5,065) | (9,689) |
| කාල සීමාව සඳහා මුළු විස්තීරණ ආදායම/(වියදම) | **(351,638)** | (15,873) | (882,152) | (934,595) | (926,193) | 1,104,894 | (112,512) | 260,432 | 135,946 | 16,919 |
| කොටසක ඉපැයීම් - මූලික (රු.) | **(0.17)** | (0.01) | (0.43) | (0.46) | (0.45) | 0.54 | (0.05) | 0.13 | 0.07 | 0.01 |

# දස අවුරුදු මූල්‍ය සාරාංශය සහ ප්‍රධාන දර්ශක

| රු.'000 | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | | | | | |
| මුළු ආදායම | **5,393,089** | 4,346,751 | 2,887,267 | 1,178,381 | 1,081,135 | 2,878,752 | 2,910,540 | 3,015,362 | 2,540,680 | 1,571,703 |
| විකුණුම් වර්ධන ප්‍රතිශතය | **24%** | 51% | 145% | 9% | -62% | -1% | -3% | 19% | 62% | -34% |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය වීමට පෙර මෙහෙයුම් ලාභය | **872,082** | 163,336 | 109,642 | (466,543) | (467,205) | 303,411 | 399,766 | 618,890 | 513,662 | 300,055 |
| ශුද්ධ මූල්‍ය වියදම් | **579,756** | 580,509 | 371,340 | 123,254 | 31,696 | 39,370 | 25,367 | (15,628) | (27,537) | (41,340) |
| ක්ෂය වීම් ස ක්‍රමක්ෂය | **560,672** | 367,193 | 371,065 | 386,618 | 378,443 | 515,265 | 500,861 | 461,542 | 368,254 | 249,682 |
| බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | **(268,347)** | (784,366) | (632,763) | (976,415) | (877,342) | (312,447) | (126,461) | 172,976 | 172,945 | 91,713 |
| ප්‍රත්‍යාගණන ලාභය සහ බදු පසු මුළු විස්තීරණ ආදායම/(වියදම) | **(351,638)** | (15,873) | (882,152) | (934,596) | (926,193) | 1,104,893 | (112,512) | 260,432 | 135,946 | 16,919 |
| **කොටස් හිමියන්ගේ අරමුදල** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **20,466,456** | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 | 20,466,456 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | **2,157,505** | 2,157,505 | 1,452,978 | 1,452,978 | 1,452,978 | 1,452,978 | - | - | - | - |
| ගෘහ භාණ්ඩ සහ උපාංග සංචිතය | **303** | - | 178,230 | 53,801 | 1,649 | 43,864 | 187,217 | 161,348 | 21,896 | 117,421 |
| සමුච්චිත අලාභය | **(10,709,007)** | (10,357,069) | (9,814,896) | (8,808,317) | (7,821,569) | (6,937,588) | (6,732,856) | (6,594,476) | (6,715,455) | (6,946,927) |
| | **11,915,257** | 12,266,894 | 12,282,768 | 13,164,918 | 14,099,514 | 15,025,710 | 13,920,817 | 14,033,328 | 13,772,897 | 13,636,952 |
| **යොදවා ඇති වත්කම්** | | | | | | | | | | |
| දේපළ, පිරියත, උපකරණ | **14,323,547** | 11,553,379 | 6,929,402 | 8,722,182 | 8,486,249 | 8,728,240 | 7,485,222 | 7,818,434 | 7,449,712 | 5,038,545 |
| බදු ගිවිසුම්ගත ඉඩම් | **6,141,189** | 6,215,377 | 6,261,798 | 6,337,966 | 6,421,326 | 6,514,390 | 6,541,834 | 6,613,547 | 6,681,237 | 6,751,945 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | **89,016** | 1,705,375 | 2,600,378 | 766,764 | 865,477 | 659,487 | 591,537 | 243,414 | 215,747 | 1,266,090 |
| ශුද්ධ ජංගම වත්කම් | **(3,589,889)** | (2,516,558) | (797,453) | (1,064,694) | (997,068) | (43,767) | (193,901) | (122,915) | 50,742 | 1,163,620 |
| | **16,963,862** | 16,957,573 | 14,994,125 | 14,767,675 | 14,775,984 | 15,858,350 | 14,424,692 | 14,552,480 | 14,397,438 | 14,220,200 |
| **අඩු කළා** | | | | | | | | | | |
| **දිගුකාලීන වගකීම්** | | | | | | | | | | |
| පොලී දරන ණය ගැනීම් | **3,354,136** | 3,067,766 | 2,000,000 | 1,098,372 | 72,156 | 250,000 | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **123,261** | 117,655 | 77,467 | 97,982 | 148,198 | 134,550 | 106,259 | 122,581 | 125,326 | 104,524 |
| භාවිතා කිරීමේ අයිතිය - බදු ගිවිසුම්ගත ඉඩම් වගකීම | **19,105** | 24,645 | - | 5,458 | 22,918 | 37,291 | - | - | - | - |
| විලම්භිත බදු වගකීම | **1,552,104** | 1,480,613 | 633,891 | 396,138 | 433,198 | 410,798 | 397,616 | 396,570 | 499,215 | 478,724 |
| ශුද්ධ වත්කම් | **11,915,257** | 12,266,894 | 12,282,768 | 13,164,918 | 14,099,514 | 15,025,710 | 13,920,817 | 14,033,328 | 13,772,897 | 13,636,952 |
| **ප්‍රධාන දර්ශක** | | | | | | | | | | |
| ජංගම අනුපාතය | **0.20** | 0.30 | 0.64 | 0.47 | 0.34 | 0.94 | 0.79 | 0.86 | 1.18 | 3.02 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | **5.82** | 5.99 | 6.00 | 6.43 | 6.89 | 7.34 | 6.80 | 6.86 | 6.73 | 6.66 |
| කොටසක ඉපැයීම්/(අලාභය) | **(0.17)** | (0.01) | (0.43) | (0.46) | (0.45) | 0.54 | (0.05) | 0.13 | 0.07 | 0.01 |
| **සංඛ්‍යාන සාරාංශය** | | | | | | | | | | |
| කාමර පිරවීමේ ප්‍රතිශතය | **51%** | 33% | 19% | 10% | 11% | 49% | 48% | 57% | 47% | 38% |
| සාමාන්‍ය කාමර ගාස්තුව | **31,691** | 31,496 | 29,776 | 16,754 | 20,681 | 21,562 | 22,944 | 21,077 | 20,408 | 20,326 |

# වාර්ෂික මහා සභා රැස්වීමේ දැන්වීම

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජූනි මස 27 වන දින සිකුරාදා ප.ව. 4.00 ට, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 2, එච්ලෝන් චතුරශ්‍රය, හිල්ටන් කොළඹ හෝටලයේ, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වෙන බව මෙයින් දන්වා සිටිමි.

### න්‍යාය පත්‍රය (AGENDA)

**1. සාමාන්‍ය කටයුතු (ORDINARY BUSINESS)**

**1.1** රැස්වීම් දැන්වීම පිළිගැනීම සඳහා පහත යෝජනාව සම්මත කිරීම:
"සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම කැඳවන 2025 ජූනි මස 20 දිනැති දැන්වීම, සමාගම් ව්‍යවස්ථාවේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ දක්වා ඇති කාලයට වඩා කෙටි දැන්වීමකින් රැස්වීම කැඳවා තිබුණද, මෙයින් වලංගු දැන්වීමක් ලෙස පිළිගනු ලැබේ."

**1.2** 2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ සමාගමේ ගිණුම් ප්‍රකාශනය, විගණකවරුන්ගේ වාර්තාව සමගින්, භාර ගැනීම සහ සලකා බැලීම.

**1.3** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධනවලට අනුව විගණකාධිපතිවරයා සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරන බව සටහන් කර ගැනීම.

**2. විශේෂ කටයුතු (SPECIAL BUSINESS)**

**2.1** සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සංශෝධන:
ව්‍යවස්ථාවේ 78 වන වගන්තියේ (එය නිවැරදිව 78 වන වගන්තිය ලෙස කියවිය යුතුය) 80 වන වගන්තියට හරස් යොමුවක් (cross reference) ඇති සහ ව්‍යවස්ථාවේ 85 (i) වගන්තියේ (එය නිවැරදිව 87 (ii) ලෙස කියවිය යුතුය) 88 (ii) වගන්තියට හරස් යොමුවක් ඇති මුද්‍රණ දෝෂ කිහිපයක් නිවැරදි කිරීම සඳහා පහත යෝජනාව විශේෂ යෝජනාවක් ලෙස සම්මත කිරීම:

"මෙයින් යෝජනා කරනු ලබන්නේ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය පහත පරිදි සංශෝධනය කළ යුතු බවයි;

(i) ව්‍යවස්ථාවේ 78 (ii) වගන්තියේ 2 වන පේළියේ සහ ව්‍යවස්ථාවේ 78 (iii) වගන්තියේ 2 වන පේළියේ ඇති "80" යන අංක මකා දමා, ඒ වෙනුවට "78" යන අංක ආදේශ කිරීමෙන්; සහ
(ii) ව්‍යවස්ථාවේ 85 (i) වගන්තියේ 7 වන පේළියේ ඇති "88 (ii)" යන අංක මකා දමා, ඒ වෙනුවට "87 (ii)" යන අංක ආදේශ කිරීමෙන්;"

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
**පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්**
*ලේකම්වරු*

කොළඹ
2025 ජූනි 20

**සටහන**

- සමාගමේ කොටස් හිමියෙකුට තමා වෙනුවෙන් සහභාගී වීමට සහ ඡන්දය දීමට නියෝජිතයෙකු (Proxy) පත් කිරීමට අයිතිය ඇත.
- නියෝජිතයෙකු කොටස් හිමියෙකු වීම අනිවාර්ය නොවේ.
- ඇමුණුම් කර ඇති නියෝජිත පත්‍රය, රැස්වීමට නියමිත වේලාවට පැය 36කට නොඅඩු කාලයකට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

# සටහන්

# පවරා දීමේ පත්‍රිකාව

මම/අපි .......................................................................................................................................................................................................

.......................................................................................................................................................................................................................

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි එකම කොටස් හිමියා/හිමියන් වන බැවින්, මෙයින් පහත අය පත් කරමි:

........................................................................................................................................................ නැතහොත් ඔහු/ඇය නොමැති විට:

| | |
|---|---|
| ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| ධීෂානා එස්. අමරසේකර මහත්මිය, | කොළඹ, නැතහොත් ඇය නොමැති විට |
| චමිල් උඩවත්ත මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| දුලින්ද පෙරේරා මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| ඒ. ජී. එස් සේනාධීර මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| උස්මාන් අන්නාස් මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| මනෝජ් අල්ගම මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| රුවන් ප්‍රනාන්දු මහතා, | කොළඹ, නැතහොත් ඔහු නොමැති විට |
| රොෂිකා ජයවර්ධන මහත්මිය, | කොළඹ, නැතහොත් ඇය නොමැති විට |

මගේ/අපගේ නියෝජිතයා ලෙස, 2025 ජූනි මස විසි හත්වන දින ප.ව. 4.00ට පැවැත්වෙන සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට සහ එහි ඕනෑම කල් තැබීමකදී සහ එහි ප්‍රතිඵලයක් ලෙස පැවැත්විය හැකි සෑම ඡන්ද විමසීමකදීම මා/අප වෙනුවෙන් පෙනී සිටීමට, කථා කිරීමට සහ ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

| | | |
|---|---|---|
| **1. සාමාන්‍ය කටයුතු** (ORDINARY BUSINESS) | | |
| 1.1 රැස්වීම් දැන්වීම සම්මත කිරීම | ☐ | ☐ |
| 1.2 2024 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ සමාගමේ ගිණුම් ප්‍රකාශනය, විගණකවරුන්ගේ වාර්තාව සමගින්, භාර ගැනීම සහ සලකා බැලීම | ☐ | ☐ |
| 1.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධනවලට අනුව විගණකාධිපතිවරයා සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරන බව සටහන් කර ගැනීම | ☐ | ☐ |
| **2. විශේෂ කටයුතු** (SPECIAL BUSINESS) | | |
| (1) රැස්වීම් දැන්වීමේ 2.1 අයිතමයේ දක්වා ඇති පරිදි විශේෂ යෝජනාව සම්මත කිරීම | ☐ | ☐ |

මෙය 2025 ........................................... දින ........................................... දිනැතිව අත්සන් කරන ලදී.

...............................................

කොටස් හිමියාගේ අත්සන (Signature of the Shareholder)

**සටහන:**

1. සම්පූර්ණ කිරීම පිළිබඳ උපදෙස් පිටුපසින් දක්වා ඇත
2. නියෝජිතයෙකු සමාගමේ කොටස් හිමියෙකු වීම අනිවාර්ය නොවේ
3. ඡන්දය ප්‍රකාශ කිරීමේ ඔබේ උපදෙස් දැක්වීමට කරුණාකර සුදුසු කොටුවල "x" සලකුණු කරන්න.

**පවරා දීමේ පත්‍රිකාව සම්පූර්ණ කිරීම පිළිබඳ උපදෙස්**

1. කරුණාකර ඔබේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව පුරවා, ලබා දී ඇති ස්ථානයේ අත්සන් කර, අත්සන් කළ දිනය පුරවා පවරා දීමේ පත්‍රිකාව සම්පූර්ණ කරන්න.
2. නියෝජිත පත්‍රිකාව නීතිඥයෙකු විසින් අත්සන් කර ඇත්නම්, එම බලයලත් පත්‍රිකාව (Power of Attorney) සමාගම සමඟ දැනටමත් ලියාපදිංචි කර නොමැති නම්, ලියාපදිංචි කිරීම සඳහා අදාළ බලයලත් පත්‍රිකාව ද නියෝජිත පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය.
3. සමාගමක්/සංස්ථාවක් සම්බන්ධයෙන්, නියෝජිත පත්‍රිකාව නීත්‍යානුකූලව නියම කර ඇති ආකාරයට පුරවා සහතික කළ යුතුය.
4. සම්පූර්ණ කරන ලද පවරා දීමේ පත්‍රිකාව, රැස්වීමට නියමිත වේලාවට පැය 36කට නොඅඩු කාලයකට පෙර, සමාගමේ ලියාපදිංචි කාර්යාලය වන, අංක 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2, වෙත තැන්පත් කළ යුතුය.
5. රැස්වීමට සහභාගී වීම සඳහා නියෝජිතයෙකු (සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හැර) පත් කරන කොටස් හිමියෙකු, නියෝජිත පත්‍රිකාවේ නියෝජිතයාගේ ජාතික හැඳුනුම්පත් (NIC) අංකය සඳහන් කළ යුතු අතර, නියෝජිතයාට ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස ඉල්ලා සිටිය යුතුය.

# ආයතනික තොරතුරු

**සමාගමේ නම:**

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

**නෛතික ස්වරූපය:**

සීමිත වගකීම් සහිත පොදු සමාගමකි

**සංස්ථාපනය කළ දිනය:**

1983 මාර්තු 15

**සමාගම් ලියාපදිංචි අංකය:**

PQ 143 PB

**අධ්‍යක්ෂවරු:**

- ප්‍රවීර් ඩී. සමරසිංහ මහතා
- ධීෂානා එස්. අමරසේකර මහත්මිය
- චමිල් උඩවත්ත මහතා
- දුලින්ද පෙරේරා මහතා
- ඒ. ජී. එස් සේනාධීර මහතා
- බී. ඒ. තුෂාර රොද්‍රිගෝ මහතා
- මනෝජ් අල්ගම මහතා
- උස්මාන් අන්නාස් මහතා
- රුවන් ප්‍රනාන්දු මහතා
- රොෂිකා ජයවර්ධන මහත්මිය

**ලියාපදිංචි කාර්යාලය:**

**හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්**
අංක 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ 2
දුරකථන : +94 112433435
ෆැක්ස් : +94 112446545
විද්‍යුත් තැපැල : hdl_hilton@sltnet.lk
වෙබ් අඩවිය : www.hoteldevelopers.lk

**ලේකම්වරු සහ රෙජිස්ට්‍රාර්වරු:**

**පී ඩබ්ලිව් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
අංක 3/17, කින්සි පාර, කොළඹ 08

**බැංකුකරුවන්:**

- මහජන බැංකුව - ආයතනික ශාඛාව
- ලංකා බැංකුව - ආයතනික ශාඛාව
- සම්පත් බැංකු පීඑල්සී - ඩබ්ලිව්.ටී.සී. ශාඛාව

**නීතිඥවරු:**

**ඩී එල් සහ එෆ් ද සේරම්**
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්
47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස
කොළඹ 07

Concept & Designed by
Copyline a great equation

Hilton
COLOMBO

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්